# ප්‍රජාශක්ති

## 2023 දෙවන කලාපය

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

24/4

කාසල් වීදිය

කොළඹ 08

# ප්‍රජාශක්ති

## 2023 දෙවන කලාපය


**ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය**

**24/4**

**කාසල් වීදිය**

**කොළඹ 08**

**දුරකථන: 0112695579**

**ෆැක්ස්: 0112696592**

**වෙබ්: www.rdtri.gov.lk**

# ප්‍රජාශක්ති 2023 - දෙවන කලාපය

## උපදේශකත්වය

තිළිණි සුරංගිකා කරස්නාගොඩ
අධ්‍යක්ෂ
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

ඩබ්ලිව්. ජී.පී.වේරවැල්ල
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

එම්.එස්.එස්. නස්ලි
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

## සංස්කරණය

පී.ඒ. චිත්‍රා ජයසිංහ
පුහුණු හා පර්යේෂණ නිලධාරි
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

සී.කේ.ඩබ්ලිව්. අල්විස්
පුහුණු හා පර්යේෂණ නිලධාරි
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

## විද්‍යුත් මාධ්‍යගත කිරීම

දිලිනි රණසිංහ
සංවර්ධන නිලධාරි
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

## පිටකවරය

එන්.එම්.එම්. පියුමි කෝසලා වීරසූරිය

## ප්‍රකාශනය

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය
24/4, කාසල් වීදිය
කොළඹ 08

දූරකථන- 011 2695579 / 011 2669725
ෆැක්ස් -011 2696592

# අධ්‍යක්ෂගේ පණිවිඩය.

1970 දශකයේ ආරම්භ වූ ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය දිළිඳුකම පිටුදැකීම සහ ග්‍රාමසංවර්ධනය උදෙසා කැපවී කටයුතු කරන ජාතික ආයතනයකි. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවර්ධන ක්‍රියාකාරීන්ගේ දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය කිරීම හා ඔවුන්ව චර්යාත්මක වෙනසකට භාජනය කිරීම තුළින් දිළිඳු ප්‍රජාව සංවර්ධන ක්‍රියාවලියට බද්ධකර ගැනීමේ සුවිශේෂී හැකියාවක් ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය සතුව පවතී. ඒ සඳහා සුවිශේෂී ක්‍රමවේදය වන සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය පුහුණු වැඩසටහන් හා පර්යේෂණ සඳහා යොදා ගනිමින් දිළිඳු ප්‍රජාව සමාජ හා ආර්ථික වශයෙන් බල ගැන්වීම සිදුකරනු ලබයි.

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ පුහුණු, පර්යේෂණ හා ප්‍රකාශන යන අංශ තුන ඔස්සේ දිළිඳුකම තුරන් කිරීම සඳහා කටයුතු කරනු ලබයි. පර්යේෂකයින් ග්‍රාමීය මට්ටම දක්වාම සම්බන්ධ වී දත්ත රැස් කරමින් පර්යේෂණ සිදුකරනු ලබන අතර ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන්වල පවත්නා අඩුපාඩු මොනවාද, එම අඩුපාඩු අවමකර සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළ හැක්කේ කෙසේද, ඒ සඳහා කුමන ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුද යනාදි කරුණු පර්යේෂණ තුළින් හඳුනාගෙන ප්‍රතිපත්ති සම්පාදකයින් වෙත හඳුන්වාදීම පර්යේෂණ අංශය මගින් සිදුකරයි. පර්යේෂකයින් විසින් ග්‍රාමසංවර්ධනය සම්බන්ධව සිදු කරනු ලබන එම අධ්‍යයනයන් තුළින් සොයා ගන්නා කරුණු මෙන්ම පර්යේෂණ අත්දැකීම්ද, සාහිත්‍ය ගවේශන තුළින් සොයා ගන්නා දැනුමද යොදා ගනිමින් සකස් කළ ලිපි ඇතුලත් ප්‍රකාශන මගින් ප්‍රකාශන අංශය ග්‍රාමසංවර්ධනය සඳහා අවශ්‍ය දැනුම පාඨකයා වෙත බෙදා හරියි. අතීතයේ සිටම ගැමිසෙත, තරණය, සත්‍යා වැනි පුවත් හසුන් මෙන්ම ශාස්ත්‍රීය සඟරා, ග්‍රන්ථ මෙන්ම ප්‍රජාශක්ති සඟරා වැනි සාහිත්‍ය මාධ්‍ය තුළින් ආයතනයේ ප්‍රකාශන අංශය විසින් දැනුම සම්ප්‍රේෂණය කර ඇත.

2023 වර්ෂයේද ප්‍රජා ශක්ති සඟරාවේ දෙවන කලාපය මෙලෙස එළිදැක්වීමට කටයුතු යොදා ඇති අතර එය විශාල පිරිසකගේ දැනුම වර්ධනයට E Magazin ප්‍රකාශනයක් ලෙස විද්‍යුත් මාධ්‍යයට යොමු කිරීමට කටයුතු යොදා ඇත. එමගින් සංවර්ධන ක්‍රියාකාරීන්ට අවශ්‍ය දැනුම පරිශීලනය කිරීමට හැකිවන අතර ඒ සඳහා ලිපි සම්පාදනය තුළින් දායක වූ ලේඛක ලේඛිකාවන්ට හා ප්‍රකාශනය සංස්කරණය කළ නිලධාරීන්ට අධ්‍යක්ෂ වශයෙන් මාගේ ස්තුතිය පුද කරමි.

**තිළිණි සුරංගිකා කරස්නාගොඩ**

අධ්‍යක්ෂ

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

## සංස්කාරක සටහන

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය රටේ සංවර්ධනයට හා දිළිඳුකම පිටුදැකීම උදෙසා විශාල මෙහෙයක් ඉටු කරනු ලබන ආයතනයකි. එම සංවර්ධන කාර්යයට ආයතනයේ පුහුණු, පර්යේෂණ හා ප්‍රකාශන යන අංශ තුනම විශාල දායකත්වයක් දරනු ලබයි. මෙහිදී පුහුණු හා පර්යේෂණ සිදු කිරීමට අවශ්‍ය දැනුම බෙදාහරින ප්‍රධාන අංශයක් ලෙස ප්‍රකාශන අංශය කටයුතු කරන අතර පුහුණු හා පර්යේෂණ අංශ මගින් සිදු කරනු ලබන වැඩසටහන් හා පර්යේෂණ තුලින් සොයා ගන්නා නව දැනුම ප්‍රජාව වෙත සම්ප්‍රේෂණය කිරීම උදෙසා ප්‍රකාශන අංශය විශාල දායකත්වයක් ලබා දෙනු ලබයි.

ප්‍රකාශන අංශය විසින් සිදුකරනු ලබන අර්ධ වාර්ෂික ප්‍රජාශක්ති සඟරාව ද එවැනි සංවර්ධනයට දායකත්වය ලබාදෙන සඟරාවකි. මෙහිදී දිළිඳුකම පිටුදකිමින් සංවර්ධන ගමන් මාවතට යොමුගත වීමට අවශ්‍ය දැනුම සහිත සංවර්ධනයට අදාල විවිධ මාතෘකා ඔස්සේ සැකසූ ලිපි මාලාවක් මෙම සඟරාව තුළින් පාඨකයාට පිරිනැමේ. ආයතනයේ පර්යේෂකවරුන්ගේ දැනුම හා අත්දැකීම් භාවිතයට ගනිමින් එම නිලධාරීන් සැකසූ ලිපි මාලාවක් මගින් නිවැරදි සංවර්ධන ගමන් මාවතක් කරා යාමට අවශ්‍ය සහාය මෙම සඟරාව තුළින් දායක කරගත හැකිය.

E Magazin එකක් වශයෙන් දෙස් විදෙස් විශාල පාඨක පිරිසකට පරිශීලනය කළ හැකි ලෙස සැකසූ මෙම සඟරාව සඳහා උපදේශකත්වය ලබා දුන් ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂතුමියට හා ලිපි සකස් කර දෙමින් දායකත්වය සැපයූ කර්තෘ මණ්ඩලයට අපගේ කෘතඥතාවය පිරිනමමි.

**සංස්කාරකවරු.**

## පටුන


පිටු අංක

01. දිනෙන් දින උග්‍රවන ආහාර අර්බුදය. 1-5
එස්.බී.එන්.මල්ෂානි ආනන්ද

02. මන්දපෝෂණය හා ආහාර අනාරක්ෂිතතාව: වහා පිළියම් යෙදිය යුතු ගැටළු. 5-10
ඩබ්ලිව්.එච්. සිරිසේන

03. පුද්ගල ඵලදායිතාවය වර්ධනය සඳහා මූල්‍ය කළමණාකරණය. 11-14
එච්.එම්.ජී.කේ. නවරත්න

04. රටවල් බංකොලොත් කරන දූෂණය හඳුනා ගනිමු - එරෙහි වෙමු. 15-20
කපිල ධර්මප්‍රිය

05. ග්‍රාමසංවර්ධනය යනු භෞතික දියුණුව පමණක්ද? 21-23
පී.බී.ඩී.වැත්තැව

06. සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන සැලසුම්. 24-26
කේ.එම්.ජී. සමරසේන

07. පර්යේෂණ වාර්තාවක් සකස් කරන ආකාරය. 27-34
පී.ඒ.චිත්‍රා ජයසිංහ

08. ව්‍යපත් ජනගහනය කළමනාකරණය කිරීම. 35-38
ඩබ්ලිව්. අනුෂා ප්‍රියංජනි

09. තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීමට පවතින අභියෝගතා. 39-43
ප්‍රදීප් ලංකාපෙල

10. කෘෂි කර්මාන්තයේදී බලපාන ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වෙනස්කම්. 44-47
ඩබ්ලිව්. ආර්.එන්.පී. විජේවර්ධන

11. සංවර්ධන සැළසුම්කරණය යනු කුමක්ද? 48-51
ඩබ්ලිව්. ඩී. නිහාල් වීරසූරිය

12. ක්ෂුද්‍රමූල්‍ය යනු කුමක්ද?
දිළිඳුකම පිටු දැකීමේ උපාය මාර්ගයක් ලෙස එය ක්‍රියා කරන්නේ කෙසේද? 52-54
ඊ.එම්. ඩබ්.ඩබ්.එන්.එස්.බී. ඒකනායක

13. ධන සම්පත් පිළිබඳ බෞද්ධ ආකල්පය. 55-57
එස්.එම්.යූ.බී.සමරකෝන්

14. ගැටුම් නිරාකරණය. 58-61
එච්. බී.අයි.ඒ චන්ද්‍රසිරි

15. දිළිඳු කාන්තා සවිබල ගැන්වීම සඳහා සමෘද්ධි ව්‍යාපාරයේ දායකත්වය. 62-67
එච්.එම්. ප්‍රියානි දයාරත්න

# 01.දිනෙන් දින උග්‍රවන ආහාර අර්බුදය.

එස්.බී.එන්.මල්ෂානි ආනන්ද
සංවර්ධන නිලධාරි
M.A (Sociology)

ආහාරයෙන් ජන විඥානය ද, සංස්කෘතිය ද සකස්වන බව පිළිගත් විද්වත් මතයයි. රටක ජනතාව දෛනිකව ආහාරයට ගන්නා දෙයින් ඒ ජනතාවගේ සංස්කෘතිය ද ජීවන රටාව ලොවට ප්‍රකාශ වෙයි. දුප්පත්, පොහොසත්, බාල, තරුණ, මහලු, උගත්, නූගත් හෝ ග්‍රාමීය, නාගරික යනාදී කිසිදු භේදයකින් තොරව මෙලොව එළිය දකින සියලු ජීවීන් සමූහයාටම පොදු වූ “කුසගින්න” නිවාලීමට සමත් බලවත් එකම දෙය “ආහාර” වෙයි.



ඉන්දියන් සාගරයේ මුතු ඇටය, පෙරදිග ධාන්‍යාගාරය ලෙස හැඳින්වූ ශ්‍රී ලංකාව අතීතයේ සහලින් පෝෂිත රටක් විය. ස්වයංපෝෂිත ආර්ථික රටාවක් ක්‍රියාත්මක වූ අතර, කෘෂි කර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය විය. නමුත් යටත් විජිතයක් සමඟ ස්වයං පෝෂිත ආර්ථික රටාව ගිලිහී ගිය අතර, විවෘත ආර්ථිකය මෙරටට විවෘත විය. අතීතයේ කෘෂිකර්මාන්තයෙන් නිෂ්පාදිත භාණ්ඩ ආනයනය කිරීමට පටන් ගැනීමත් සමඟ අපගේ නිෂ්පාදන හැකියාව දුර්වල වන්නට විය. යැපුම් මානසිකත්වය වර්ධනය වන්නට විය. සියලු දේ පහසුවෙන් ගෙන්වා ගැනීමට හුරු විය. මෙයින් විදේශ විනිමය, විදේශ සංචිත හීන වන්නට විය. මෙරට ආර්ථිකය පමණක් නොව මිනිසාගේ හැකියාවන්, දක්ෂතාවයන් හීන වන්නට විය. උදාහරණ ලෙස, ශ්‍රී ලංකාවේ භූමි පරිමාණය වර්ග කිලෝමීටර් 65,610 ක් විය. මේ රටට අයත් සමුද්‍ර කලාපය වර්ග කිලෝමීටර් 517,000 වේ. දශක තුනක් තිස්සේ පැවති යුද්ධය අවසන් වීමත් සමඟ මේ මුළු සමුද්‍ර තීරයම ධීවර කර්මාන්තය සඳහා විවෘත වන්නට විය. මෙහි ඛේදවාචකය වන්නේ රට වටේ මත්ස්‍ය සම්පත සිටියද, ටින් මාළු සඳහා වසරකට බිලියන විස්සකට (20) අධික ප්‍රමාණයක් මුදලක් වැය කිරීමය (ලංකාදීප පුවත්පත, 2018).

වර්ෂ 1948 දී යටත් විජිත පාලනයෙන් ශ්‍රී ලංකාව සම්පූර්ණයෙන්ම නිදහස ලබා ස්වාධීන රාජ්‍යයක් බවට පත්වීමෙන් පසුව මෙතෙක් මුහුණ දුන් දරුණුතම ආර්ථික අර්බුදයට ශ්‍රී ලාංකිකයින් මේ වනවිට මුහුණ දෙමින් සිටී.

2019 වර්ෂයේදී ලොව පුරා ඇති වූ කොවිඩ් - 19 (covid-19) වසංගතය මේ සඳහා ප්‍රධානම හේතුව විය. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංගණනයට අනුව 2022 වසරේ තුන්වන කාර්තුවේ ආර්ථිකය11.8% කින් පහළ ගිය අතර, එය ලංකා ඉතිහාසයේ දෙවැනි වරට ඇතිවූ අයහපත් ආර්ථික අවපාතය විය. මේ සමඟ ආහාර අර්බුදය යන්න පිළිබඳව කතිකාවත ලොව පුරා පැතිර යන්නට විය. ශ්‍රී ලංකාව තුළද දැඩිව මෙම මාතෘකාව කතා කරන්නට පටන් ගත්තේ කොවිඩ් - 19 (covid-19) වසංගත තත්ත්වය හා ආර්ථික අවපාතය තුළ මතු වූ අර්බුදකාරී වාතාවරණයෙන් පසුවය (තිලකරත්න,2023).

**ආහාර අර්බුදය යනු කුමක්ද ?** ආහාර අර්බුදය රටවල් හෝ පුද්ගලයින්ගේ ආහාර අවශ්‍යතා සපුරාලීමට අපොහොසත් වන විට, එම තත්ත්වය පැහැදිලි කිරීම සඳහා භාවිත කරන යෙදුමකි. එනම් ජනතාවගේ අවශ්‍යතා සපුරාලීමට ආහාර හෝ ආහාර නොමැතිකම ලෙස කෙටියෙන් හැඳින්විය හැකිය (Sanchez, 2023). මෙරට ආර්ථික අර්බුද ඇති වීමට ප්‍රධාන වශයෙන්ම දුර්වල කෘෂිකාර්මික නිෂ්පාදනය, මිල ඉහළ යාම සහ පවතින ආර්ථික අර්බුදය සෘජුවම බලපාන්නට විය. මේ අනුව ශ්‍රී ලංකාවේ ආහාර අනාරක්ෂිතතාවය උග්‍ර විය හැකි බව ආහාර හා කෘෂිකර්ම සංවිධානය සහ ලෝක ආහාර වැඩපිළිවෙළ අනතුරු අඟවා ඇත.

ජනගහනයෙන් 30% ආසන්න ප්‍රමාණයක් දැනටමත් ආහාර අනාරක්ෂිතතාවයට පත් ව ඇති බවත්, එයට කඩිනමින් විසඳුම් නොලැබුනොත් මේ තත්ත්වය තවදුරටත් උග්‍ර වන බවත් පෙන්වා දී ඇත. ශ්‍රී ලංකාවේ මිලියන 6.3 ක ජනගහනයක් මධ්‍යස්ථ මට්ටමේ සිට උග්‍ර මට්ටමේ ආහාර අර්බුදයකට මුහුණ දෙන බවත් ප්‍රමාණවත් ජීවිතාරක්ෂක සහ ජීවනෝපායන ආධාර ලබා නොදුන්නොත් ඔවුන්ගේ තත්ත්වය වඩාත් බැරෑරුම් වන බව එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) සහ ලෝක ආහාර වැඩපිළිවෙළ (WFP) නව වාර්තාවක් නිකුත් කරමින් අදහස් ප්‍රකාශ කර ඇත. මෙයට ප්‍රධාන හේතුව ලෙස ඔවුන් පෙන්වා දෙන්නේ ආසන්න වාර දෙකක බෝග අස්වැන්න අසාර්ථක වීම හේතුවෙන් ආහාර නිෂ්පාදනය 50% දක්වා පහත වැටුණු අතර, විදේශ විනිමය අර්බුදය හේතුවෙන් ආහාර සහ ධාන්‍ය මෙරටට ගෙන්වීම අඩු කිරීම මෙරට ආහාර අර්බුදය ඇති වීමට ප්‍රධාන හේතු වූ බවයි (දෙරණ, 2022).

දේශීය ජනතාවගේ දෛනික ජීවිතයට අවශ්‍ය මූලික අවශ්‍යතාවන ආහාර, ඉන්ධන, ගෑස් හා අනෙකුත් අවශ්‍යතා සඳහා ආනයන බිල්පත් 2021 වසරේ, සිව්වන කාර්තුවේ සිට ක්‍රමයෙන් ඉහළ යමින් පැවති අතර 2022 අගෝස්තු මාසයේ දී මෙතෙක් වාර්තාවන ඉහළම අගයට ළඟාවෙමින් වසරෙන් වසර ආහාර උද්ධමනය 94% ආසන්න ප්‍රමාණයකින් වැඩි වෙමින් ගෘහස්ථ මිලදී ගැනීමේ හැකියාව තවදුරටත් සීමා කරන්නට විය. එලෙසම ලෝක බැංකු වාර්තාවට අනුව ශ්‍රී ලංකාව ඉහළම ආහාර මිල උද්ධමනය ඇති රටවල් දහය (10) අතර පස්වන (05) ස්ථානයට පත්විය (තිලකරත්න,2023).

2013 වසරේ ගෝලීය ආහාර සුරක්ෂිතතා දර්ශකය අනුව ශ්‍රී ලංකාව ආහාර සුරක්ෂිතතා අගය 48.6% ක් විය (ගෝලීය වශයෙන් එය 60 වැනි ස්ථානය). දකුණු ආසියාවේ වඩාත්ම ආහාර සුරක්ෂිත රටවල් අතර ශ්‍රී ලංකාව ඉදිරියෙන්ම සිටින ලදී. 2009 දී ලංකාවේ නිවෙස්වලින් 88% කට ප්‍රමාණවත් තරම් ආහාර තිබූ අතර, නූතනය වන විට 10% දක්වා පහළ බැස ඇත. මේ තත්ත්වය දැඩිව බලපා ඇත්තේ, සීමිත හෝ අක්‍රමවත් ආදායම් ලබන පුද්ගලයන්, හදිසි අවස්ථාවකදී භාවිතයට ගැනීම සඳහා සීමිත ආහාර සංචිත සහ සීමිත ඉතුරුම් සහිත පුද්ගලයන්, මන්දපෝෂණය

ගැටලු සහ නිදන්ගත රෝග වැනි දුර්වල සෞඛ්‍ය තත්ත්වයන් ඇති පුද්ගලයන්, විවිධ භාණ්ඩ වර්ග හා වෙළෙඳපොළ සීමිත ප්‍රවේශයක් සහිත දුර බැහැර ප්‍රදේශවල ජීවත්වන පුද්ගලයන්, ආහාර අවශ්‍යතාවය සඳහා වෙළෙඳපොළ මත මුළුමනින්ම යැපෙන්නේ නාගරික ජනගහනයේ ඇතැම් කණ්ඩායම්, සීමිත සමාජ ජාල සම්බන්ධතා ඇති පුද්ගලයන්, ප්‍රවාහන පහසුකම් සීමිතව ඇති හෝ නොමැති පුද්ගලයන්, වැඩිහිටි, නිවාස අහිමි හෝ අවතැන් වූ කණ්ඩායම්, දරුවන් හා කාන්තාවන් හා වතුකරයේ ජනතාව මෙහිදී දැඩිව බලපෑම් සහිත ප්‍රජාව ලෙස සෘජුවම හඳුනා ගත හැකිය. ආර්ථිකය යහපත් මට්ටමින් ඇති පිරිසට මෙහිදි දැඩි බලපෑමක් සිදු නොවිය.

ලෝක ආහාර වැඩසටහනේ නවතම තක්සේරුවලට අනුව, නිවෙස්වලින් 86% කම පෝෂණ ගුණයෙන් අඩු ආහාර මිලදී ගැනීමටද, ආහාර අඩුවෙන් පරිභෝජනය කිරීමටත්, සමහර අවස්ථාවලදී ආහාර වේල් සම්පූර්ණයෙන්ම මඟ හැරීම ද සිදුවිය. මේ තත්ත්වය මත බහුතරයක් උසස් තත්ත්වයේ පෝෂදායී ආහාර ලබා ගැනීමට නොහැකි නිසා ලාභදායී සහ සෞඛ්‍යයට අහිතකර විකල්ප ආහාරවලට යොමු වීම මත සෞඛ්‍ය තත්ත්වය දැඩිව පිරිහීමටද මෙය හේතුවක් වී ඇත.

**දේශීය කෘෂිකාර්මික නිෂ්පාදන අඩු වීම**. මෙයට ප්‍රධානම හේතුව වන්නේ, අතීතයේ කාබනික පොහොර යොදා කෘෂිකාර්මික නිෂ්පාදන සිදු කළත්, වර්තමානය වන විට කෘතීම පොහොර වර්ග භාවිතා කරමින් කෘෂි නිෂ්පාදන කටයුතු සිදු කිරීමට හුරු වූ නිසා අස්වැන්න බහුල විය. නමුත් ක්ෂණිකව ගත් තීරණ මත කෘතීම පොහොර ආදිය නොමැතිව වගාවන් සිදු කළ නිසා, කෘෂි නිෂ්පාදනය අඩු වීම මේ කාලය තුළ කෘෂිකර්මාන්තයේ දක්නට ලැබූ ප්‍රධාන ගැටලුවක් විය. එවකට සිටි රජය ගනු ලැබූ තීන්දු තීරණ නිසා කෘතීම පොහොර නොමැතිව, නැවත කාබනික පොහොර භාවිතයෙන් කෘෂිකාර්මික කටයුතු සිදු කළත් එය අසාර්ථක විය. එම නිසා දේශීය කෘෂිකර්මාන්තයේ ආසන්න කන්න දෙකක තුළ නිෂ්පාදනය අඩු විය. මීට අමතරව විදේශ විනිම සංචිත හිඟකම සහ මුදලේ (රුපියලේ) අගය අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස, ආහාර මෙරටට ආනයනය සීමා වීම මත ජීවන වියදම ඉහළ යාම නිසා ජනතාවට සෞඛ්‍ය සම්පන්න සහ දැරිය හැකි මිලට ආහාර ලබා ගැනීමට තිබූ අවස්ථාව සීමා විය.

මීට ඉහතදී සඳහන් කළ පරිදි, ලෝක ආහාර වැඩ සටහනෙහි ඇස්තමේන්තුවට අනුව පුද්ගලයින් මිලියන 6.3 ක් එනම්, ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 30% කට වඩා වැඩි පිරිසක් ආහාර අර්බුදයට මුහුණ පා සිටී. මෙම පිරිසෙන් පුද්ගලයන් මිලියන 5.3 ක් පමණ ආහාරවේල් අඩු කිරීමේ හෝ මඟ හැරීම සිදු කරන අතර, අවම වශයෙන් 65,600 අනාරක්ෂිතතාවයට ගොදුරුව ඇත. මෙරට තුළ පවතින අර්බුදකාරී වාතාවරණය උග්‍ර වීමත් සමඟ ඉහළ උද්ධමනය, ජීවනෝපාය අහිමි වීම, මිලදී ගැනීමේ හැකියාව දුර්වල වීම සහ ආහාර, බෙහෙත්, ගෑස් සහ ඉන්ධන වැනි අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල උග්‍ර හිඟය හා මිල ගණන් ඉහළ යාම හේතුවෙන් මෙම තත්ත්වය වඩාත් අයහපත් අතට හරවයි. මෙම යැපුම් හිඟය අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ගණන් ඉහළ යාමට සෘජුවම බලපාන ලදී. එසේම රට තුළ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් මව්වරුන්ට හා මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන්හට ශක්තිය වර්ධනයට ලබා දෙන ආහාර සීමා කිරීම සමඟ පවතින තත්ත්වය තවදුරටත් උග්‍ර වන්නට විය.

ආහාර අර්බුදය තවදුරටත් තීව්‍ර වීමට සහල් සහ එළවළු, මස්, මාංශවල නැති නම් ප්‍රධාන ආහාර ද්‍රව්‍යවල මිල ගණන් දෙගුණයකටත් වඩා වැඩි වී තිබීම පෙන්වා දිය හැකිය. මීට අමතරව ගෘහස්ථ ගෑස් මිල අධික වීම මෙන්ම හිඟ වීම මත අර්බුදකාරී වාතාවරණය තවදුරටත් දැරිය නොහැකි මට්ටමක් දක්වා වර්ධනය විය. ලෝක ආහාර වැඩසටහන

අනුව ආහාර මිල ඉහළ යාම මිනිසුන්ට ඔවුන්ගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම වඩාත් දුෂ්කර කරයි (තිලකරත්න,2023).

ආර්ථික අර්බුදයේ තවත් ප්‍රතිඵලයක් ලෙස බොහෝමයක් ජනතාවගේ ආදායම් තත්ත්වය පහත වැටී ඇති අතරම බොහෝමයක් දෙනාට තමන් කළ රැකියාවද අහිමි වී ඇත. මෙය ද ආහාර අර්බුදයට දැඩිව බලපෑමට හේතු වී ඇත. රට තුළ පවතින දුර්වල පාලනය, මුදලේ අගය පහළ බැසීමත් හේතු කොට ගෙන පවුලක් නඩත්තු කිරීමට උපයන මුදල ප්‍රමාණවත් නොවීය. පවුලේ යැපෙන්නන් ප්‍රමාණය වැඩි වීම, ආදායම් උපයන ප්‍රමාණය අඩු වීම, ආදායම් උපයන පිරිස අඩු වීම මත පවුල් සංස්ථාවට ලැබෙන ආර්ථිකය අවම මට්ටමක විය. මේ තත්ත්වය දරා ගැනීමට නොහැකි වූ නිසාත් ආර්ථිකය ඉපයීමට කළ හැකියි වෙනත් යමක් නොහැකි නිසාත් බහුතරයක් ග්‍රාමීය හා වතු ආශ්‍රිත පූජාව තම ජීවිත නැති කර ගැනීමට උත්සාහ කිරීමත්, දරුවන්ගේ ජීවිතවලට හානි සිදුකරමින් තමන්ද සිය දිවිනසා ගැනීම් ගණනාවක්ම මෙරටින් වාර්තා විය. මෙය ආහාර අර්බුදයේ පවතින ගැටලුකාරී බව පෙන්වන අවස්ථාවක් ලෙස හඳුනා ගත හැකිය.

මේ අනුව නූතනය වන විට ශ්‍රී ලංකාව තුළ දැඩිව පවතින ආහාර අර්බුදයට නැති නම් ආහාර අනාරක්ෂිතතාවයට එරෙහිව සටන් කිරීමට සහ තිරසාර දේශීය නිෂ්පාදනය සහතික කිරීමට දිගු කාලීන උපාය මාර්ග අවශ්‍ය වන අතරම, වර්තමානයේ මිනිසුන්ගේ පවතින කුසගින්න නැති කිරීමට කඩිනම් පියවර ගත යුතුය. අතීතයේ සාම්ප්‍රදායික ආහාර සංස්කෘතියක් තිබූ මෙරට එම තත්ත්වයට පත් කිරීමට සියලු දෙනා මැදිහත් විය යුතුය

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. අනාගත ආහාර අර්බුදයට අප සූදානම්ද ?.(2018).ලංකාදීප.
2. අයිරාංගනී,එස්.කේ.(2023).ලෝක ආහාර වැඩසටහන.
3. ඉහළගම,එච්.ඒ.ඒ.එස්.(2012/2013).සාහිත්‍ය හා ජනශ්‍රැති මූලාශ්‍ර මඟින් පිළිඹිබු කෙරෙන ශ්‍රී ලාංකිය සම්ප්‍රදායික ආහාර සංස්කෘතිය පිළිබඳ දළ විමසුමක්. මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය,19 කලාපය, කැලණිය විශ්වවිද්‍යාලය.
4. කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවය.(2020). ශ්‍රී ලංකා මහ බැංකුව.
5. තිලකරත්න,එන්.සී.(2023). ශ්‍රී ලංකාවේ ආහාර අනාරක්ෂතාවය (වර්තමාන තත්ත්වය).
6. රාජපක්ෂ,උදය.(1997).අපේ සම්ප්‍රදායික ආහාර. ජාතික ඉඩම් හා කෘෂිකර්ම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය, කොළඹ.
7. ලංකාවේ ලක්ෂ 34 ක් ආහාර අර්බුදයක ..... පවුල් 70% ප්‍රෝටීන් නෑ WFP.(2023). Lanka C News.
8. සිරිවීර,ඉන්ද්‍රකීර්ති.(1993).ශ්‍රී ලංකාවේ කෘෂි ඉතිහාසය(ක්‍රි.ව 1500 දක්වා).ගොඩගේ සහෝදරයෝ, කොළඹ.
9. http://biz.adaderana.lk
10. https://m.facebook.com/traditionaldish.sl

11. https://myschool.lk
12. https://owita.lk/blog/the-richest-food-culture
13. https://sinhala.alpanthiya.lk/parani-sri-lankawe-ahara-ha-bandhi-sanskruthiya/
14. https://sinhala.dgi.gov.lk/featured
15. https://si.wikipedia.org/wiki
16. https://www.bbc.com/sinhala/sri-lanka
17. https://www.dinamina.lk
18. https://www.vinivida.lk

# 02. මන්දපෝෂණය හා ආහාර අනාරක්ෂිතතාව: වහා පිළියම් සෙවිය යුතු සමාජ ගැටලු

ඩබ්ලිව්. එච්. සිරිසේන
පුහුණු හා පර්යේෂණ නිලධාරි
M.A. (Economics)

තුන්වන ලෝකයේ සෑම රටකම ව්‍යාධියක් ලෙස පැතිර පවත්නා දුප්පත්කම විසින් ලෝකයට දායාද කරන ලද අතුරුඵල රාශියකි. එහිදී ආහාර හිඟය හා මන්දපෝෂණය ප්‍රධාන තැනක් ගනී. මන්දපෝෂණය යනු මිනිසාගේ යහපත් සෞඛ්‍යයට අවශ්‍ය ආහාර වර්ග ඉතා අඩුවෙන් ලබා ගැනීමයි (zenonco.io). මන්දපෝෂණය යනු අවිධිමත් හා ප්‍රමාණාත්මක නොවන ආහාර රටාවක් නිසා ඇති කරන තත්ත්වය විග්‍රහ කිරීමට භාවිත කෙරෙන වෛද්‍ය විද්‍යාත්මක යෙදුමකි(විකිපීඩියා). යම්කිසි පුද්ගලයෙකු දීර්ඝකාලයක් මුළුල්ලේ නියමිත ප්‍රමාණයට අවශ්‍ය පෝෂක පදාර්ථ හා සංඝටකවලින් යුත් සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් පරිභෝජනය නොකළහොත් මන්දපෝෂණයට ලක්වේ. මෙලෙස මන්දපෝෂණය ඇති වීමට විවිධ හේතු සාධක බලපායි.



## මන්දපෝෂණයට හේතු:

**නුසුදුසු ආහාර භාවිතය:** විවිධ පෝෂ්‍ය පදාර්ථවලින් පොහොසත් ආහාර සඳහා සීමිත ප්‍රවේශය, දරිද්‍රතාවය, පෝෂණය පිළිබඳ අධ්‍යාපනයක් නොමැතිකම සහ ආහාර අනාරක්ෂිතභාවය මන්දපෝෂණයට දායක විය හැකිය. ගනු ලබන ආහාරවල ගුණාත්මක බව පිළිබඳ අවබෝධයකින් තොරව කටයුතු කිරීම නිසා මන්දපෝෂණ තත්වය ඇතිවීමට හේතු වේ.

**නිදන්ගත රෝග:** පිළිකා, HIV/AIDS, වකුගඩු රෝග සහ හෘදයාබාධ වැනි සෞඛ්‍ය තත්ත්වයන් නිසා පෝෂක අවශෝෂණයට බලපෑම් ඇති කිරීමට හේතු විය හැක. මෙය රෝගී තත්වය නිසා මිනිසාට බලපානු ලබන තත්වයකි.

**මත්පැන් භාවිතය:** අධික ලෙස මත්පැන් පානය කිරීම පෝෂ්‍ය පදාර්ථ අවශෝෂණයට බාධාවක් වන අතර, මන්දපෝෂණයට හේතු විය හැක. එමෙන්ම අඩු ආදායම්ලාභී පවුල්වල සිටින්නන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවී සිටීමත්, එනිසා දෛනිකව ආහාර පාරිභෝජන අවශ්‍යතා සපුරාගැනීමට අපහසුවීමත් නිසා පවුලේ අය මන්දපෝෂණ තත්වයට ගොදුරුවේ.

**ආහාර ගැනීමේ අක්‍රමිකතා:**

අක්‍රමවත් ලෙස ආහාර ගැනීම වැනි තත්වයන් දරුණු මන්දපෝෂණයට හේතු විය හැකි අහිතකර ආහාර රටාවන් මෙයට ඇතුළත් වේ.

**දරිද්‍රතාවය සහ සමාජ ආර්ථික සාධක:**


පෝෂ්‍යදායී ආහාර සඳහා ප්‍රවේශවීමට නොහැකියාව මෙන්ම සීමිත සම්පත් සහ දරිද්‍රතාවය බොහෝ පවුල්වල මන්දපෝෂණ තත්වය ඇතිවීමට හේතු වේ.



මන්දපෝෂණය කායික හා මානසික සෞඛ්‍යයට අහිතකර බලපෑම් රාශියක් ඇති කළ හැකිය, ඒවා අතර, දරුවන්ගේ වර්ධනය හා සංවර්ධනය අඩාල වීම, දුර්වල ප්‍රතිශක්තිකරණය හා ආසාදනවලට වැඩි සංවේදීතාවයක් ඇතිවීම, අඩු බර සහිතවීම, දුර්වල වූ සංජානනය, ඉගෙනීමේ හැකියාව අඩු වීම, නිදන්ගත රෝග ඇතිවීමේ අවදානම වැඩි වීම, ගර්භණී මන්දපෝෂණය නිසා අඩු බර දරු උපත් සිදුවීම යනාදිය හඳුනාගෙන ඇත. මන්දපෝෂණයට ප්‍රතිකාර කිරීම යනු එය ඇතිවීම සඳහා බලපානු ලබන මූලික හේතූන් ආමන්ත්‍රණය කිරීම සහ සමබල ආහාර වේලක් මගින් ප්‍රමාණවත් පෝෂණයක් ලබාදීමයි. මන්දපෝෂණය වැළැක්වීමේ උපාය මාර්ග අතරට පෝෂ්‍යදායී ආහාර සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම, නිසි පෝෂණය සහ මව්කිරි දීම පිළිබඳ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම, කෘෂිකාර්මික පිළිවෙත් වැඩි දියුණු කිරීම සහ මන්දපෝෂණයට දායක වන සමාජ හා ආර්ථික සාධක ආමන්ත්‍රණය කර විසඳුම් සෙවීම ඇතුළත් වේ.

මෙම වසරේ කරන ලද සමීක්ෂණයකට අනුව ශ්‍රී ලංකාවේ උග්‍ර මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන් සංඛ්‍යාව 15000කටත් අධික බව අනාවරණය කර ඇත. සෞඛ්‍ය අමාත්‍යාංශයේ වාර්තාවන්ට අනුව ළමා මන්දපෝෂණය උග්‍රව පවතින්නේ කොළඹ මහ නගර සභා බලප්‍රදේශය තුළයි. මෙයට බලපා ඇති හේතු ගණනාවක් හඳුනාගෙන ඇත. නාගරික දුප්පත්කම, මූලික සෞඛ්‍ය හුරුපුරුදු පිළිබඳව ඇති අඩු දැනුවත්බව, දෙමාපියන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම, අධ්‍යාපනයේ ඌනත්වය ආදී කරුණු එම හේතු අතර ප්‍රධාන වේ. පසුගිය වසරට සාපේක්ෂව මෙම වසරේ මෙම අයහපත් තත්වයන්ගේ වර්ධනයක් පෙන්නුම් කරන බව සමීක්ෂණ වාර්තාවෙන් පෙන්වාදී ඇත. එසේම මෙම පවුල්වල මව්වරුන් අතරද, අඩු බර සහිත දරු උපත් බොහෝ ප්‍රමාණයක් සිදුවන බව පෙන්වා දී ඇත. 2022 වසරේ 15.3%ක් ලෙස පැවති අඩු බර දරු උපත් සංඛ්‍යාව මෙම වසරේ දී 17% දක්වා වර්ධනය වී ඇති බව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කරන ලද සමීක්ෂණ වාර්තාවේ දැක්වේ. අඩු බර සහිත දරුවන් සිටින මව්වරුන් රක්තහීනතාව වැනි පෝෂණ ඌනතාවයන්ගෙන් ද පීඩා විඳින බව වාර්තා කර ඇත. මෙරටේ පවුල් ලක්ෂ 47ක් පමණ කුමන හෝ සහනාධාර ක්‍රමයක් තුළට ඇතුලත්ව සිටින අතර, අඩු ආදායම්ලාභී පවුල්වල ළමුන් වැඩි ප්‍රමාණයක් මන්දපෝෂණ ගැටලුවට මුහුණදී සිටී. පසුගිය කාලයේ පැවති කොරෝනා වසංගතය හේතුවෙන් ඇති වූ ආර්ථික අර්බුදය මෙම තත්වය උග්‍රකිරීමට බලපා ඇති අතර, බොහෝ අඩු ආදායම්ලාභී පවුල්වල ආහාර

අනාරක්ෂිතබව වර්ධනය කිරීමටද බලපා ඇත. පුත්තලම, මඩකලපුව, නුවරඑළිය, වව්නියාව, කිළිනොච්චිය, අම්පාර වැනි දිස්ත්‍රික්කවල මෙම ආහාර අනාරක්ෂිත බව ඉහළ මට්ටමකින් පෙන්නුම් කරන බව එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් මෑතකාලීනව සිදුකර ඇති සමීක්ෂණ වාර්තාවකින් අනාවරණය කර ඇත. දිළිඳුකම, ආහාර අනාරක්ෂිත බව, මන්දපෝෂණය, අඩු බර දරු උපත්, රක්තහීනතාව ආදි තත්වයන් එකිනෙකට බැඳුනු සංකීර්ණ තත්වයන් බව මෙහිදී හඳුනාගත හැකිය.




ඒ අනුව මෙම තත්වයන්ගෙන් මිදීම සඳහා සැලසුම්ගතව කඩිනමින් විසඳුම් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුව ඇත. එහිදී ආහාර සුරක්ෂතතාව ඇතිකර ගැනීමට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි.

ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද ආයතනය (USAID)ට අනුව ලෝකයේ ජීවත්වන සියලුම ජනතාවට අවශ්‍ය සෑම විටකම ක්‍රියාශීලී නිරෝගීමත් දිවි පැවැත්මක් සඳහා ආර්ථිකමය වශයෙන් ප්‍රමාණවත් ලෙස ලබා ගත හැකි ආරක්ෂාකාරී පෝෂ්‍යදායී ආහාර තිබීම ආහාර සුරක්ෂිතතාව ලෙස හඳුන්වයි. මෙම තත්ත්වය සපිරීමට නොහැකිවන විට ආහාර අනාරක්ෂිතතාව ඇති වේ.

ආහාර සුරක්ෂිතතාව ඇති වීම සඳහා වැදගත්වන ප්‍රධාන කරුණු 4 ක් පිළිබඳ මෙහි දී අවධානයට යොමු කර ඇත.

**ආහාර ලබා ගැනීමේ හැකියාව,** දේශීය නිෂ්පාදන හෝ ආනයන මගින් සපයනු ලබන ගුණාත්මක ආහාර


අවශ්‍ය ප්‍රමාණයෙන් ලබා ගැනීමේ හැකියාව තිබිය යුතුය යන්න මෙයින් අදහස් වේ.

**ආහාර සඳහා ප්‍රවේශ වීමේ හැකියාව,** පෝෂ්‍යදායී ආහාර වේලක් ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් සම්පත් සඳහා පුද්ගලයන්ට ප්‍රවේශ වීමට හැකියාව පැවතිය යුතු බව මෙමගින් පෙන්වාදී ඇත.

**උපයෝජනය,** සියලුම විද්‍යාත්මක අවශ්‍යතා සපුරාලන පෝෂණීය යහපැවැත්මට ළඟා වීම සඳහා ප්‍රමාණවත් ආහාර උපයෝජනය කර ගත හැකි වීම මෙමගින් පෙන්නුම් කරයි.

**ස්ථාවරබව,** ආහාර සුරක්ෂිතතාව ඇති වීමට නම් සමස්ත ජනගහනයට, කුටුම්බයකට හෝ තනි පුද්ගලයෙකුට, අවශ්‍ය සෑම විටම ප්‍රමාණවත් ආහාර වේලක් ලබා ගැනීමේ හැකියාව පැවතිය යුතු ය. එහිදී ක්ෂණික සිදුවීම් හෝ චක්‍රීය සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස ආහාර සඳහා ප්‍රවේශ වීමේ හැකියාව සීමා නොවිය යුතු බව මෙයින් අදහස් වේ.

වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ පවතින ආර්ථික අර්බුදය තුළ මාතෘ පෝෂණ තත්ත්වය යහපත්ව පවත්වාගැනීමේ අභියෝගයටද මුහුණදිය යුතුව ඇත. ලෝක බැංකුව විසින් 2023 අප්‍රේල් මාසයේ දී ප්‍රකාශයට පත් කර ඇති අන්දමට 2021 වර්ෂය තුළ මෙරටේ දිළිඳු ජනගහණය 13.1%ක් ලෙස හඳුනා ගෙන ඇති අතර, 2022 වර්ෂයේ දී එම අගය 25%ක් දක්වා ඉහළ ගොස් තිබේ. 2021ට සාපේක්ෂව එම වැඩිවීම ජනගහනයෙන් මිලියන 2.5ක පුද්ගලයන්ගේ වැඩිවීමකි. 2023 වර්ෂය අවසාන වන විට එම අගය 27.5%ක් දක්වා ඉහළ යනු ඇතැයි ලෝක බැංකුව පුරෝකථනය කර තිබේ. ලෝක බැංකු දත්තවලට අනුව ශ්‍රී ලංකාවේ නාගරික දිළිඳුබව 2022 දී 15%කි. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2022 ජනවාරි දත්තවලට අනුව කොළඹ නගරයේ ජීවත්වන එක් අයෙකුගේ අවම වියදම මසකට රු: 9624ක් ලෙස ගණනය කර ඇති අතර, එය 2022 දෙසැම්බර් වන විට රු: 14859ක් දක්වා ඉහළ ගොස් තිබේ. මේ හේතුවෙන් මවුවරුන්ට අවශ්‍ය පෝෂ්‍යදායී ආහාර මිලට ගැනීමට අවශ්‍ය ක්‍රය ශක්තිය පහළ ගොස් ඇත. පවුලේ ආහාර



සුරක්ෂිතතාව තවදුරටත් පිරිහීම වැළක්වීම සඳහා සහ කෘෂිකාර්මික නිෂ්පාදන යථා තත්ත්වයට පත් කිරීමට කුඩා පරිමාණ ගොවීන් ඉලක්ක කර ජීවනෝපාය සංවර්ධන වැඩපිළිවෙලක් සකසා ඒ තුළට අඩු ආදායම්ලාභී පවුල් ගොණුගත කර ගැනීම වඩා ප්‍රායෝගික විසඳුම් ක්‍රියාමාර්ගයක් ලෙස බොහෝ දෙනා පෙන්වාදෙන අදහසකි. ජනගහනයෙන් බොහෝ ප්‍රමාණයක් කෘෂිකර්මාන්තය මත යැපෙන බැවින් ගොවීන්ගේ නිෂ්පාදන ධාරිතාව වැඩි දියුණු කිරීම තුළින් පවුල්වල කෘෂිකාර්මික අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නංවාගැනීම මෙහිදී ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකාවේ ආහාර හා පෝෂණ සුරක්ෂිතාව තහවුර කිරීමට ජාතික සැලැස්මක් ඔස්සේ කටයුතු කළ යුතුව ඇත. කෘෂිකර්මාන්තය නවීකරණය තුළින් නිෂ්පාදනය සහ තරඟකාරිත්වය ඉහළ නංවා ගනිමින් විදේශ විනිමය ඉපැයිය හැකි ක්ෂේත්‍රයක් බවට ද කෘෂිකර්මාන්තය පත්කර ගත හැකිය. ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය සහතික කිරීම සඳහා ග්‍රාමීය ආර්ථිකය සවිබලගැන්වීමට කටයුතු කළ යුතුය. පවුලේ පෝෂණ තත්වය ආරක්ෂාකර ගනිමින් ආහාර සුරක්ෂිතතාව පවුල තුළ පවත්වාගැනීම සඳහා අතීතයේදී සුරක්ෂිත ක්‍රම රාශියක් අනුගමනය කර තිබීම දක්නට ඇත. නවීන තාක්ෂණික ක්‍රම භාවිතය ද වර්තමානයේදී දක්නට ලැබෙන අතර, අතීතයේ දී අනුගමනය කරන ලද ආහාර සුරක්ෂිත ක්‍රම අද වන විට ද අනුගමන කරන බව දක්නට ඇත. එසේ වුවත්, වර්තමානයේ දී බොහෝ පිරිස් මෙවැනි ක්‍රම අනුගමනය නොකිරීමෙන් උද්ගතව අති සෞඛ්‍ය හා පෝෂණ ගැටලු ප්‍රබල කිරීමට ද හේතුවී ඇත.

වර්තමානයේ අප මුහුණු දී සිටින ආහාර අනාරක්ෂිත බව නිසා උද්ගතව පවත්නා ගැටලු ක්‍රමයෙන් විසඳාගැනීම සඳහා අප අතීතයේ දී අනුගමනය කරන ලද ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීමේ සරල ක්‍රම වර්තමානයේ දීද අනුගමනය කිරීමට යොමුවන්නේ නම් පවුලේ පෝෂණ තත්වය අඛණ්ඩව පවත්වා ගෙන යාමට බොහෝ පිටිවහලක් වන බව මේ වන විට උද්ගතව ඇති තත්වයන්ගෙන් පෙන්නුම් කරයි. ඒ අනුව, තමන්ට අනුගමනය කළ හැකි සරල ක්‍රම භාවිතය මගින් පවුල තුළ ආහාර සංචිතයක් පවත්වාගන යන්නේ නම් පවුල තුළ උද්ගතවන මෙම ගැටලුවලට ඵලදායී යම් විසඳුමක් සොයාගත හැකිය. පවුල තුළින් ඇතිවන මෙම ක්‍රියාවලිය සමාජමය වශයෙන් දියත් කිරීම සඳහා ක්‍රමවත්ම ග්‍රාමීය, වතු හා නාගරික කෘෂි ආර්ථිකය නගා සිටුවීම ඉතා වැදගත් වේ. එහි දී, කෘෂි අංශය සඳහා රජයේ වියදම් වැඩි කිරීම, නියං, ගංවතුර, පොහොර සහනාධාර ලබා දීම සිදු කළ යුතුය. එසේ ම කෘෂි කර්මාන්තය ආශ්‍රිත පර්යේෂණ සඳහා රජයේ වියදම් ඉහළ නැංවීම, නව භෝග සහ පසු අස්වනු තාක්ෂණය පිළිබඳ ගොවීන්ට අවශ්‍ය දැනුම ලබා දීම හා උපදෙස් ලබා දීම වැදගත් වේ. එසේම කෘෂිකර්මාන්තය ආශ්‍රිත ජෛව විවිධත්වය ඇති කිරීම ද වැදගත් වේ. තිරසර ලෙස කෘෂි කර්මාන්තය දියුණු කිරීම සහ පරිසරයට අවම බලපෑමක් සහිත කෘෂි කාර්මික කටයුතු දියුණු කිරීම පිළිබඳ අවධානය යොමුකළ යුතුය. එමගින් දෙවන තිරසර සංවර්ධන ඉලක්කය වන කුසගින්න දුරලීම, ආහාර සුරක්ෂිතතාව සහ ඉහළ පෝෂණ තත්වයක් අත්කර ගැනීම හා තිරසර කෘෂි කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම යන කරුණු සපුරාගැනීම සඳහා ඉලක්කගතව කටයුතු කළ යුතුය. එබැවින් ඉහත අභියෝග ජය ගැනීම සඳහා නොපමාව හා සැලසුම්ගතව කාර්යයන් දියත් කිරීමට කාලය පැමිණ ඇත.

# 03. පුද්ගල ඵලදායිතාවය වර්ධනය සඳහා මූල්‍ය කළමනාකරණය.

එච්.එම්.ජී.කේ.නවරත්න
සංවර්ධන නිලධාරි
B.A. Archaeology (Hons)

යම් රටක් සංවර්ධනය කරා ළඟාවීම සඳහා ඵලදායිතාවය මහඟු පිටුවහලක් සිදු කරයි. ඵලදායිතාවය යනුවෙන් අදහස් කරනුයේ නිවැරදි දෙය නිවැරදි ලෙසින් සිදු කිරීමයි. එනම් නිවැරදි දෙයක් වැරදි ලෙසින් සිදු කිරීම ඵලදායි නොවේ. ඵලදායිතාවය සමඟින් සඵලමත්භාවය (Effectiveness) සහ කාර්යමක්ෂමතාවය (Efficiency) සමගින් ඉතා සමීප සම්බන්ධතාවයක් පවතී. සඵලමත්භාවය යනුවෙන් අදහස් වන්නේ අරමුණු හා ඉලක්ක සපුරා ගැනීමයි. අපතේ යාමකින් තොරව සම්පත් භාවිතා කිරීම කාර්යමක්ෂමතාවය ලෙසින් හැඳින් වේ. පවුල තුළ ඵලදායිතාවය වර්ධනය කිරීම ඉතා වැදගත් ය. නිවස තුළ සිදු වන සියළුම කාර්යයන් නිසි කළමනාකරණයක් අනුව සිදුවීම තුළින් නිවසේ සෞභාග්‍යය උදා වේ. පවුල් කිහිපයක් ඒකරාශි වීමෙන් සමාජය නිර්මාණය වී සමාජ ඵලදායිතාවය වර්ධනය වේ. පුද්ගල ඵලදායිතාවය වර්ධනය කිරිම සඳහා නිවසේ මූල්‍ය කළමනාකරණය කිරිම සුවිශේෂී ය. ආකල්පමය වෙනසක් තුළින් මුදල් කළමණාකරණය සිදු කළ හැකි ය.

පුද්ගල ඵලදායිතාවය වර්ධනය කිරිම සඳහා මූල්‍ය කළමණාකරණය සිදු කරන ලබන ආකාරය පිළිබඳව අධ්‍යයනයක් සිදු කිරිම තුළින් දැනුම ලබාදීම මෙමගින් සිදු වේ.

**01. පෞද්ගලික අයවැය ලේඛනයක් පවත්වා ගෙන යාම.**

මෙම ලේඛනයක් සකස් කර ගැනීම තුළින් ආදායම් හා වියදම් වෙන් වෙන්ව හඳුනා ගැනීමට හැකි ය. මසකදී සිදු කළ යුතු සියලු ගෙවීම් මොනවා ද? වියදම් මොනවා ද? කියා පැහැදිළිව සටහන් කිරිමක් සිදු කරනු ලබයි. සැලසුම් කර වියදම් කිරිමක් මෙමගින් සිදු වේ. ආපදාවලදි ප්‍රයෝජනයට ගැනිම සඳහා මුදල් වෙන් කිරිමක් මෙමගින් සිදු වේ. මෙය සැකසීම ඉතා පහසු කාර්යයක් නොවන අතර මෙමගින් ඉපයීම් හා වියදම් රටාව පිළිබඳව මනා අවබෝධයක් තිබිය යුතු ය. පෞද්ගලික අයවැයක් පවත්වා ගෙන යාමේදී ඇතිවන බාධාවන් කිහිපයකි.

- **ක්‍රෙඩිට් කාඩ්ස්(Credit Cards)** - වර්තමානයේ රට තුළ බහුලව භාවිත වන්නකි. ණය කාඩ්පත් ලෙසින්ද මේවා හැඳින් වේ. ඇතැම් වානිජමය බැංකු මගින් ගෙවිය යුතු ඇතුළත් වීමේ ගාස්තු පවා අය නොකර මෙම කාඩ්පත් නිකුත් කරනු ලබයි. මෙමගින් මුදල් නොමැති අවස්ථාවන්වලදි පවා තමන්ට අවශ්‍ය නොවන දේ ගැනීමට පෙලඹීමක් ඇති වේ. හදිසි අවස්ථාවන්වලදි පමණක් භාවිත කර එය සෑම විටම ළඟ තබා ගැනිමක් නොකළ යුතු ය. මෙමගින් වැළකි සිටීමට නම් මුදල් හෝ චෙක්පත් භාවිත කළ හැකි ය. මෙමගින් මිදිමට භාවිත කළ හැකි ක්‍රම කිහිපයකි. A4 ප්‍රමාණයක කොළයක් භාවිත කර එක් එක් කාඩ්පතට ගෙවිය යුතු මුළු මුදල, ගෙවිය යුතු දිනය සටහන් කිරීම කළ හැකි ය. අඩු පොළියක් සහිතව නිකුත් කර ඇති කාඩ්පතක් පමණක් මෙන්ම නිතරම එක් කාඩ්පතක් පමණක් භාවිත කිරිමට හුරු විය යුතු ය. එක් කාඩ්පතක් භාවිතයට පමණක් පෙලඹීම

වැදගත් ය. නිසි කාලයන්වලදි ගෙවිය යුතු මුදල ගෙවීම කළ යුතු අතර නැතහොත් විශාල ප්‍රමාද ගාස්තුවක් ගෙවීමට සිදු වේ. යම් ආකාරයකින් මසකදි අවම මුදල් ප්‍රමාණය ගෙවීමට නොහැකි වු අවස්ථාවේදි ඒ පිළිබඳව බැංකුව දැනුවත් කිරිම කළ යුතු ය.

- **නොඉවසිල්ල -** මෙමගින් අයවැය ලේඛණය අඛණ්ඩව පවත්වා ගෙන යාමට නොහැකි ය. ඉවසිම රැක ගනිමින් ඉතිරි කිරිම් සිදු කිරිම ඉතා වැදගත් ය. ඉවසීම නොතිබුණු විට අනවශ්‍ය දේවල් ගැනිමට පෙළඹේ.

- **සංශෝධනය කිරීම -** අයවැය ලේඛනය සැකසිම සිදු කරනුයේ පවතින අවස්ථාව සැලකිල්ලට ගනිමිනි. පසු මසකදී මිල ඉහළයාම් යනාදිය යම් වෙනසකට ලක් වුවහොත් එම සංශෝධනයන් අයවැය ලේඛනයට ඇතුළත් කළ යුතු ය. එසේ නොකළවිට අයවැය ලේඛනය සාර්ථකව අඛණ්ඩව පවත්වා ගෙන යාමට නොහැකි ය.

- **නිවාඩු දිනයන් පිළිබඳ සැලකිලිමත් වීම -** බොහෝ පුද්ගලයන් අයවැය ලේඛනය සාදන අවස්ථාවේ මාසය තුළ ඇති නිවාඩු දිනයන් පිළිබඳව සැලකිලිමත් බවත් දක්වන්නේ නැත. එලෙසින් නිවාඩු දිනයන් තුළදි රෙදි පිළි මිලදි ගැනිම, මිත්‍රයන් හමුවිම් යනාදිය වෙනුවෙන් යොදවා ගන්නා නිසා මෙමගින් නොදැනුවත්වම විශාල මුදලක් නාස්තියට ලක් වේ.

මෙලෙසින් පෞද්ගලික අයවැය ලේඛනයක් භාවිත කිරිමෙන් ලැබෙන යහපත් ප්‍රථිඵල රාශියකි. මුදල් ආතතියෙන් ගැලවීම, ඉතුරු කිරිම් පුරුද්දකට යොමු විම, ණය විමේ ප්‍රවණතාවය අඩු වීම, කාල කළමනාකරණය, මානසික සුවතාවය ඉන් කිහිපයකි.

**02.** **මුදල් වියදම් වන ආකාරය නොදැන සිටීම.**

දුක් මහන්සියෙන් උපයන මුදල් වියදම් වන්නට ගත වන්නේ සුළු කාලයකි. එමෙන්ම මුදල් කුමන කාර්යයකට කෙසේ වියදම් වුවා ද යන්නද නොදනී. ඉතිරි කිරීම්වලට හුරු විමෙන් මෙමගින් ආරක්ෂා වීමට පුලුවන. අප උපයන ආදායමට වඩා වියදම අඩු කර ගත් විට ඉතිරි කිරීම් කළ හැකි ය. මසකට වරක් ආදායම් හා වියදම් විශ්ලේෂණය කර ගැනීමට පවුලේ ගිණුම් පොත වැදගත් වේ. මෙමගින් අවශ්‍ය කාර්යයට හා අනවශ්‍ය කාර්යයට මුදල් වැය කරන ලද ආකාරය පිළිබඳව මනා අවබෝධයක් ලබා ගත හැකි ය. මෙමගින් මුදල් නිසි කලමනාකරණය කළ හැකි ය.

**පුමුඛතා හා ඉලක්ක මොනවාදැයි තිරණය කිරිමට නොහැකි වීම**

තම මුල්‍යම ඉලක්ක හා පුමුඛතා හඳුනා නොගනිමින් මුල්‍ය කලමනාකරණයක් සිදු කළ නොහැකි ය. තමාට ඇති අවශ්‍යතා අනුව එක් එක් අංශ වෙත ප්‍රමුඛතා දිය යුතු ය. ආහාර, ආගම, රෙදි පිළි යනාදිය ප්‍රමුඛතාවය අනුව අංක ලබා දී අවශ්‍ය වියදම් කපා හැරීම කළ හැකි ය. මෙම ප්‍රමුඛතා එක් එක් පුද්ගලයාට වෙනස් විය හැකි ය. පසුව කළ යුත්තේ

ලියුම් කවර කිහිපයක් රැගෙන ප්‍රමුඛතා ලැයිස්තුවට අනුව විදුලි බිල, දුරකතන බිල, ජල බිල ආදියට ගෙවිය යුතු මුදල ලියුම් කවර වෙත බහා වෙන් කිරිම කළ හැකි ය. පසුව අතේ ඉතිරි මුදල ඉතිරි කිරිම් කළ හැකිය.

**01. ණයට මුදල් ලබා දීම.**

පරිත්‍යාග වශයෙන් මිස කිසිම කෙනකුට ණය මුදලක් ලබා නොදිය යුතු ය. මෙමගින් ඥාතිත්වයත්, මිත්‍රත්වයත් විනාශ වේ.

**02. අධි විශ්වාසනිය තත්වයට පැමිණිම.**

මුලාා තිරණ ගැනිමේදී ක්ෂණිව නොගත යුතු ය.

**03. විශ්‍රාම ගිය පසුවද කළ යුතු කාර්යයන් පිළිබඳව සැලසුම් නොකිරිම.**

රජයේ රැකියාව සිදු කල අවසන් වු පසුව ගෙවන ලද විශ්‍රාම වැටුපට සරිලන අයුරින් ආහාර පාන, ඇදුම් පැළදුම් සඳහා වැය කරයි. නමුත් හදිසි මොහොතක විපතක් සිදු වුවහොත් ඒ පිළිබඳව සැලකිලිමත් කමක් නොදක්වයි. මේ පිළිබඳව ද සිතා බලා ඉදිරි ආනාගතය ගැන සිතමින් ඉතුරු කිරිම් කිරිම සිදු කළ යුතු ය.

**04. ප්‍රමාණය ඉක්මවා ණය ලබා ගැනීම.**

වර්තමානයේ ලෝක වසංගතයක් බවට ක්‍රෙඩිට් කාඩ් පත් වී ඇත. මෙය භාවිත කිරීම තුළින් අනවශ්‍ය දේ මිලදී ගැනීමට යොමු වේ.

**05. වෙළෙඳපොළට යාමේදී දක්වන දුර්වලතා.**

වෙළෙඳපොළට හා කඩ සාප්පුවලට යාමේදී අවශ්‍ය භාණ්ඩවල ලැයිස්තුවක් රැගෙන යාම අත්‍යවශ්‍ය වේ. මෙමගින් අමතකවීම හා අනවශ්‍ය දේවල් මිලදී ගැනීම ද වැළකේ.

**06. මුදල් පරිහරණය පිළිබඳ නිසි අවධානය යොමු නොකිරීම.**

මෙමගින් විශාල මුදල් ප්‍රමාණයක් නාස්තිවීමකට ලක් වේ.

**07. ඉතිරි කිරීමේ ක්‍රමවත් වැඩපිළිවෙලක් නොමැතිකම.**

හදිසි අනතුරක්, රැකියාව නොමැතිකම, රෝගාතුර වීම්, හදිසි රෝගි තත්වයන්ට ලක්විම යනාදිය කල්තියා දැනගත නොහැකි ය. එසේ වු විට ණයක් ලබා ගැනීමට පෙළඹී අධික පොළි ගෙවිමට සිදු වේ. මෙමගින් පරිපාලනය සහමුලින්ම විනාශ වේ. මෙමගින් ආරක්ෂා වීමට නම් මුදලක් ඉතිරිව ළඟ තබා ගැනීම කළ යුතු ය.

මෙලෙසින් පුද්ගල ඵලදායිතාව වර්ධනය කිරීමට මුලා කලමනාකරණය අත්‍යවශය අංගයකි. එය වැඩි දියුණු කර ගැනීම සඳහා පුරුද්දක් ඇති කර ගත යුතු ය. ඒ පුරුද්ද ඇති කරලීමට උත්සහ දැරිය යුතු ය. හුදෙක්ම ඵලදායිතාවය යනු මිනිස් සිත තුළ ඇතිවන ආකල්පයකි. එය ඊයෙට වඩා අද, අදට වඩා හෙට යමක් කිරිමට ඇති අදිටන හා විශ්වාසය තිබිය යුතු ය. එම නිසා අප නිවැරදි දේ නිවැරදිව ප්‍රථමවර හා සෑමවිටම කිරීමට පුරුදු වීම ඉතා වැදගත් ය.

<u>ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය</u>

- නිවසේ ඵලදායිතාවය - ලාල් ෆෝන්සේකා
- ඵලදායිතා සංකල්පය - සේන තෝරදෙණිය
- ඵලදායිතා සම්පත් - ලාල් ෆෝන්සේකා

අන්තර්ජාලය ඇසුරින්

# 04. රටවල් බංකොලොත් කරන "දූෂණය"හඳුනාගනිමු - එරෙහි වෙමු.....

*කපිල ධර්මප්‍රිය*
*සංවර්ධන නිලධාරී*
*Bsc.Busness Adm. (Special)*

වර්ෂ 2030 වන විට සියලුම ලෝකවාසී මිනිසුන්ගේ සාමය සහ සමෘද්ධිය භුක්ති විඳීම සහතික කිරීම සඳහා වූ විශ්වීය කැඳවීමක් ලෙස 2015 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් "තිරසර සංවර්ධන ඉලක්ක" 17 ක් සම්මත කර ඇත. ශ්‍රී ලංකාවද 2030 වන විට මෙම අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමට බැඳී සිටින අතර, එම අභිමතාර්ථයන් හි 16 වැනි අභිමතාර්ථය තුළ, "සෑම ආකාරයකම දූෂණය සහ අල්ලස" අඩුකිරීමට කටයුතු කළයුතු බවට දක්වා ඇත.

**දූෂණය යනු කුමක්ද?**

දූෂණය යනු තමන්ගේ පුද්ගලික වාසිය සඳහා ව්‍යවස්ථානුකූලව හෝ සමාජ සම්මුතිය මගින් අයෙකුට භාරදී ඇති බලය ඔහු අනිසි ලෙස භාවිතා කිරීමයි. එනම් සිය පෞද්ගලික ලාභ ප්‍රයෝජනය පිණිස හෝ අන්‍යයන්ගේ අහිත පිණිස "බලය හෝ තනතුර" නීතියේ හෝ සම්මුතියේ සඳහන් නොවන ආකාරයට භාවිත කිරීමයි. මෙම තත්ත්වය සමාජයේ හෝ සංවිධාන තුළ ඉහළ ස්ථරයේ සිට පහළ ස්ථරය දක්වා වූ පරාසයක විවිධාකාරයෙන් පැතිරී ඇති අයුරු ප්‍රායෝගිකව දක්නට ඇත.

ඒ අනුව පෙනී යන්නේ **දූෂණය** යන්න සමස්ත ලොව පුරා සමාජයන්ට, ආණ්ඩුවලට සහ පුද්ගලයන්ට බලපාන සංකීර්ණ සහ පැතිරුණු ගැටළුවක් බවයි. මෙය සංවර්ධනයට බාධාකරයි. විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවලට ප්‍රභල බලපෑමක් ඇති කරන සමාජ ගැටළුවක් බවට පත්ව ඇත. මෙමගින් ආර්ථික, සාමාජීය සහ දේශපාලන ප්‍රගතියට බාධා මතු කරයි. දරිද්‍රතාවය උග්‍ර කරන අතර ලොව පුරා මිලියන සංඛ්‍යාත මිනිසුන්ගේ ජීවන තත්ත්වය අඩාල කරයි. මෙය දේශ සීමා රහිත ගෝලීය ගැටළුවක්ව පවතින හෙයින් **දූෂණයට** එරෙහිව සටන් කිරීම සදාචාරාත්මක අවශ්‍යතාවක් වේ.

**දූෂණයේ බහුවිධ පැතිකඩ:**

සර්ව ව්‍යාප්ත තර්ජනයක් බවට පත්ව ඇති **දූෂණයේ** ප්‍රධාන බෙදීම් 03 ක් හඳුනාගත හැකිය.

**සුළු දූෂණය :** කුඩා පරිමාණයෙන් සිදුවන දූෂණ ක්‍රියාවන් සුළු දූෂණය යන ගනයට අයත් වේ. විශේෂයෙන්ම රාජ්‍ය නිලධාරින් සහ මහජනතාව හමුවී රාජ්‍ය සේවාවක් ක්‍රියාත්මක කරවා ගැනීමේදී සිදුවේ. උදා: පොලිස් ස්ථානවල, රාජ්‍ය බලපත්‍ර ලබාගැනීමේ වැනි අවස්ථාවල සිදුවේ.

**මහා දූෂණය :** මේවා රජයේ ඉහළ මට්ටම්වල සිදුවන දූෂණ ක්‍රියාවන් වේ. මේවායින් දේශපාලන, නෛතික සහ ආර්ථික පද්ධති සැලකිය යුතු ලෙස කඩාකප්පල් වන ආකාරයෙන් සිදුවේ. මෙවැනි දූෂණ බහුලව දක්නට ඇත්තේ අත්තනෝමතික හෝ ඒකාධිපති ආණ්ඩු ඇති රටවල මෙන්ම ප්‍රමාණවත් දූෂණ විරෝධී පද්ධතියක් නොමැති රටවලය.

**පද්ධති දූෂණය :** මෙවැනි දූෂණ සිදුවන්නේ මූලික වශයෙන් සංවිධානයක හෝ ක්‍රියාවලියක පවතින දුර්වලතා නිසාය. මෙය පද්ධතිය තුළ දූෂිත ලෙස ක්‍රියාකාරන තනි නිලධාරීන්ගෙන් හෝ නියෝජිතයන් විසින් සිදු කරනු ලබයි.

**දූෂණයේ ස්වරූප.**

**අල්ලස් :** අධිකාරියේ සිටින පුද්ගලයන්ගේ තීරණවලට හෝ ක්‍රියාවන්ට බලපෑම් කිරීමට මුදල්, තෑගි හෝ අනුග්‍රහය පිරිනැමීම මෙන්ම පිළිගැනීමද අල්ලස් යන්නට අයත් වේ.

**වංචා කිරීම :** කෙනෙකුගේ රැකවරණයට පවරා ඇති අරමුදල් හෝ වත්කම් පුද්ගලික ප්‍රයෝජනය සඳහා අනිසි පරිහරණයක් සිදු කිරීම වංචා කිරීමට අයත්වේ.

**ඥාති සංග්‍රහය :** ඔවුන්ගේ සුදුසුකම් පිළිබඳව නොසලකා පත්වීම් හෝ උසස්වීම් ලබාදීමේදී මෙන්ම සැපයුම් සඳහා කොන්ත්‍රාත් ප්‍රධානය කිරීමේදී අධිකාරිය ඇත්තවුන් තම ඥාතීන්ට හෝ සමීප ගජමිතුරන්ට අනුග්‍රාහකත්වය දැක්වීම මෙහිදී සිදුවේ.

**කප්පම් ගැනීම**: මෙහිදී සිදුවන්නේ තර්ජනය, බියගැන්වීම හෝ බලහත්කාරයෙන් වටිනා යමක් ලබා දීමට පුද්ගයන්ට බල කිරීමයි.

**ක්‍රොනිසම් (Cronyism) :** මෙහිදී සිදු වන්නේ කුසලතාවලට වඩා පුද්ගලික සබඳතා මත පදනම්ව පුද්ගලයන් තනතුරුවලට පත් කිරිම හෝ උසස් කිරිමට අනුග්‍රහය දැක්වීමයි.

**මුදල් විශුද්ධිකරණය:** නීත්‍යානුකූල මූලාශ්‍රවලින් පැමිණි බව පෙන්වීමෙන්, නීතිවිරෝධී ලෙස ලබාගත් මුදල්වල මූලාරම්භය වසන් කිරීම මෙහිදී සිදු වේ.

**දූෂණයට හේතු:-**

දූෂණය දේශසීමා නොදත් ගෝලීය ගැටළුවක් වන හෙයින් මෙය පාලනය සඳහා ජාත්‍යන්තර සහයෝගීතාවයද අවශ්‍ය වේ. දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය ( UNLAC) මගින් දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා ජාතීන් අතර සහයෝගීතාවය ප්‍රවර්ධනය කරයි. මෙමගින් 2017 වර්ෂයේදී ගෝලීයව සිදු කරන ලද සමීක්ෂණයක් මඟින් දූෂණයට හේතු ලෙස පහත සඳහන් කරුණු අනාවරණය කර ඇත.

01. පුද්ගල බද්ධව ඇති මුදල් තණ්හාව / ආශාව.
02. ඉහළ මට්ටමේ වෙළෙඳපොළ ඒකාධිකාරය සහ දේශපාලන ඒකාධිකාරය.
03. අඩු මට්ටමේ ප්‍රජතන්ත්‍රවාදය, දුර්වල සිවිල් සහභාගීත්වය සහ අඩු දේශපාලන විනිවිදභාවය.

04. ඉහළ මට්ටමේ නිලධරය හා පරිපාලන ව්‍යුහයේ ඇති අකාර්යක්ෂමතාවය.
05. අඩු මාධ්‍ය නිදහස.
06. අඩු ආර්ථික නිදහස.
07. විශාල වාර්ගික බෙදීම් සහ ඉහළ මට්ටමේ කණ්ඩායම් අනුග්‍රහය.
08. ස්ත්‍රී පුරුෂ අසමානතාවය.
09. දරිද්‍රතාවය.
10. දේශපාලන අස්ථාවරත්වය.
11. දූෂිත අසල්වැසි රටවලින් බෝවීම.
12. අඩු අධ්‍යාපනය.
13. සමාජය කෙරෙහි කැපවීමක් නොමැතිකම.
14. විරැකියාව.
15. දූෂණයට එරෙහිව නිසි ශක්තිමත් ප්‍රතිපත්තියක් නොමැතිකම.
16. සංස්කෘතිය හා සම්මතයන් ( දූෂණය ඉවසන හෝ එය සම්මතයක් ලෙස සලකන සමාජවල දූෂිත ක්‍රියාවන් පවත්වාගෙන යා හැකිය.)
17. පාරදෘෂ්‍යභාවය නොමැතිකම ( රජයේ හෝ ව්‍යාපාරික ගනුදෙනු මහජන පරීක්ෂාවට විවෘත නොවීම මත දූෂණයට පොළඹවන පරිසරයක් ඇතිවිම.)
18. ආර්ථිකයට රජය මැදිහත් විම.
19. ප්‍රතිපත්ති ලිහිල් කිරිම.
20. ඇතැම් කර්මාන්ත නියාමනය කිරිම.

**දූෂණයේ ප්‍රතිවිපාක.**

දූෂණයේ ප්‍රතිවිපාක සමාජමය හා මූල්‍යමය විය හැකිය. නමුත් එය මූල්‍යමය වශයෙන් අවදානමට ලක්වූවන්ට විශාල ලෙස අහිතකර හා ගැඹුරු බලපෑම් ඇති කරමින් පැතිරුණු සමාජ ගැටළුවක් බවට පත් වි ඇත. එය ප්‍රජාතන්ත්‍රවාදයේ පදනමට අහිතකර බලපෑම් එල්ල කරයි. ප්‍රතිඵලය වඩාත් විනාශකාරී හා දුරදිග යන ඒවා විය හැකිය. දූෂණය සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථික වර්ධනයට හා සංවර්ධනයට විශාල අහිතකර බලපෑම් ඇති කර ඇත.

**ආර්ථික ප්‍රතිවිපාක.**

දූෂණයේ ක්ෂණික හා ප්‍රත්‍යක්ෂ බලපෑම වන්නේ සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථිකයට කරනු ලබන අහිතකර බලපෑමය. මෙය සම්පත් වැරදි ලෙස බෙදා හැරිමට හේතු වේ. විදේශ ආයෝජන අධෛර්යමත් කරයි. ආර්ථික වර්ධනය අඩාල කරයි. රාජ්‍ය නිලධාරීන් අල්ලස් ඉල්ලීම හෝ මංකොල්ල කෑමේ යෙදෙන විට රාජ්‍ය සේවා යටිතල පහසුකම් සංවර්ධනයට සහ දිළිඳුකම පිටු දැකීම සඳහා යොදවාගත හැකි සම්පත් /මුදල් පෞද්ගලික සාක්කු වලට හැර වේ. මෙසේ සම්පත් නාස්ති කිරීමෙන් රටකට අත්‍යාවශ්‍ය අංශවල ආයෝජනය කිරිමේ හැකියාව දුර්වල කරන අතර ආර්ථික සංවර්ධනයට බාධා මතු කරයි.

**දුප්පත්කම සහ අසමානතාවය.**

සංවර්ධනය වෙමින් පවතින රටවල දරිද්‍රතාවය හා අසමානතාවය උග්‍ර කිරීමට දූෂණය හේතුවක් වේ. සෞඛ්‍ය සේවා , අධ්‍යාපනය, ආරක්ෂාව, පානීය ජලය, මාර්ග පද්ධතිය වැනි අත්‍යාවශ්‍ය සේවා සැපයීම සඳහා භාවිත කළ යුතු සම්පත් බොහෝ විට දූෂිත ප්‍රභූ පැලැන්තියේ ප්‍රයෝජනය සඳහා හැරවීමක් සිදු වේ. මෙමගින් අවධානයට ලක්විය යුතු ජනගහනයට මූලික අවශ්‍යතාවයන් සඳහා ප්‍රවේශයන් අවහිර කරමින් දරිද්‍රතාවයේ දුෂ්ඨ චක්‍රය නඩත්තු කරගෙන යයි. එමෙන්ම මූලික සේවාවන් ලබා ගැනීමේදී අල්ලස් ඉල්ලීම්වලට මුහුණ දීමට ඇති ඉඩකඩ වැඩිබැවින් දුප්පතුන් අසමානුපාතික ලෙස දූෂණයේ ගොදුරක් බවට පත් වේ.

**විශ්වාසය හා පාලනය බාදනය වීම.**

දූෂණය රාජ්‍ය ආයතන කෙරෙහි ඇති විශ්වාසය පළුදු කරන අතර නීතියේ ආධිපත්‍ය බිඳ දමයි. පුරවැසියන්, තම නායකයින් හා තමන් වෙනුවෙන් සේවය සැපයීමට සිටින රාජ්‍ය නිලධාරීන් දූෂිතයන් ලෙස සලකන විට ඔවුන් සිවිල් ක්‍රියාකාරකම්වල යෙදවීමට, බදු ගෙවීමට හෝ රජයේ මූල පිරීම්වලට සහාය දැක්වීමට ඇති ඉඩකඩ අඩුය. මෙය රාජ්‍ය සහ එහි පුරවැසියන් අතර පවත්නා සමාජ සම්මුති ගිවිසුම දුර්වල කරන අතර රජයන්ට ප්‍රතිපත්ති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමටත් ජනගහනයේ අවශ්‍යතා සපුරාලීම දුෂ්කර කිරීමටත් හේතු වේ.

**විදේශ ආයෝජනවලට බාධා ඇතිවීම.**

විදේශීය ආයෝජකයන් බොහෝ විට දූෂණය ඉහළ මට්ටමක පවතින රටවල ආයෝජනය කිරීමට පසුබට වේ. හේතුව කප්පම් ගැනීම සහ නියාමන බාධකවලට බිය වන අනපේක්ෂිත ව්‍යාපාරික පරිසරයක් දූෂණය විසින් නිර්මාණය කරනු ලැබීමයි. මෙම විදේශ ආයෝජනවල හිඟය ආර්ථික වර්ධනය හා රැකියා උත්පාදනය අඩාල කරයි. බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල් ස්වයං තිරසර ආර්ථික සංවර්ධනයකට වඩා ආධාර මත යැපීමට සිදුව ඇත.

**අධිකරණ පද්ධතිය හෑල්ලුවට ලක්කිරීම.**

විනිසුරුවන්, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් හෝ නීති වෘත්තිකයන් දූෂිත වූ විට මහජන අයිතීන් ආරක්ෂා කිරීමට සහ සාධාරණ නීති පද්ධතියක් සහතික කිරීමට ඇති හැකියාව දුර්වල කරයි. එනම් සම්මුතිවාදී අධිකරණ පද්ධතියක් බිහි කිරීමට දූෂණය හේතු වේ. එමගින් බලවතුවන්ට යුක්තියෙන් ගැලවිය හැකි දණ්ඩ මුක්තියේ වාතාවරණයක් නිර්මාණය කරයි.

**පරිසරය විනාශ වීම.**

දූෂණය මගින් ස්වභාවික සම්පත් අංශය තිරසාර නොවන සූරාකෑමකට ලක් කරයි. අහිතකර ප්‍රතිඵල රැසක් දායාද කරන අතර මහත් වන විනාශයකටද හේතුවිය හැකිය. වන සම්පත් කළමනාකරණයේ විනිවිද භාවය සහ වගවීම නොමැතිවීම පාරිසරික හායනය උග්‍ර කරයි. මෙමගින් ජනගහනයේ සෞඛ්‍ය හා යහපැවැත්ම සඳහා සහ අනාගත පරපුරද දිගුකාලීන අහිතකර ප්‍රතිවිපාක වෙත ඇද දමයි.

**සමාජ නොසන්සුන්තාවය.**

වඩාත් ඉහළ මට්ටමක පවතින දූෂණය හේතුවෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල සමාජ අසහනය හා ගැටුම් ඇතිවීමටද හේතු වේ. පුරවැසියන් තම රජය දූෂිත සහ එයට ප්‍රතිචාර නොදක්වන රජයක් ලෙස සලකන විට ඔවුන්ගේ විරෝධතා හෝ ආන්තික අවස්ථාවන් හිදී සන්නද්ධ කැරැල්ලකට හෝ යොමුවීමේ අවදානමක් ඇති වේ. මෙයින් ඇතිකරනු ලබන අස්ථාවරත්වය ආර්ථික සංවර්ධනය සඳහා වන මානුෂීය උත්සාහයන් තවදුරටත් කඩාකප්පල් කිරීමකට ලක් කරයි.

**දූෂණයට එරෙහිව සටන් කිරීම.**

දේශ සීමාවලින් තොර වූ ද, සර්ව ව්‍යාප්ත වූ ද, සංකීර්ණ සමාජ ගැටළුවක් බවට පත්ව ඇති දූෂණය පිටුදැකීම සඳහා කටයුතු කිරීමේ අත්නොහල යුතු සාමාජීය යුතුකමක්ද පවතී. දූෂණය පිළිබඳ සංකල්පය පිළිබඳ දුරාවබෝධය හා එහි ක්‍රියාකාරීත්වය විවිධ ස්වරූපයන්ගෙන් පැවතීමත් හා දූෂිත හැසිරීම හොඳින් සැඟවී ඇති බැවිනුත් බොහෝ විට එය හඳුනාගැනීමටද නොහැකිය. මේ නිසා එයට එරෙහිව සටන් කිරීමේ නව උපාය මාර්ග ගවේෂණය කිරීමට කාලය එළඹ ඇත.

රටක ආණ්ඩු පක්ෂයක් වඩාත් ආක්‍රමණශීලී සහ ව්‍යාප්ත භූමිකාවක් භාරගන්නා විට රජයේ දූෂණ ක්‍රියාවන්ට හිතකර පරිසරයක් නිර්මාණය කරයි. ආණ්ඩුවේ දූෂණ ක්‍රියාවන් ද ඥාති සංග්‍රය, අල්ලස් ගැනීම, වංචා කිරීම, ගජ මිතුරුකම් මත අනුග්‍රහය දැක්වීම, පවුලේ සාමාජිකයින්ට හා හිතවතුන්ට උසස් තනතුරු හා වරප්‍රසාද ලබා දීම, මැතිවරණ ප්‍රතිඵල වෙනස් කිරීම ආදී දේ තුළ ව්‍යාප්තව ඇත.

මහජනතාව දැනුවත් කිරීම, රට තුළ දූෂණයට එරෙහි ශක්තිමත් පරිසරයක් ඇති කිරීම, ගිණුම්කරණ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම, රෙගුලාසි පැනවීම හා යහපාලනය ක්‍රියාත්මක කිරීම, වාර්තා කිරීමට සහ එම වාර්තා සකස්කරන අයගේ ආරක්ෂාව තහවුරු කිරීමට මාර්ග විවෘත කිරීම වැනි දෑ සිදුකළ හැකිය. දඩ සහ නඩු පැවරීම, දඬුවම් පැමිණවීම, ඇතැම් දූෂණ චෝදනා සඳහා දඬුවම් ක්‍රියාත්මක කිරීමද වැදගත් වේ.

**දූෂණය පාලනයට ගතහැකි ක්‍රියාමාර්ග.**

**විනිවිදභාවය සහ වගවීම:** දූෂණයට ඇති අවස්ථා අවම කිරීම සඳහා විනිවිද පෙනෙන පද්ධති ඇති කිරීම, විවෘත රාජ්‍ය දත්ත සහ සඵලදායී අධීක්ෂණය මෙහිදී වැදගත් වේ.

**ශක්තිමත් කරන ආයතන:** දූෂණයට එරෙහිවීමත්, වැළැක්වීමත් සඳහා අවශ්‍ය ඵලදායී නීතිය බලාත්මක කරන ව්‍යුහය සමග ශක්තිමත් නීතිමය සහ නියාමන ආයතනවල ධාරිතාවය වර්ධනය කිරීම අවශ්‍ය වේ.

**මහජන දැනුවත් කිරීම්:** දූෂණය හා එහි ප්‍රතිවිපාක පිළිබඳවත්, දූෂණ ක්‍රියා වාර්තා කිරීමට බලගැන්වීම, දූෂණයට එරෙහිව කටයුතු කිරීමට ඇති සදාචාරාත්මක හා සාමූහික අයිතිය පිළිබඳ දැනුවත් කිරීම් යෝග්‍ය වේ.

**ආරක්ෂාව:** දූෂණය හෙළිදරව් කරන පුද්ගලයන් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය නීති සහ යාන්ත්‍රණය සකස්කිරීම හා ඒවායේ ශක්තිමත් ස්වාධීන පැවැත්ම තහවුරු කිරීම අවශ්‍ය වේ.

**ජාත්‍යන්තර සහයෝගීතාවය:** දූෂණයට දේශසීමා රහිත වන හෙයින් සහ මුදල් විශුද්ධිකරණයට එරෙහිව සටන් කිරීමට වෙනත් රටවල් සමග සහයෝගයෙන් කටයුතු කිරීමට අවශ්‍ය ව්‍යුහයන් සකස් කිරීම.

**තාක්ෂණය:** බ්ලොක්චේන්/ ඩිජිටල් වේදිකා වැනි තාක්ෂණයේ දියුණුව විවිධ අංශවල විනිවිද භාවය වැඩි කිරීමටත් සහ දූෂණ අවදානම් අවම කිරීමටත් යොදාගත හැකි වේ.

**ලෝක දූෂණ දර්ශකය හා සංවර්ධනය**

ලෝක දූෂණ දර්ශකය අනුව ලොව රටවල් පෙළගැස්වූ විට සංවර්ධිත රටවල්වල දූෂණය ඉතා අඩු මට්ටමක පවතී. එයින් පෙනී යන්නේ දූෂණය හා සංවර්ධනය අතර ඍනාත්මක සහසම්බන්ධතාවයක් පවතින බවයි.

| අ.අ. | දූෂණය අඩුම රටවල් | දූෂණය වැඩිම රටවල් |
|---|---|---|
| 01 | ඩෙන්මාර්කය | සෝමාලියාව |
| 02 | නවසීලන්තය | දකුණු සුඩානය |
| 03 | ෆින්ලන්තය | සිරියාව |
| 04 | නෝර්වේ | වෙනිසියුලාව |
| 05 | සිංගප්පූරුව | යේමනනය |
| 06 | ස්වීඩනය | බුරුන්ඩි |
| 07 | නෙදර්ලන්තය | ගිනියාව |
| 08 | ජර්මනිය | උතුරු කොරියාව |
| 09 | ලක්සම්බර්ග් | හයිටි |
| 10 | අයර්ලන්තය | ලිබියාව |

ලෝක දූෂණ දර්ශකයේ අමෙරිකා එක්සත්ජනපදය 24 වෙනි ස්ථානයේද, චීනය 65 වන ස්ථානයේද, ඉන්දියාව 85 වන ස්ථානයේද, පසුවන අතර ශ්‍රී ලංකාව 101 වන ස්ථානයේ පසු වේ.

දූෂණය යනු බහුවිධ විසඳුම් අවශ්‍ය ගෝලීයව පවත්නා සංකීර්ණ ගැලුවකි. එය සමාජ ඒකාබද්ධතාවයට, ආර්ථික සංවර්ධනයට, සහ ප්‍රජාතන්ත්‍රවාදයේ පදනමට හානි කරයි. මේවායේ ප්‍රතිඵලය ඉතා අනර්ථකාරී ය. මෙම උවදුරට එරෙහිව සටන් කිරීමට පුද්ගලයන් ප්‍රජාවන් සහ ජාතීන් එකතුවීම අත්‍යාවශ්‍ය වන අතර යුක්තිය, සාධාරණය අඛණ්ඩතාවය පවතින ආත්මාර්ථයෙන් තොර සුභවාදී අනාගතයක් ගොඩනැගීම වෙනුවෙන් එය වැදගත් වනු ඇත. දූෂණයට එරෙහි සටන දිගු හා අභියෝගාත්මක එකක් වන නමුත් ඊට සාමූහික උත්සාහයන්ගෙන් විනිවිද භාවයෙන් හා වගවීමෙන් කටයුතු කිරීමෙන් දූෂණයේ විලංගුවලින් තොර වඩාත් සාධාරණ ලෝකයක් උදෙසා අපට වැඩකළ හැකිය. තම ප්‍රජාව තුළ හා ඉන් ඔබ්බට දූෂණයට එරෙහිව සටන් කිරීමට ඔවුන්ට කළ හැකි කාර්යය පිළිබඳව විවේචනාත්මකව සිතීමට මිනිසුන් දිරිමත් කළ යුතු වේ.

# 05. ග්‍රාමසංවර්ධනය යනු භෞතික දියුණුව පමණක් ද?

*පී.බී.ඩී.වැත්තෑව*
*සංවර්ධන නිළධාරි*
*Bsc. (Busness Admin)*

ගමක් සංවර්ධනය කිරිමේදී එහි භෞතික දියුණුව වැදගත් සාධකයක් වේ. නමුත් එම දියුණුව පමණක් සංවර්ධන යැයි සිතීම එතරම් උචිත නොවේ. ගමක් සංවර්ධනය වන්නේ රජයේ ආධාර මත පමණක් යැයි සිතා සිටින ග්‍රාමීය ජනතාවක් සිටින රටක දේශපාලකයින් බලය අනිසි ලෙස යොදා ගනී. රටක සංවර්ධනය කිරීමට මධ්‍යම රජයට පමණක් හැකිද? ඔවුන්ට ඒ සඳහා ප්‍රමාණවත් පමණින් මුදල් තිබෙනවාද?

අපේ රටේ සංවර්ධනය යැයි සිතා සිටින්නේ පාරක් සෑදිම, ගොඩනැගිලක් සෑදිම හෝ භෞතිකව යමක් සෑදිම පමණි. නමුත් එවා කොතරම් ඵලදායි ලෙස ආර්ථිකයට අගයක් එකතු කරන්නේද ? ගම සංවර්ධනය කිරිමේ පළමු පියවර වන්නේ පුද්ගල සංවර්ධනයයි. පුද්ගල සංවර්ධනයෙන් තොර ග්‍රාම සංවර්ධනයක් නැත. පුද්ගලයා දැනුම, ආකල්ප හා කුසලතාවලින් වර්ධනය වන්නේ නම් ඔහුගේ වෘත්තිය ජිවිතය සාර්ථක වේ. එමෙන්ම ඔහුගේ පෞද්ගලික ජිවිතය හා සමාජ ජිවිතයද සාර්ථක වේ. සංවර්ධනයේ ඉතාම වැදගත්ම සාධකයක් ලෙස අධ්‍යාපනය සැලකිය හැක. අධ්‍යාපනය ද කොටස් දෙකකට වර්ග කළ හැක.

1. විධිමත් අධ්‍යාපනය.
2. අවිධිමත් අධ්‍යාපනය.

විධිමත් අධ්‍යාපනය යනු පුද්ගලයකු විධිමත් ක්‍රමවේදයක් යොදා ගනිමින් කරනු ලබන අධ්‍යාපන ක්‍රියාවලියයි. උදා - පාසල් අධ්‍යාපනය, දහම් පාසල් අධ්‍යාපනය, විශ්ව විද්‍යාල අධ්‍යාපනය.

අවිධිමත් අධ්‍යාපනය යනුවෙන් අදහස් කරනු ලබන්නේ පුදගල දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය කර ගැනීම සඳහා විධිමත් අධ්‍යාපනයට අදාළ නොවන අන් සියළු දේය. බෝහෝවිට අත්දැකිම්වලින් ලබන අධ්‍යාපනය අවිධිමත් අධ්‍යාපනයකි. නමුත් එය පුද්ගල සාර්ථකත්වයට බොහෝ උපකාරී වේ. එසේම පුද්ගලයාගේ දියුණුව විධිමත් අධ්‍යාපනය තුළින් පමණක් මැනීම සාධාරණ නොවේ. අධ්‍යාපනය තුළ වරක් අසාර්ථක වන පුද්ගලයා තවත් වරෙක සාර්ථක විය හැකි ය. එසේම අධ්‍යාපනය වැදගත් වන්නේ එය ජිවිතයට ප්‍රයෝගිකව ගලපා ගත හැකි නම් පමණි. නැතහොත් ඒවා භෞතික සහතිකවලට පමණක් සිමා වේ. එසේම රටක සංවර්ධනයට, පුද්ගල සංවර්ධනයට, පවුල් සංවර්ධනයට ඉතා වැදගත්ම සාධකයක් ලෙස විධිමත්, අවිධිමත් අධ්‍යාපනය දැක්විය හැකි ය.

සංවර්ධනයේදී මුදල් කියන සාධකය ඉතා වැදගත් සාධකයක් වුවත් ග්‍රාමීය ජනතාව මුදල් පිළිබඳව දරණ මතය සංවර්ධනයට බාධාවකි. මුදල් නොමැතිව බොහෝ කාර්යයන් කිරිමට නොහැකි තත්වයන් තිබුනත් ගම්වල මිනිසුන් තම ආර්ථිකය වර්ධනය කිරිමට නොසිත යි. ඔවුන් සෑම විටම අඩු වැටුපකට තම ශ්‍රමය අලෙවි කරයි. ඔවුන්

තමාගේ එදිනෙදා ජීවිතය ගත කිරීමට පමණක් ශ්‍රමය අලෙවි කරයි. ඔවුන් සිතන්නේ තමාගේ එදිනෙදා ජීවිතය ගත කිරීමට පමණක් මුදල් තිබුනොත් ඇති යන මානසිකත්වයෙන් ය.

ඔවුන් ඉතිරි කිරීමක් සිදු නොකරයි. මුදල් ඇති අය විචේචනය කරයි. එය මගින් ඔවුන් සිතන්නේ මුදල් ඔවුන්ගේ සතුරෙක් ලෙස ය. එසේම මුදල් තමාගේ අවශ්‍යතාවලට නොමැති වූ විට ඔවුන් සියල්ල කර්මයට භාර දී මිත්‍යා මත පදනම් කරගනිමින් තීරණ ගනී. ඔවුනගේ ණය ලබා ගැනීමේ පුරුද්දක් තිබුණත් වේලාවට ණය ගෙවීමේ පුරුද්දක් නැත. සීමිත කාලයක් තුළ වැඩ කරන ජනතාවගේ ශ්‍රමය විවිධ පුද්ගලයින් සූරා කනු ලබන අතර එය ඔවුන්ට ප්‍රශ්නයක් ලෙස දැකීමට පවා නොහැක. ඔවුන් යම් මුදලක් හදිසියට ගැනීම සඳහා ඉතිරි කළත් ආයෝජනය පිළිබඳව ඔවුන්ට නිවැරදි අදහසක් නැත. එම නිසා රජයේ රැකියා කරන පිරිසට හැර අන් පිරිසට විශ්‍රාම ගිය පසුව යැපෙන්නන් ලෙස ජීවත් වීමට සිදුව ඇත. බොහෝ ග්‍රාමීය ජනතාවට ව්‍යාපාර පිළිබඳව ඇත්තේ අඩු දැනුමක් වන අතර ඔවුන් සිදුකරනු ලබන ව්‍යාපරද ඉතා ප්‍රාථමික මට්ටමේ ව්‍යාපරයන් වේ. එය තුළින් ජනනය වන ආදායම ඉතා කුඩා ආදායමක් වේ. මෙය සංවර්ධනයට බාධාවක් වේ. එසේම ග්‍රාමීය ප්‍රජාව වෙළෙඳපොළ අවස්ථාවන් ගැන සංවෙදී නැත. එම නිසා ඔවුන්ට දියුණුවීමට ඇති අවස්ථාවන් බොහෝමයක් මඟහැරෙනු ඇත. එසේම ඔවුන් බොහෝ දෙනා කෘෂිකර්මික ආර්ථිකයකට හුරුවී තිබුණත් ඔවුන්ගේ නිෂ්පාදන තුළින් වැඩි ලාභයක් ගන්නේ අතර මැදියන්ය. ඔවුන් තම නිෂ්පාදනය අඩු මිලකට අලෙවි කිරීම තුළින් සෑහීමකට පත්වේ. එසේ අලෙවිකරන එළවලු , පළතුරු, ධාන්‍ය බොහෝ විට නිසි ප්‍රමිතියකින් තොරව ඇසුරුම් කිරිම නිසා නාස්ති වි යයි. ඒ තුළින් ජාතික ආර්ථිකයට විශාල බලපෑමක් සිදුවේ. කෘෂිකාර්මික කටයුතු වලදී අධික මිලක් යොදා කෘමිනාශක යොදයි. එය සෞඛ්‍යට අහිතකර මෙන්ම ගොවියන්ගේ ආර්ථිකයට අහිතකර ඒවා වේ. බොහෝවිට ග්‍රාමීය ජනතාව තමාගේ ශුද්ධ ලාභය ගැන නොසිතා කටයුතු කරනු ලබයි.

රටක සංවර්ධනයට වැදගත් සාධකයක් ලෙස සමගිය දැක්විය හැක. කුමන භෞතික සම්පත් තිබුණත් සමගිය නැත්නම් එම සමාජය සංවර්ධිත සමාජයක් ලෙස නම් කල නොහැක. සමාජයේ සිටින පුද්ගලයින් සියලු දෙනා සුවිශේෂි අය වේ. ඔවුන්ට ගරු කරගැනිම හා සහයෝගයෙන් වැඩ කිරිම ඕනෑම ගමක සංවර්ධනයට ප්‍රධාන හේතුවකි. ගමක් දේශපාලන, ආර්ථික, ආගමික, කුල හා විවිධ නිර්ණායක ඔස්සේ බෙදි තිබිම මගින් ගමේ සංවර්ධන කටයුතුවලට මෙන්ම ගමේ සමගියටත් බාධාවකි. ඕනෑම රටක සංවර්ධනයට බලපාන ප්‍රධාන සාධකයක් ලෙස පුද්ගලයින්ට, පවුලට, සමාජයට, රටට අරමුණක් තිබීම දැකිය හැකි ය. අරමුණක් නොමැති රටකට කුමන සම්පත් තිබුණ ද දියුණු විය නොහැකි ය. රටක සංවර්ධනයක් සඳහා පුද්ගලයින්ගේ දියුණුව අවශ්‍යම සාධකයක් වේ. පුද්ගලයන්ට අරමුණක් නොමැති විට ඔවුන්ගේ ශ්‍රමය, මුදල්, කාලය යන සියල්ල නාස්ති වී යාමට අරමුණක් නැති බව හේතු වේ. එමෙන්ම තිබෙන අරමුණ යහපත්, නිශ්චිත, මැනිය හැකි, අදාළ, කාලරාමුවක් තුළ ඉටු කර ගත හැකි අරමුණක් වීම ඉතා වැදගත් වේ. පුද්ගලයාට මෙන්ම ඔහුගේ පවුලට, ආයතනයට, සමාජයට මෙන්ම රටට ද අරමුණක් තිබීම ඉතා වැදගත් වේ.

පුද්ගල සංවර්ධනයේදී ආකල්ප සංවර්ධනය ඉතා වැදගත් අංශයකි. යහපත් ආකල්පයන් ඇති පුද්ගලයන් සමාජයට ඵලදායි වේ. සමාජයට හිතකර යහපත් පුද්ගලයෙකු බිහි වීමට යහපත් ධනාත්මක ආකල්ප වැදගත් වේ. සමාජ වෙනසක් ඇති කිරිමට නම් ධනාත්මක ආකල්ප සහිත පුද්ගලයින් සිටිය යුතු ය.

සංවර්ධනය සඳහා ධනාත්මක යහපත් ආකල්ප නොමැති නම් එම ගම මෙන්ම රට ද සංවර්ධනය නොවේ. ධනාත්මක ආකල්ප ඇති පුද්ගලයින් බාහිර බාධක හමුවේ නොසැලේ. එම නිසා අරමුණු ජය ගැනීමට එය ප්‍රධාන සාධකයක් වේ.

රටක සංවර්ධනයේදී පුද්ගලයාගේ සෞඛ්‍ය තත්වය ඉතා වැදගත් සාධකයක් වේ. නොමිලේ සෞඛ්‍ය පහසුකම් ඇති රටක් නිසා රටේ ජනතාවගේ සෞඛ්‍ය තත්වය පිරිහීම රටේ ආර්ථිකයට ප්‍රධාන වශයෙන්ම බලපායි. එමෙන්ම රටේ ශ්‍රම බලකාය නිසි සෞඛ්‍ය මට්ටමක නොසිටිම නිසා ඔවුන්ගේ ඵලදායිතාවය මෙන්ම කාර්යක්ෂමතාවය බිඳ වැටිම රටේ සංවර්ධනයට බලපායි. එයින් නිෂ්පාදනය අඩු වේ. එම නිසා ආදායම් අඩු වේ. ආදායම අඩුවූවිට ඉතිරි කිරීම් අඩු වේ. ඉතිරි කිරීම් අඩු වූ විට ආයෝජන අඩු වේ. ආයෝජන අඩු නම් නිෂ්පාදනය ද අඩු වේ. පුද්ගලයන්ගේ දියුණුවට මෙන්ම සමාජයේ දියුණුවට පුද්ගලයා සතු විශ්වාස බලපායි. ප්‍රධාන වශයෙන්ම ආගමික විශ්වාස හා අනෙකුත් විශ්වාස නිසා පුද්ගලයා ගමන් කරන දිශා ආනතිය තිරණය වේ. එම නිසා යහපත් ධනාත්මක විශ්වාස පැවතීම රටක ජනතාවට ඉතා වැදගත් ය. රටක ජනතාවගේ දියුණුව ගැන යහපත් ධනාත්මක විශ්වාස ඇතුව කටයුතු කරයි නම් එම රට ඉතා ඉක්මනින් දියුණු කළ හැකි වේ. උදා - ජපානය, යුද්ධයකින් පසුව සියල්ල විනාශ වූ රටක් ලෙස ඉතිරි වූ ජපානය ඉතා කෙටි කාලයක් තුළ ලොව බලවත් රටක් බවට පත් වූයේ එම රටේ මිනිසුන් තුළ පැවති ධනාත්මන යහපත් ශක්තිමත් විස්වාස නිසා ය. ඒවා ප්‍රවර්ධනය කිරිමට එම රටේ නායකයින් මෙන්ම ආගමික ආයතනද දැවැන්ත මෙහෙයක් ඉටු කරන ලදී.

සමහර ගම්වල සංවර්ධන යෝජනා ලෙස එන්නේ ඵලදායිතාවයෙන් අඩු යෝජනාවන් වන අතර සමහරක් ඒවා කෙටි කාලයක් තුළ අසාර්ථක යෝජනා ය. සමහර යෝජනා ඉදිරිපත් කරනු ලබන්නේ තම තමාගේ පෞද්ගලික අපෙක්ෂාවන් ඉටු කර ගැනිම සඳහා ය. එම නිසා ගමක ප්‍රධාන වශයෙන්ම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමට හා යෝජනා ඉදිරිපත් කිරීමට විධිමත් දූරදර්ශි නායකත්වයක් අවශ්‍ය වේ. දූරදර්ශි හා යහපත් නායකත්වයක් නැති තැන පුද්ගල එකමුතුවක් නිර්මාණය වන්නේ ද නැත. එසේම නායකත්වයක් නොමැති නම් නිශ්චිත වැඩක් ආරම්භ කිරිමට නොහැකි වේ. භෞතික සම්පත් අර්ථවත් හා ඵලදායි කටයුත්තක යොදා ගැනීමට නම් නිවැරදි නායකත්වයක් අත්‍යවශ්‍යය වේ. දූෂණය හා නාස්තිය අවම නොකර ගනිමින් සංවර්ධනය සිදු කළහොත් එය අනාගතයට සුදුසු සංවර්ධනයන් නොවනු ඇත. දූෂිත පුද්ගලයින්ට නිසි දඬුවම් දීමක් අකාර්යක්ෂම පුද්ගලයින් බලය සහිත කටයුතු වලින් බැහැර කිරිම රටක සංවර්ධනය සඳහා අවශ්‍යම සාධකයක් වේ.

රටේ නීතිය කාලයට ගැළපෙන ලෙස වෙනස් නොවීමත් සංවර්ධනයට ඇති බාධකයකි. වසර ගණනාවකට පෙර තිබූ නීති රාමුව යටතේ වර්තමාන සංවර්ධන කටයුතු සිදු කිරිම ඉතා අපහසු හා බාධාකාරි කටයුත්තක් වේ. තවම අපේ අධිකරණ පද්ධතිය පෙර පැවති තත්වයන්ටම අදාළව කටයුතු කිරිම තුළින් සංවර්ධන ව්‍යාපෘති ප්‍රමාද වීම දැකිය හැකි ය. මේ අනුව සලකා බැලිමේදී රටක සංවර්ධනයට මෙන්ම ගමක සංවර්ධනය සඳහා ආර්ථික, සමාජ, දේශපාලන, පරිසර, තාක්ෂණ සාධකවල දියුණුව ඉතා වැදගත් වේ. එම දියුණුව සමහර අවස්ථාවලදී භෞතිකව දැකිය හැකි නමුත් සමහර අවස්ථාවලදී භෞතිකව නොපෙනේ. භෞතික දියුණුව පමණක් ගමේ දියුණුව ලෙස දැකිය නොහැකි ය. එසේම ගමක් දියුණුවීමට නම් පවුල දියුණු විය යුතු වේ. පවුල දියුණුවීමට නම් පුද්ගලයා දියුණු විය යුතු ය. එම නිසා ග්‍රාමසංවර්ධනයේ ප්‍රධානම කාර්යභාරයක් වන්නේ පුද්ගල සංවර්ධනය යි.

# 06. සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන සැලසුම්.

කේ. එම්.ජී.සමරසේන
පුහුණු හා පර්යේෂණ නිලධාරි
Bcom. (Special)

සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය යටතේ සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂයේ අයවැය යෝජනාවකට අනුව "සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන" ආරම්භ කරන ලදී. මෙහි ප්‍රතිලාභීන් ලෙස සමෘද්ධිලාභීන්, අඩු ආදායම්ලාභීන් සහ මෙම කාණ්ඩ දෙකට නොවැටෙන සවිබල ගැන්වීමට සුදුසු ප්‍රජාව හඳුනා ගන්නා ලදී. ගම්මාන පිළිබඳව ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ මැදිහත්වීම මත 2023 වර්ෂයේ මුල් කාර්තුවේ දී තත්ත්ව අධ්‍යයනයක් සිදු කෙරුණි. එහිදී හඳුනාගත් පොදු නිගමනය වූයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යපෘතිය යම් යම් ජයග්‍රහණ අත්කරගෙන තිබුණ ද අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සාධනීය මට්ටමක නොමැති බවයි. මෙහිදී පුද්ගලයා, පවුල, ප්‍රජා කණ්ඩායම ආර්ථික වශයෙන් සවිබලගැන්වීම මගින් පමණක් ප්‍රජාව බලගැන්වීම සිදු නොවන අතර සාමාජික වශයෙන්, දේශපාලන වශයෙන්, කායික වශයෙන්, මානසික වශයෙන් නීතිමය වශයෙන්, පාරිසරික අංශ ඔස්සේ බලගැන්වීමට අවධානය යොමු විය යුතුයි. ඒ සඳහා මතු සඳහන් සැලසුම් ප්‍රජාපාදකව සකස්කර ක්‍රියාත්මක කිරීම සුදුසු වේ.

**සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන සැලසුම්.**

1. සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ගෘහ ඒකක සංවර්ධන සැලැස්ම.
2. සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන සංවර්ධන සැලැස්ම.

**සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ගෘහ ඒකක සංවර්ධන සැලැස්ම.**

සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන සඳහා ගෘහ ඒකක සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට යෝජනා කරන අතර එය අනාගත වර්ෂයක කාලයක් සඳහා සුදුසු වේ. එහිදි ක්ෂේත්‍ර මැදිහත්කරු විසින් එක් එක් පවුලට බලපාන ගැටලු වෙන වෙනම හඳුනාගත යුතු අතර ඒ සඳහා ශද්‍රඅත විශ්ලේෂණය හෝ ගැටලු ගස විග්‍රහය මගින් හඳුනාගත් ගැටලු විග්‍රහ කළ යුතුය. ප්‍රමුඛ ගැටලුවේ සිට අනුක්‍රමයෙන් ගැටලු විග්‍රහකර ගත යුතුය. ඒ තුළින් එම ගැටලු විසඳා ගැනීමට ඇති සංවර්ධන විභවතා ප්‍රජාව සමග හඳුනා ගැනීමට මැදිහත්කරුට හැකිය. මෙම පියවරේදී එක් එක් පවුලේ ගැටලු සඳහා විසඳුම් වෙන වෙනම හඳුනාගත යුතුය. ඒ අනුව විසඳුම් වැඩසටහන් සඳහා සැලසුම් සකස්කළ යුතුය.

මෙහිදී පුද්ගලයා, පවුල, ප්‍රජා කණ්ඩායම ආර්ථික වශයෙන්, සාමාජීය වශයෙන්, දේශපාලන වශයෙන්, කායික වශයෙන්, මානසික වශයෙන්, නීතිමය වශයෙන්, පාරිසරික වශයෙන්, බලගැන්වීම සඳහා මතු සඳහන් අංශ ඔස්සේ ගෘහ ඒකක කළමනාකරණ සැලසුම් සකස් විය යුතුය. එක් එක් පවුලේ ගැටලුවල ස්වභාවය අනුව එක් එක්

පවුල සඳහා පහත සඳහන් අංශ අතරින් කිහිපයක් හෝ සියල්ලම ආවරණය වන පරිදි ගෘහ ඒකක සංවර්ධන සැලැසුම් සකස් කිරීමත් ක්‍රියාත්මක කිරීමත් අවශ්‍ය වේ. ඒ අනුව අංශ 10 සඳහා සැලසුම් 10 ක් සකස්කළ යුතුයි.

**ගෘහයේ කළමනාකරණය කළයුතු අංශ**

1. නිවස කළමනාකරණය
2. .මුළුතැන්ගේ කළමනාකරණය
3. ගෙවත්ත කළමනාකරණය
4. සෞඛ්‍ය හා පෝෂණය
5. අධ්‍යාපන කටයුතු
6. සිරිත් විරිත් හා ආගමික කටයුතු
7. ආදායම් වියදම් කළමනාකරණය
8. විවේකය හා විනෝදාස්වාදය
9. සහජීවනය
10. රැකවරණය හා ආරක්ෂාව

**සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන සංවර්ධන සැලැස්ම.**

සෞභාග්‍යා නිෂ්පාදන ගම්මානයේ පවුල් ඒකක සඳහා සකස් කළ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ගෘහ ඒකක සංවර්ධන සැලැසුම්වල එකතුවක් ලෙස සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන සංවර්ධන සැලැස්ම සකස් වේ. තවත් ආකාරයකට ප්‍රකාශ කළහොත් එය ගෘහ ඒකක සංවර්ධන සැලැසුම්වල සාරාංශයක් ලෙස සකස් වේ.

. (ඇමුණුම -01)

**ආදර්ශ ගෘහ ඒකක සංවර්ධන සැලැස්ම**

. **<u>සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන</u>**

**<u>ගෘහ ඒකක සංවර්ධන සැලැස්ම - 2023</u>**

ගෘහ මූලිකයාගේ නම:-...................................................

පවුලේ සාමාජික සංඛ්‍යාව:-............................................

ග්‍රාම නිලධාරි වසම :-................................................

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:-....................................

අංශය:-. නිවස/ මුළුතැන්ගේ/ ගෙවත්ත/ සෞඛ්‍ය හා පෝෂණය/ අධ්‍යාපන කටයුතු/ සිරිත් විරිත් හා ආගමික කටයුතු/ ආදායම් වියදම් කළමනාකරණය/ විවේකය හා විනෝදාස්වාදය/ සහජීවනය/ රැකවරණය හා ආරක්ෂාව

අපේක්ෂිත අරමුණ:-...........................................................................................................................

(උදා; ...........................ගේ පවුලේ ආදායම....................... කින් ඉහළ නංවා ගැනීම)

| හඳුනාගත් ගැටලුව | ගැටලුව ට හේතු | විසඳුම (වැඩසටහන) | විසඳුම් ක්‍රියාකාර කම් | ඉලක්කය/ ප්‍රමාණය | නිම කිරීමට අපේක්ෂිත කාලය | වගකීම | සම්පත් (භෞතික / මානව/ මූල්‍ය) | පසු විපරම/ ඇගයීම |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |

(ඇමුණුම -02)

<u>සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන</u>

<u>ආංශික සහ ගම්මාන සංවර්ධන සැලැස්ම - 2023</u>

ග්‍රාම නිලධාරි වසම:-

මුළු පවුල් ගණන:-..........................................................................................

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:-.......................................................................

අංශය:-...................................................

අපේක්ෂිත අරමුණ.............................................................................................

| හඳුනාගත් ගැටලුව | විසඳුම (වැඩසටහන) | ඉලක්කය | | අවශ්‍ය සහාය සේවා සම්පත් | නිම කිරීමට අපේක්ෂිත කාලය | මිණුම් දර්ශක |
|---|---|---|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය | | | |
| | | | | | | |

ඉහත සැලැසුම් සකස් කිරීම පිළිබඳ දැනුම ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය සතුව පවතින හෙයින් අවශ්‍ය පිරිස් ඒ සඳහා ඉල්ලුම් කළයුතු බව අවධාරණය කරමි.

# 07. පර්යේෂණ වාර්තාවක් සකස් කරන ආකාරය.

පී.ඒ.චිත්‍රා ජයසිංහ
පුහුණු හා පර්යේෂණ නිලධාරි
*M.A. (Sociology)*

**පර්යේෂණය යනු**

දැනුමේ ප්‍රමාණය වැඩි දියුණුකර ගැනීමට ක්‍රමානුකූලව සිදු කරනු ලබන නිර්මාණාත්මක කාර්යයකි. මිනිසාගේ දැනුම, සංස්කෘතිය සහ සමාජය, නව භාවිතයන් සොයා ගැනීමට මෙම දැනුම යොදා ගන්නා අයුරු පර්යේෂණයක අඩංගු වේ. එය තොරතුරු පිහිටුවන්නට සහ තහවුරු කරන්නට, පෙර කාර්යන්හි ප්‍රතිඵල යළි ගොඩ නගන්නට, නව හෝ පවතින ගැටලු නිරාකරණය කිරීමට, සිද්ධාන්තවලට සහාය දැක්වීම හෝ නව න්‍යායන් ගොඩනැගීමට යොදා ගනියි. පර්යේෂණය ව්‍යාපෘතියක, ක්ෂේත්‍රයක හෝ පසුගිය කාර්යක විකාශනයක් වන්නටද පුලුවන. මෙවලම්වල, ක්‍රියාපටිපාටිවල හෝ පරීක්ෂණවල වලංගුතාවය පරීක්ෂා කිරීමට පෙර ව්‍යාපෘතිවල අංගයන් හෝ සමස්ත ව්‍යාපෘතියම පර්යේෂණය මගින් නැවත පිටපත් කරයි. මූලික පර්යේෂණයක ප්‍රධාන අරමුණු වනුයේ (ව්‍යවහාරික පර්යේෂණයට ප්‍රතිවාදීව) ලේඛණගත කිරීම, අනාවරණය කර ගැනීම, අර්ථකථනය හෝ මිනිස් දැනුම වැඩි දියුණු කිරීම සඳහා පර්යේෂණ සහ සංවර්ධන ක්‍රම සහ පද්ධති යොදා ගැනීමයි. පර්යේෂණයට අදාළ ප්‍රවේශයන්, මනුෂ්‍යත්වය සහ විද්‍යාව යන දෙකම සහ දෙක අතර සැලකිය යුතු ලෙස දෝලනය වන ඥාන විභාගයන් මත පදනම් වේ. පර්යේෂණයන්හි විවිධ ස්වරූපයන් වේ. විද්‍යාත්මක, මානව ශාස්ත්‍ර, කලාත්මක, ආර්ථික, සමාජයීය, ව්‍යාපාර, අලෙවිකරණ පර්යේෂණ, වෘත්තික පර්යේෂණ ආදියයි. Research(පර්යේෂණ) යන වචනය ආරම්භ වී ඇත්තේ මධ්‍යම ප්‍රංශයේ "recherche" යන්නෙනි, එහි තේරුම වනුයේ "සොයන්නට යනවා"යි, එම වචනය ඉපදී ඇත්තේ පැරණි ප්‍රංශ "recercher" යන්නෙනි, එය "re-" + "cerchier", හෝ "sercher", යන "සොයනවා" නම් වූ අර්ථය සහිතව එක් වී නිර්මාණය වී ඇත.

**පර්යේෂණ සම්බන්ධ නිර්වචන.**

පර්යේෂණය යන්නෙන් විවිධ ආකාරයට අර්ථ දැක්විය හැක. පර්යේෂණය පිළිබඳ පුළුල් නිර්වචනයක් ලබා දුන්නේ මාර්ටින් ශට්ල්වර්ත් විසිනි. "වචනයේ පුළුල්ම අර්ථයෙන්, දැනුම වැඩි දියුණු කිරීමට සිදු කරන ඕනෑම දත්ත, තොරතුරු සහ සිද්ධි එකතු කිරීමක් පර්යේෂණයේ නිර්වචනයට අඩංගු වේ".

පර්යේෂණය පිළිබඳ අනිත් නිර්වචනය ඉදිරිපත් කර ඇත්තේ ක්‍රෙස්වෙල් විසිනි. "පර්යේෂණය යනු මාතෘකාවක් හෝ ගැටළුවක් සම්බන්ධව ඇති අපගේ අවබෝධය වැඩි කිරීමට අවශ්‍ය තොරතුරු එකතු කිරීම සහ විශ්ලේෂණය කිරීමේ ක්‍රියාවලිය සිදුකරන පියවරයන් වේ. " එයට පියවර තුනක් අඩංගු වේ. ප්‍රශ්නයක් මතු කිරීම, ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට අවශ්‍යම දත්ත එකතු කිරීම, සහ ප්‍රශ්නයට පිළිතුරක් ඉදිරිපත් කිරීම යන්නය.

Merriam-Webster මාර්ගගත ශබ්දකෝෂයට අනුව පර්යේෂණය යන්නෙහි සවිස්තර නිර්වචනය වනුයේ "උත්සාහවත් විමර්ශනයක් හෝ විභාගයක් විශේෂයෙන්ම සිද්ධි සොයා ගැනීම සහ පරිවර්තනය අරමුණු කරගෙන සිදු කරන විමර්ශනයක් හෝ සමීක්ෂණයක්, පිළිගත් සිද්ධාන්ත පුනරීක්ෂණය හෝ අලුත් කරණු වල ආලෝකයෙන් සැදුනු නීති, හෝ නව හෝ සිද්ධාන්ත පුනරීක්ෂණ හෝ නීති වල ප්‍රායෝගික යෙදුම්".

**පර්යේෂණ වාර්තාවක ස්වභාවය හඳුනා ගැනීම.**

පර්යේෂකයා විසින් සිදුකරන ලද පර්යේෂණයේ ප්‍රතිඵල හෙවත් නව සොයාගැනීම් ඉදිරිපත් කිරීම පර්යේෂණ වාර්තාවෙන් සිදු කෙරේ. එමගින් රැස්කරගත් දත්ත විශ්ලේෂණය කිරීම සිදුවේ. මෙය ඉතාම සියුම් තර්කානුකූලව බුද්ධිමය ක්‍රියාවලියකි. මනා ශික්ෂණයකින් යුක්තව තර්කානුකූලව දත්ත විග්‍රහයක් පර්යේෂණ වාර්තාවෙන් ඉදිරිපත් කළ යුතුය. පර්යේෂණ වාර්තාවේ ස්වභාවය හෝ ප්‍රමාණය තීරණය වන්නේ පර්යේෂණ අරමුණ මතය. නිදසුනක් ලෙස යම් විද්‍යාඥයකු තම පර්යේෂණය සිදු කරනු ලබන්නේ සිය ප්‍රථම උපාධිය සඳහා ද නො එසේ නම් පශ්චාත් උපාධිය සඳහා ද යන්න මත වාර්තාවේ ස්වභාවය (Weight) තීරණය වේ. මක් නිසාද යත් ඒ ඒ ආයතන මගින් ඒ ඒ උපාධි අවශ්‍යතාවය පූර්ණය කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු නිබන්ධනයේ ස්වභාවය තීරණය කරන බැවිනි. එම වාර්තාව සඳහා වචන 10000 හෝ වචන 50000ක සීමාවක් ලෙස සඳහන් කරනු ලබයි. නොඑසේනම් පර්යේෂණායතනයේ අවශ්‍යතාවය මත එය තීරණය වේ.

පර්යේෂණ වාර්තාව මනා සංවිධානයකින් යුක්ත විය යුතුය. ඒ තුළ පුනරුක්ත දෝෂ තිබිය නොහැකිය. භාෂාව සරල සහ ශාස්ත්‍රීය විය යුතුය. එහි සාහිත්‍යමය කරුණු අඩංගු නොවිය යුතුය. අවශ්‍යම අවස්ථාවක හැර වාර්තාව ලිවිය යුතු වන්නේ කර්තෘ කාරකයෙනි. පර්යේෂණ වාර්තාවක තිබිය හැකි මූලික අදියර කීපයක් පහත පරිදි දැක්විය හැකිය

- මාතෘකාව සහිත මුල් පිටුව
- පර්යේෂකයාගේ නම හෝ පර්යේෂණ ආයතනයේ නම
- විශේෂ ස්තුතිය
- විධායක සාරාංශය
- පටුන
- පරිච්ඡේද විකාශය
- ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය
- උපග්‍රන්ථ

**මාතෘකාව සහිත මුල් පිටුව**

පර්යේෂණ මාතෘකාව පර්යේෂණ වාර්තාවේ මුල් පිටුවේ සඳහන් කළ යුතුය.

**පර්යේෂකයාගේ නම හෝ පර්යේෂණ ආයතනයේ නම.**

පර්යේෂණ වාර්තාවේ දෙවන පිටුවේ පර්යේෂකයාගේ නම හෝ පර්යේෂණ ආයතනයේ නම සඳහන් කළ යුතුය.

**විශේෂ ස්තුතිය සටහන් කිරීම.**

පර්යේෂණය සඳහා සහභාගි වූ සියලු දෙනාට ස්තුතිය පිරිනැමීම මෙහිදී සිදු කළ හැකිය.

**විධායක සාරාංශය.**

පර්යේෂණය යම් ආයතනයක් වෙනුවෙන් සිදු කළේ නම් එමඟින් නිකුත් කරන ලද පර්යේෂණ වාර්තා ආකෘතියට අනුකූලවන පරිදි පර්යේෂණ වාර්තාවේ මූලිකාංග පෙළගැස්විය යුතුය. විධායක සාරාංශය පර්යේෂණ වාර්තාවක අත්‍යවශ්‍ය අංගයක් නොවුවද පර්යේෂකයාගේ අභිමතය පරිදි යෙදිය හැකිය. නමුත් සමස්තයක් ලෙස සැලකීමේදී පර්යේෂණ වාර්තාවේ මුලින්ම ඒ පිළිබඳ සාරාංශයක් යෙදීම සිදු කෙරේ. මෙහි සමස්ත පර්යේෂණය තුළ භාවිත කළ සියලුම ක්‍රම විධි (Technics and Tools) සහ සොයාගැනීම් ඇතුලත්වේ. සාමාන්‍යයෙන් සාරාංශය වචන 250 -350 ත් අතර ප්‍රමාණයකින් යුක්ත වේ යැයි සැලකේ.

මෙහි ද්විතීක මූලාශ්‍ර භාවිත කිරීමක් සිදු නොවේ. පර්යේෂණ මාතෘකාව පිළිබඳ හඳුන්වා දීමත් සමඟ පර්යේෂණයේ අරමුණ, පර්යේෂණ ක්‍රමය හා නියැදිය පිළිබඳ කෙටි විස්තරයක් ඉදිරිපත් කෙරේ. එසේම මින් පොදු එක් නිගමනයක් පිළිබඳ අදහසක් හෝ නිගමන කිහිපයක් පිළිබඳ සමස්ත අදහසක් පර්යේෂණ වාර්තාව පරිශීලනය කරන්නා වෙත ඉදිරිපත් කළ හැකිය. එසේම සාරාංශය අවසානයේ පර්යේෂණයේ දී භාවිත කළ කේන්ද්‍රිය වචන (Keywords) පහකට අඩු ප්‍රමාණයක් සඳහන් කිරීම කළ යුතුය.

**පටුන**

පර්යේෂණ වාර්තාවේ පරිච්ඡේද විකාශය සිදුවන ආකාරය පිටු අංක යොදා ගනිමින් ඉදිරිපත් කෙරේ. ප්‍රධාන පටුනට පසු අවශ්‍ය නම් වගු පටුන, ප්‍රස්ථාර පටුන හා සිතියම් පටුන ද එක් කළ හැකිය.

**පරිච්ඡේද විකාශය**

පර්යේෂණ වාර්තාව සකස් කිරීම වඩාත් කාර්යක්ෂම හා ඵලදායි කර ගැනීම සඳහා පර්යේෂකයින් විසින් භාවිතයට ගනු ලබන්නේ සංකල්ප රාමුව (Conceptual Framework) නමැති අංගයයි. මෙහිදී පර්යේෂණ ගැටලුව, න්‍යායාත්මක විග්‍රහය සහ පර්යේෂණ ක්‍රියාවලිය ආශ්‍රිත මූලිකාංග පෙළගැස්වීම පිළිබඳව යම් සංකල්පමය රාමුවක් සකස් කර එම මූලිකාංග අතර සබඳතාවය හඳුනා ගැනීම සිදුවේ. පර්යේෂණ වාර්තාවක පළමු පරිච්ඡේදයේ සිට අවසාන පරිච්ඡේදය දක්වා අන්තර්ගත පර්යාලෝක න්‍යාය සංකල්ප සහ භාවිතයන් ඇතුළත් සමස්තය පිළිබඳ පුළුල් අවබෝධයක් මින් ලබාගත හැකිය.

පර්යේෂණ වාර්තාව පූර්ණ වශයෙන් ඉදිරිපත් කිරීම සිදුවන්නේ ඒ හා සම්බන්ධ පරිච්ඡේද කීපයක් හරහා ය. මෙම පරිච්ඡේද ගණන පර්යේෂණයෙන් පර්යේෂණයට වෙනස් වෙයි. සාමාන්‍යයෙන් මූලික පර්යේෂණ වාර්තාව අවම වශයෙන් පරිච්ඡේද හතරක්වත් ඇතුළත් වන බව පෙන්වා දිය හැකිය.

මෙය දළ ආකෘතියක් පමණි. පර්යේෂකයාගේ අභිමතය පරිදි අවශ්‍ය වන්නේ නම් භාවිතා කරන ලද පර්යේෂණ ක්‍රමය හා නියැදිය සඳහන් කිරීම සඳහා වෙනම පරිච්ඡේදයක් වුවද වෙන් කළ හැකිය. එසේම පර්යේෂකයාගේ අභිමතය පරිදි අවශ්‍ය වන්නේ නම් පර්යේෂණ මාතෘකාව වඩා දීර්ඝ ලෙස විග්‍රහ කිරීම සඳහා න්‍යායාත්මක හා සංකල්ප විග්‍රහය සඳහා පරිච්ඡේද කිහිපයක් වෙන් කළ හැකිය.

**පළමු පරිච්ඡේදය : හැඳින්වීම.**

මෙම පරිච්ඡේදයෙන් පර්යේෂණය පිළිබඳ මූලික හැඳින්වීමක් සිදුකරයි. පර්යේෂණ මාතෘකාව පිළිබඳ විග්‍රහය, පර්යේෂණ ගැටලුව හඳුන්වාදීම, පරමාර්ථ සහ අරමුණු හඳුන්වාදීම, උපන්‍යාසය විග්‍රහ කිරීම, සාහිත්‍ය විමර්ශනය, පර්යේෂණයෙහි න්‍යායාත්මක පසුබිම තේරුම් කිරීම, පර්යේෂණ විධික්‍රම සහ දත්ත රැස් කිරීමේ උපක්‍රම හඳුන්වාදීම, අධ්‍යන ප්‍රදේශය විග්‍රහ කිරීම සහ අධ්‍යයනයේ සීමා ආදී අංග පිළිබඳ දීර්ඝ හා තර්කානුකූල විග්‍රහයක් මෙම පරිච්ඡේදය තුළ අඩංගු විය යුතුය.

එසේම පර්යේෂණ මාතෘකාව විග්‍රහය තුළ දී බොහෝ විට අදාල ක්ෂේත්‍රය සම්බන්ධ ප්‍රායෝගික තත්ත්වය පිළිබඳ දත්ත ගෙන හැර පාමින් පර්යේෂණ ගැටලුව අධ්‍යයනය කිරීමේ වැදගත්කම පෙන්වනු ලැබේ. මෙම පරිච්ඡේදය තුළදී පර්යේෂකයාගේ අවධානය යොමුවිය යුතු වන්නේ තමන් විසින් සිදුකරන ලද පර්යේෂණයේ වැදගත්කම සාධාරණීකරණය පෙන්වීමය. ඉන්පසු පර්යේෂණ ගැටලුව හඳුන්වා දීම සිදු කරනු ලබයි. පර්යේෂණ ගැටලුව සරලව හා පැහැදිලිව ප්‍රශ්නාර්ථ සහිතව ඉදිරිපත් කළ යුතුය.

පර්යේෂණය සඳහා භාවිතා කරන ලද පර්යේෂණ ක්‍රමය හා නියැදිය පිළිබඳ විස්තරය තුළ එම ක්‍රමය යොදා ගැනීම සාධාරණීකරණය කළ යුතුය. අවශ්‍ය නම් පර්යේෂණ ක්‍රමය හා නියැදිය පිළිබඳ දීර්ඝ විස්තරයක් වුවද කළ හැකිය.

පර්යේෂණය සිදු කිරීමේදී පර්යේෂකයාට අනන්ත ගැටලුකාරී අවස්ථාවන්ට මුහුණදීමට සිදුවේ. මේ නිසාම පර්යේෂණය කිසියම් සීමාවන්ට යටත් කිරීමට ද සිදුවීමට පුළුවනි. මෙබඳු අත්දැකීම් පිළිබඳව ද පර්යේෂණයේ "හැඳින්වීම" පරිච්ඡේදය තුළ අන්තර්ගත කළ හැකිය. මේ නිසාම ගවේෂණ වාර්තාවේ වාර්තාකරණය සිදු කළ යුතු වන්නේ අතීත කාල ක්‍රියා ව්‍යාකරණානුකූලව ය.

**දෙවැනි පරිච්ඡේදය: සාහිත්‍ය විමර්ශනය**

මෙහි පර්යේෂණය සඳහා භාවිතා කරන න්‍යායාත්මක සහ සංකල්ප විග්‍රහය ඇතුළත් වේ. දෙවන හා තෙවන පරිච්ඡේද වෙන් කෙරෙනුයේ මාතෘකාව පූර්ණ වශයෙන් හැදෑරීම සඳහා අවශ්‍යවන න්‍යාය හා සංකල්ප තේරුම් ගැනීම සඳහාය. මෙබඳු පැහැදිලි අවබෝධයකින් තොරව ඊට අදාළ ආනුභවික දත්ත රැස්කර ගත නොහැකිය.

**උදාහරණ:-** දුගීභාවය සියදිවි නසා ගැනීමට හේතු වේද?

මෙහිදී පර්යේෂකයා විසින් "දුගීභාවය" යන සංකල්පයේ මෙන්ම "සියදිවි නසා ගැනීම" යන සංකල්පයේද න්‍යායාත්මක දැනුම මුලින්ම ලබා ගත යුතුය. එසේම මෙම සංකල්ප දෙකේ ප්‍රායෝගික තත්ත්වය කෙරෙහි ද

අවධානය යොමු කළ යුතුය. එම නිසා මෙම සංකල්ප දෙක විග්‍රහ කිරීම සඳහා වෙනම පරිච්ඡේද දෙකක් වෙන් කළ හැකිය.

පර්යේෂකයා විසින් දත්ත රැස් කරනු ලබන්නේ මෙම න්‍යායාත්මක දැනුම මත සිටය. එම නිසා මේ පිළිබඳ නිවැරදි විග්‍රහයක අවශ්‍යතාව තිබේ.

**තෙවැනි පරිච්ඡේදය: මෙහි ක්ෂේත්‍ර අධ්‍යයන තොරතුරු ඇතුළත් වේ.**

මුල් පරිච්ඡේද කීපය තුළදී ද්විතීක දත්ත භාවිතා කරමින් පර්යේෂණයේ වැදගත්කම පෙන්වීම සිදු විය යුතුය. පර්යේෂණ වාර්තාවේ පරිච්ඡේද මින් ඉදිරියට දිග හැරෙනුයේ ආනුභවික දත්තයන්හි සුවිශේෂී වෙනස්කම් හඳුනා ගැනීම සඳහාය. ආනුභවික පර්යේෂණ ප්‍රතිඵල විග්‍රහ කිරීම පර්යේෂණ වාර්තාවේ සුවිශේෂී අංගයක් වේ. මුළු පර්යේෂණ ක්‍රියාවලිය වඩා විද්‍යාත්මක හා තාර්කික ව සැලසුම් කරන ලද්දේ මෙම අමු දත්ත හෙවත් ප්‍රාථමික දත්ත (Primary Data) වඩා නිවැරදි ලෙස ලබාගැනීම සඳහාය. එසේ සකස් කර ගත් වඩා නිවැරැදි වූත් අත්‍යවශ්‍ය වූත් දත්ත වඩාත් නිවැරදි ප්‍රතිඵල ලබා ගැනීම සඳහා විග්‍රහ කළ ආකාරයට මෙම පරිච්ඡේදයෙන් විස්තර කෙරේ. මෙහිදී දත්ත විශ්ලේෂණ සඳහා භාවිතා කරන ලද ක්‍රමය හා පර්යේෂණ ක්ෂේත්‍රය පිළිබඳ විග්‍රහයක් පරිච්ඡේදයේ මුල් කොටස තුළ අන්තර්ගත කළ හැකිය. පර්යේෂණ ක්ෂේත්‍රය පිළිබඳ විග්‍රහයේදී පර්යේෂණය සිදුකළ ස්ථානය එනම් ගමක්, ආයතනයක්, ප්‍රජා කණ්ඩායම් හෝ ස්ථානයක් පිළිබඳ හැඳින්වීම ආදිය සිදුකළ හැකිය.

පර්යේෂණය තුළ මිනුම්කරණයට ලක් කළ විචල්‍යයන්ගේ සබඳතා විග්‍රහ කිරීම මෙම පරිච්ඡේදයේ දෙවන කොටසින් සිදු කළ හැකිය. එනම් පර්යේෂණ අරමුණු ඉටුකර ගැනීම කරා ළඟා වන ආකාරය විග්‍රහ කළ හැකි අවස්ථාවයි. පර්යේෂණ අරමුණු කරා ළඟා වීම සඳහා ක්‍රම විද්‍යාත්මක රාමුව භාවිතය මගින් වඩාත් වැදගත් දත්ත රාශියක් එකතු කර ගැනීමේ අවස්ථා පර්යේෂකයාට හිමිවේ. ඒ අනුව රැස්කරගත් අමු දත්තයන් මගින් තෝරාගත් පර්යේෂණ ගැටලුවට අදාළ විචාරයන්ගේ සබඳතා හඳුනා ගැනීම සිදුකළ යුතුය. අවශ්‍ය අවස්ථාවන්හිදී දත්ත වගු ගත කිරීමෙන්, දත්ත ප්‍රස්ථාර ගත කිරීමෙන් මෙන්ම දත්ත ආශ්‍රිත සටහන් නිර්මාණය කිරීමෙන් පර්යේෂකයාට පර්යේෂණ සොයා ගැනීම් තුළ ඉදිරිපත් කිරීමට අවශ්‍ය සබඳතා වඩාත් තීව්‍ර කර පෙන්විය හැකිය. එසේම එම සබඳතාවන්ගේ නව ප්‍රවණතා හඳුනා ගැනීමේදී හෝ ගැලපීමේදී ද්විතීක මූලාශ්‍ර භාවිතා කරමින් ඒ පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක යෙදිය හැකිය. එහිදී ආනුභවික දත්තවල ස්වභාවය මැනීම සඳහා දර්ශක හා අනුපාත භාවිත කළ හැකිය.

එසේම විචල්‍ය මිනුම් කිරීම හෝ ඒ ආශ්‍රිත ප්‍රවණතා හඳුනාගැනීම දත්ත විශ්ලේෂණය කිරීමේ දී සිදු කළ ද ඒ ආශ්‍රිත නිගමන ඉදිරිපත් කිරීමක් මෙහිදී සිදු නොකෙරේ. එම නිගමන ඉදිරිපත් කරනු ලබන්නේ සමාලෝචන විග්‍රහය තුළදීය.

**අවසාන පරිච්ඡේදය: සමාලෝචනය**

පර්යේෂණ වාර්තාවක අවසාන පරිච්ඡේදය සමන්විත වන්නේ සමාලෝචන විග්‍රහයෙනි. පර්යේෂණයේ නව සොයාගැනීම් හා යෝජනා මෙහි ඇතුළත් කෙරේ. මෙය කොටස් තුනක් භාවිතා කරමින් සිදුකරනු ලබයි. එනම් සාරාංශය, නිගමන හා යෝජනා ලෙසය. සාරාංශය යනු පර්යේෂකයා විසින් සිදු කරනු ලැබූ ක්ෂේත්‍ර අධ්‍යයනයේ

සම්පිණ්ඩණයකි. ඒ තුළ ද්විතීක මූලාශ්‍ර තොරතුරු අන්තර්ගත වන්නේ නැත. මෙහි ඇත්තේ ආනුභවික දත්ත පමණි. නො එසේනම් පර්යේෂකයා විදි අත්දැකීමය. සාරාංශය තුළ පර්යේෂණ නිගමන අන්තර්ගත වන්නේ නැත. ඒ ක්ෂේත්‍රය පිළිබඳ මතුපිට දර්ශනයක් සේම මෙහි පර්යේෂණ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා විශේෂ අවධානයක් යොමු කරන ලද දිශානතීන් පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කෙරේ.

පර්යේෂණයේ වැදගත්ම අංගය වන්නේ පර්යේෂණය අවසානයේදී ඒ හා සම්බන්ධ ඉදිරිපත් කරනු ලබන නිගමනය. දත්ත විශ්ලේෂණයේ දී ඒ ඒ දත්ත සම්බන්ධ යම් හඳුනා ගැනීම සිදු කරනු ලබන්නේ සමාලෝචන විග්‍රහයක් තුළය. එසේම නිගමන ගෙනහැර පෑම පර්යේෂණ මාතෘකාවෙන් මාතෘකාවට වෙනස් විය හැකිය. සමහර මාතෘකාවන් හිදී සුවිශේෂී එක් නිගමනයකට පමණක් එළඹිය හැකිය. නිදසුනක් ලෙස සැලකීමේදී උපන්‍යාස පර්යේෂණයක දී නම් අදාළ උපන්‍යාසය සම්බන්ධව ඇත්තේ එක් නිගමනයකි එනම්:

-උපන්‍යාසය පිළිගත හැකිය.

- උපන්‍යාසය පිළිගත නොහැකිය/ප්‍රතික්ෂේප වේ.

- උපන්‍යාසය සංශෝධනය සහිතව පිළිගත හැකිය.

එසේම නිගමන ඉදිරිපත් කිරීමේදී එම නිගමන තවත් තීව්‍ර කිරීම සඳහා ද්විතීක මූලාශ්‍ර යොදා ගැනීමේ අවකාශය ද තිබේ. එනම් වෙනත් පර්යේෂකයින් විසින් මීට පෙර සිය අධ්‍යනයන් මගින් සොයාගත් කරුණු (Previous Research Findings) මෙම නිගමන හා සමාන වන බවත් ඉදිරිපත් කිරීමය.

**උදාහරණ**: සියදිවි නසාගැනීම විවාහකයන්ට වඩා අවිවාහකයන් අතර සිදුවේ. (Durkhiem,1897)

පර්යේෂණ වාර්තාව තුළ යෝජනා ඉදිරිපත් කිරීම සෑම පර්යේෂණයකදීම සිදු කළ හැකි නොවේ. ඒ සිදු කළ හැකි සුවිශේෂී පර්යේෂණ තිබේ. එසේම යෝජනා ඉදිරිපත් කිරීම පර්යේෂකයාගේ පර්යේෂණ අරමුණු මත ද තීරණය විය හැකිය.

පර්යේෂණ වාර්තාවක නිර්දේශ හා යෝජනා (Recommendation and Suggesions) ඉදිරිපත් කිරීම බොහෝ විට සිදු වන්නේ ව්‍යවහාරාත්මක පර්යේෂණ තුළදීය. ඊට අදාලව සිදු කරන ශක්‍යතා අධ්‍යයන (Feasibility Study), ක්‍රියාකාරී පර්යේෂණ ( Action Research), සමාජ බලපෑම් පිළිබඳ කරනු ලබන අධ්‍යන (Social Impact Research), ඇගයීමේ පර්යේෂණ (Evaluation Research) හෝ පිරිවැය ප්‍රතිලාභ පර්යේෂණ (Cost-benefit Research) තුළ නිර්දේශ හා යෝජනා ඉදිරිපත් කිරීමේ අවකාශ තිබේ.

පර්යේෂණයෙහි නිර්දේශ හා යෝජනා ඉදිරිපත් කරනුයේ පර්යේෂණ නිගමන හරහා ය. පර්යේෂණයක නිර්දේශ යෝජනා එකක් හෝ කීපයක් තිබිය හැකිය.

එසේම පර්යේෂණයන්හි දී ඉදිරිපත් කළ හැකි තවත් අදහසක් වන්නේ තමන් විසින් කරන ලද පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළව අධ්‍යයනයට ලක් කළ යුතු තවත් දිශානතීන් පිළිබඳ අධ්‍යනය කිරීමට අනිකුත් පර්යේෂකයින් වෙත ආරාධනා කිරීමය. නව පර්යේෂණ දිශානතින් පිළිබඳ සියුම් හෙළිදරව්වක් කිරීමය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය:**

පර්යේෂණ වාර්තාවේ අවසාන අංගය ලෙස ඉදිරිපත් කරනු ලබන්නේ පර්යේෂණ සඳහා ද්විතීක මූලාශ්‍ර ලෙස භාවිතා කළ මූලාශ්‍ර පිළිබඳ විස්තරය හෙවත් ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලියයි. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය තුළ ග්‍රන්ථ, සඟරා, ලිපි, ආයතන ප්‍රකාශන, අන්තර්ජාල ප්‍රකාශන සේම අප්‍රකාශිත කෘති ද තිබිය හැකිය. එසේම පර්යේෂකයා විසින් භාෂා කිහිපයක මූලාශ්‍ර භාවිතා කිරීමක් සිදු කර තිබිය හැකිය. එම හේතුන් නිසා ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය තුළ සඳහන් කිරීමට අපේක්ෂිත ද්වීතික මූලාශ්‍රය වර්ගීකරණයකට යොමු කළ හැකිය. එනම් ඒවා වර්ගීකරණයට අනුව වෙන් වශයෙන් සඳහන් කළහැකිය. එහිදී මුලින්ම ප්‍රකාශිත කෘති ආශ්‍රයෙන් ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය ආරම්භ කළ හැකිය. මෙම සියලුම නාමකරණ සඳහා කළ යුත්තේ අකාරාදි පිළිවෙලකට අනුවය. ඉන්පසු පර්යේෂකයාට ඔහු භාවිතා කළ අනෙකුත් මූලාශ්‍ර පිළිවෙලින් පෙළ ගැස්විය හැකිය.

එසේම පර්යේෂකයා විසින් විවිධ මාධ්‍ය සහිත කෘති වාර්තා කළේ නම් එහි දී ප්‍රථමයෙන් සිංහල කෘති දක්වා ඉන් පසු පර්යේෂකයාගේ අභිමතය පරිදි ඉංග්‍රීසි, දමිළ කෘතීන්හි නම් සඳහන් කළ හැකිය. මෙම ප්‍රධාන භාෂාවන්ට අමතරව ශ්‍රී ලාංකික පර්යේෂකයකු නම් වෙනත් භාෂාවන් ගේ කෘති වාර්තා කළේ නම් ඒවාද සඳහන් කළ හැකිය.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය සකස් කිරීමේ දී ග්‍රන්ථ නාමකරණය අංක කරන්නේ නැත. එසේම ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය ප්‍රධාන පර්යේෂණ වාර්තාවේ ම අංගයක් වන බැවින් එය ප්‍රධාන පිටු අංක ගලා යාමට ද අදාළ වේ. එනම් ඒවා හින්දු අරාබි ඉලක්කම් සහිත විය යුතුය. නොඑසේනම් ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලියේ අවසාන පිටු අංකය පර්යේෂණ වාර්තාවේ අවසාන පිටු අංක විය යුතුය. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය යොදාගැනීම මගින් බුද්ධිමය දේපොළ සඳහා නිසි වටිනාකමක් දීම සිදුවේ. එසේම වෙනත් කතුවරුන්ගේ කෘති අදාල පර්යේෂකයා විසින් කියවා ලබා ගත්තේ නම් ඒවා පිළිබඳ සඳහන් කිරීම මගින් වෙනත් කතුවරුන් විසින් සොයා ගත් කරුණු එලෙසින්ම යොදාගත් බව අනාවරණය කිරීමට කතුවරයාට අවස්ථාව ලැබේ. මින් කතුවරයා අන්සතු බුද්ධිමය දේපොළ සොරා ගැනීමේ වරදට හසු වීමෙන් ද වැළකෙයි.

**උපග්‍රන්ථය:**

උපග්‍රන්ථයෙහි ඇතුළත් කරනුයේ පර්යේෂණ වාර්තාවට ඍජුවම හෝ නැති නම් පරිච්ඡේද විකාශයේ අදාළ අවස්ථාවේදීම ඉදිරිපත් කළ නොහැකි වූ පර්යේෂණය හා අදාල වූ සටහන්ය. මේ තුළ පර්යේෂණය සඳහා භාවිතා කළ ප්‍රශ්නාවලින්, සම්මුඛ සාකච්ඡා ආකෘති (Check List), විස්තරාත්මක සංඛ්‍යා ලේඛණ, සිතියම් හා පින්තූර වැනි අංග ඇතුළත් විය හැකිය. ඒවා එකිනෙක පිළිවෙලින් අංක කර දැමිය යුතුය. මේවා “ඇමුණුම් අංක 1” “ඇමුණුම් අංක 2” ආදි වශයෙන් වෙන වෙනම අංකනය කළ යුතුය. උප ග්‍රන්ථයෙහි පිටු අංකනය කරනු ලබන්නේ රෝම ඉලක්කම් එසේ නොමැති නම් අංකනය නොකර සිටීමට ද පුළුවනි. එසේම උපග්‍රන්ථය පර්යේෂණ වාර්තාවක ඇතුලත් නොකර සිටීමට ද පුළුවන. මේ ආකාරයට පර්යේෂණ වාර්තාවක අඩංගු විය යුතු මූලික පියවරයන් පිළිබඳ සාකච්ඡා කළ හැකිය. මෙලෙස වඩාත් නිවැරදි හා පරිපූර්ණ වාර්තාවක් එළි දැක්වීමෙන් පර්යේෂණයෙහි ප්‍රතිඵල වඩාත් සාධනීය ලෙස සමාජය වෙත තිළිණ කළ හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

සුභසිංහ, වසන්තා (2016). සමාජ පර්යේෂණ ක්‍රම, ගණේමුල්ල: කර්තෘ ප්‍රකාශන.

උයන්ගොඩ, ජේ. (2011). සමාජවිද්‍යා පර්යේෂණ යෝජනාවලියක් ලිවීම. කොළඹ: සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

https://si.wikipedia.org/wiki/පර්යේෂණ

# 08. වියපත් ජනගහනය කළමනාකරණය කිරීම.

ඩබ්ලිව්. අනුෂා ප්‍රියංජනී
සංවර්ධන නිලධාරි
*B.A. (Sociology and Anthropology) Special*

ජනගහනය වියපත් වීම (Population Ageing) යනු "ජන සංඛ්‍යාවක වයස්ගතවූවන්ගේ ප්‍රතිශතය මුළු ජන සංඛ්‍යාවට සාපේක්ෂව ක්‍රමයෙන් ඉහළයාමයි."සංවර්ධිත රටවල වියපත් ජනගහනය ලෙස සැලකෙන්නේ වයස අවුරුදු 65 හෝ ඊට වැඩි ජනගහනයයි. නමුත් සංවර්ධනය වෙමින් පවතින රටවල වයස අවුරුදු 60 හෝ ඊට වැඩි පිරිස වියපත් ජනගහනය ලෙස සලකයි. වියපත්වීම සංවර්ධනය වෙමින් පවතින රටවලට පමණක් නොව සංවර්ධිත රටවලටද විවිධ බලපෑම් ඇති කරයි. ලෝකයේ ඇති සෑම රටක්ම ජන සංඛ්‍යාව වර්ධනය වීම ආශ්‍රිත විවිධාකාර ගැටළුවලට මුහුණදී සිටී. මෙසේ ජනගහනය වර්ධනය වීම ශ්‍රී ලංකාවේ ජනගහනය විකාශනයේ ස්වරූපය පිළිබඳ අවධානය යොමු කිරීමේදී විසිවන සියවසේ දෙවන භාගයේදී තරුණ ජනගහනයේ වැඩි වීමත්, විසි එක් වැනි සියවසේදී මහළු ජනගහනයේ වැඩිවීමත් දක්නට ලැබෙන කරුණකි. මෙසේ වේගයෙන් වයස්ගත ජනගහනය වැඩි වීම නිසා ආර්ථික, සාමාජික , සෞඛ්‍ය ආදී ක්ෂේත්‍ර රාශියක ගැටළු රැසකට මුහුණ දීමට සිදුවන අතර එම ගැටළු මනාව කළමණාකරණය කර ගැනීම ඉතාම වැදගත් වේ. ඒ සඳහා වැඩිහිටියන් කායික මානසික වශයෙන් ශක්තිමත් කර ගැනීම මෙන්ම ඔවුන් රටේ නිෂ්පාදන ක්‍රියාවලියට දායක කරගතහැකි විධික්‍රම පිළිබඳ අවධානය යොමු කිරීමෙන් වැඩිහිටියන්ට ඔවුන් ගෙවන කාලය ප්‍රීතිමත්ව ගෙවා දැමීමමට අවස්ථාව උදා වනවා මෙන්ම රටට සේවයක්ද සිදු වේ.

වියපත්වීම මුලින්ම ආරම්භ වූයේ සංවර්ධිත රටවලය. මීට හේතුව එම රටවල ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තිය සංවර්ධනය වෙමින් පවතින රටවලට වඩා කලින් සිදුවීමයි. සංවර්ධනය වෙමින් පවතින රටවල ප්‍රජාවිද්‍යාත්මක සංක්‍රාන්තිය ප්‍රමාදව සිදුවීම මත ජනගහනය වියපත්වීමද ප්‍රමාදව සිදුවිය. වියපත්වීම සඳහා මූලික වශයෙන් කරුණු තුනක් බලපායි.

- සඵලතාව (Fetility)]
- මර්ත්‍යතාව (mortality)
- ජාත්‍යන්තර සංක්‍රමණ (International Migration)

ශ්‍රී ලංකාවේ මර්ත්‍යතාව පහළ බැසීම ආරම්භ වූයේ 1945 න් පමණ පසුය. මීට හේතු වන්නේ දිවයින පුරා ක්‍රියාත්මක කරන ලද සෞඛ්‍ය ප්‍රතිපත්තියයි. මේ නිසා මිනිසුන්ගේ ආයු අපේක්ෂාව වර්ධනය විය. එසේම 1960 දශකය අග භාගයේදී මාතෘ හා ළමා සෞඛ්‍ය වැඩසටහනට පවුල් සැලසුම් ක්‍රම හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම මත සඵලතාවද පහළ බැසීම ආරම්භ විය. මෙම සංසිද්ධිය (ළමා ජනගහනය අඩු වීම සහ වියපත් ජනගහනය වැඩි වීම) වියපත් ජනගහනයක් නිර්මාණය වීමට හේතු විය. එසේම ජාත්‍යන්තර සංක්‍රමණද වියපත්වීම සඳහා වක්‍රාකාරයෙන්

බලපායි. ශ්‍රී ලංකාවෙන් පිටතට ජාත්‍යන්තර වශයෙන් සංක්‍රමණය වන්නන් වැඩකරන වයස් කාණ්ඩයට අයත් වීම ඊට හේතුවයි.

වයස්ගත ජනගහනය වැඩිවීම රටකට සැලකිය යුතු අභියෝග කිහිපයක් මතු කළ හැකිය. වයෝවෘද්ධ පුරවැසියන් විශාල ප්‍රමාණයක් සිටීම සෞඛ්‍ය සේවා වැඩිදියුණු කිරීම සහ දිගු ආයු අපේක්ෂාව පිළිබඳ සාක්ෂියක් වන අතර, එය අද්විතීය සමාජ, ආර්ථික සහ සෞඛ්‍ය ආරක්ෂණ අභියෝග මාලාවක් ද ගෙන එයි.

සංවර්ධිත රටවල ජනගහනය වියපත්වීම සිදුවූයේ සමාජ ආර්ථික දියුණුවත් සමගිනි. මේ නිසා එම රටවලට වියපත්වීම සම්බන්ධ අභියෝගයන්ට මුහුණදීම සඳහා අවශ්‍ය වැඩසටහන්, සැලසුම් සකස් කිරීමට ප්‍රමාණවත් කාලයක් මෙන්ම ශක්‍යතාවක්ද පැවතිනි. නමුත් සංවර්ධනය වෙමින් පවතින රටවල වියපත්වීම සිදුවන්නේ සමාජ ආර්ථික දියුණුවකින් තොරවය. එසේම කෙටි කාලයක් තුළ ජනගහනය වියපත්වීම සිදුවේ. මේ නිසා වියපත්වීම සංවර්ධනය වෙමින් පවතින රටවලට විවිධ සමාජ ආර්ථික ගැටලු ඇති කරයි. රටක වියපත් ජනගහනයක් පවතින විට ඔවුන්ව රැක බලාගැනීමට සිදුවේ. වියපත් වූවන් රැක බලා ගැනීම පවුල් සංස්ථාවේ මෙන්ම රජයේද වගකීමකි. මේ නිසා පවුල් සංස්ථාවේ යැපෙන්නන් ප්‍රමාණය වැඩිවේ. එසේම රජයට වියපත්වූවන් වෙනුවෙන් උපකාරක සේවා සැපයීමට සිදුවේ. විශේෂයෙන්ම වියපත්වූවන්ට වැළදෙන රෝග අංශභාගය, දියවැඩියාව වැනි නිදන්ගත රෝගයි. මෙනිසා ඔවුන්ට දීර්ඝකාලීනව නේවාසික ප්‍රතිකාර කිරීමට අවශ්‍ය සෞඛ්‍ය සේවා සැපයීමට රජයට සිදුවේ. වියපත් ජනගහනය වැඩිවන විට රජයට විශ්‍රාම වැටුප් සඳහා වැඩි පිරිවැයක් දැරීමට සිදුවේ. විශ්‍රාම වැටුප් සංක්‍රාම වියදමකි. මේ නිසා සම්පත් ඵලදායී ආර්ථික කටයුත්තක යෙදවීමෙන් නිමැවුමක් ලබා ගැනීමට ඇති හැකියාව නැති වේ.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්ණායකය අනුව වැඩිහිටියන් ලෙස සැලකෙන්නේ වයස අවුරුදු හැට පසු කළ පුද්ගලයන් ය. වැඩිහිටි විය වයස් කාණ්ඩ අනුව තරුණ වැඩිහිටි, වැඩිහිටි සහ මහළු විය යනුවෙන් අවධි තුනකින් යුතු වේ. ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව වයස අවුරුදු 60 – 74 දක්වා වූවන් තරුණ වැඩිහිටියන් ලෙසද අවුරුදු 75 – 84 දක්වා වන්නන් වැඩිහිටියන් ලෙසද 85 සිට ඉහළ වයස් කාණ්ඩයට අයත් වන්නන් මහළු පුද්ගලයන් ලෙසද සැලකේ. සෞඛ්‍ය හා සමාජ තත්ත්වය අතින් ඉහළ දියුණු රටවල තරුණ වැඩිහිටියන් මතු නොව මහළු ජනතාව ද බොහෝවිට නිරෝගී ක්‍රියාශීලී දිවියක් ගත කරන අතර තමාගේද, පවුලේද ආර්ථිකයට බරක් නොවී ජීවත් වෙති. ජපානය, දකුණු කොරියාව වැනි රටවල වැඩිහිටියන් රටේ ආර්ථිකයට දායක විය හැකි කුමන හෝ වෘත්තීයක යෙදවීමට ඒ රටවල් කටයුතු යොදා තිබේ.

ඉතා වේගයෙන් වයස්ගත වන ජනගහනය වාසය කරන රටවල් අතරින් ශ්‍රී ලංකාව ද ඉදිරියෙන් සිටියි. ජනගහනයෙන් සියයට 19 ක් වසර 2030 වන විට වයස්ගත කාණ්ඩයට අයත් වන බව සමීක්ෂණ වාර්තාවලින් අනාවරණ වී තිබේ. 2000 වර්ෂයේදි වයස අවුරුදු 60 ඉක්මවූ ජනගහනය සියයට 9.2 ක් වූ අතර වසර 2050 වන විට එම සංඛ්‍යාව සියයට 30 ක් වන බවට ලෝක සෞඛ්‍ය සංවිධානය ඇස්තමේන්තු කර ඇත. වැඩිහිටියන්ගෙන් සියයට 80 ක් ජීවත් වනුයේ තමන්ගේ දරුවන් සමඟ බවට ගණන් බලා තිබේ. වැඩිහිටි ජනගහනයෙන් සමාජයට ලබා ගත හැකි

ආදර්ශයන් හා උගත යුතු පාඩම් බොහෝ ය. වාර්ෂිකව වැඩි වන වැඩිහිටි ජනගහනය රටට බලපාන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් මෙම ලිපියෙන් සාකච්ඡා කෙරේ.

පසුගිය දශක කිහිපය තුළ පහළ යමින් පවතින මෙරට උපත් අනුපාතිකය සහ පහළ ගොස් ඇති මරණ අනුපාතිකය ද මෙයට බෙහෙවින් බලපා තිබෙන බව ජනගහන විශ්ලේෂකයෝ පෙන්වා දෙති. වැඩිහිටි ජනගහනය වැඩි වීමේ ප්‍රවනතාව තවදුරටත් තීව්‍ර කරන කරුණක් වන්නේ මෙරට පුරවැසියන්ගේ උපතේ දී ආයු අපේක්ෂාව ක්‍රමානුකූලව ඉහළ ගොස් තිබීමය. එසේම වර්තමානයේ ජනතාව තමන්ගේ ශරීර සෞඛ්‍ය යහපත්ව පවත්වා ගැනීම සම්බන්ධයෙන් දක්වන අවධානය ප්‍රශස්ත මට්ටමක පැවතීම ද මේ සඳහා බලපාන තවත් කරුණකි. කෙසේ වෙතත් වැඩිහිටි ජනගහනයේ ප්‍රතිශතය ඉහළ යෑමට බලපාන ප්‍රබලම සාධකය ලෙස පිළිගැනෙනුයේ රටේ උපත් අනුපාතිකයේ පහළ බැසීමය. මේ අනුව මෙරට ජනගහන සමතුලිතතාව ක්‍රමයෙන් බිඳ වැටී තරුණ ජනගහනයට සාපේක්ෂව වැඩිහිටි ජනගහනයේ ඉහළ යෑමේ තත්ත්වයක් පවතියි. එහි ප්‍රතිඵලයක් ලෙස සමස්ත ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස ගත් විට වැඩ කරන ජනතාවගේ කැපී පෙනෙන පහළ යාමක් ද තිබේ.

**1.සෞඛ්‍ය ආරක්ෂණ පිරිවැය වැඩි වීම:**

මිනිසුන් වයසට යන විට, ඔවුන්ට වෛද්‍ය ප්‍රතිකාර, දිගු කාලීන සත්කාර සහ ඖෂධ ඇතුළු තවත් සෞඛ්‍ය සේවා අවශ්‍ය වේ. මෙය රටක සෞඛ්‍ය සේවා පද්ධතිය මත වැඩෙන බරක් පටවන අතර සෞඛ්‍ය සේවා පිරිවැය වැඩි කිරීමට හේතු විය හැක. වයස්ගත ජනගහනයක සෞඛ්‍ය සේවා අවශ්‍යතා සපුරාලීම සඳහා රජයන්ට වැඩි සම්පත් වෙන් කිරීමට අවශ්‍ය විය හැකිය.

**2.විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ පද්ධති:**

වැඩිහිටි පුද්ගලයින් සාමාන්‍යයෙන් විශ්‍රාම ගැනීමෙන් පසු මූල්‍ය ආධාර සඳහා විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ පද්ධති මත රඳා පවතී. විශාල වැඩිහිටි ජනගහනයක් සමඟ, මෙම පද්ධති සඳහා ප්‍රමාණවත් ලෙස අරමුදල් සැපයීමේදී රජයන්ට අභියෝගවලට මුහුණ දිය හැකිය. මෙය මූල්‍ය පීඩනයකට තුඩු දිය හැකි අතර එවැනි වැඩසටහන්වල තිරසාර බව සහතික කිරීම සඳහා ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ.

**3.ආර්ථික ඵලදායිතාව:**

වයස්ගත ජනගහනයක් ශ්‍රම බලකායේ අඩුවීමට හේතු විය හැකි අතර, එමඟින් සමස්ත ආර්ථික ඵලදායිතාව අඩු විය හැක. වැඩ කරන වයසේ කුඩා ජනගහනයක් විශාල වැඩිහිටි ජනගහනයකට සහාය වීම රටක ආර්ථිකය අඩාල කළ හැකි අතර එය ආර්ථික වර්ධනය අඩුවීමට හේතු විය හැක.

**4. දිගු කාලීන රැකවරණය සඳහා වැඩි ඉල්ලුමක්:**

මිනිසුන් වයසට යන විට, සාත්තු නිවාස සහ උපකාරක ජීවන පහසුකම් වැනි දිගු කාලීන සත්කාර සේවා සඳහා වැඩි අවශ්‍යතාවයක් පවතී. වැඩිහිටියන් සඳහා ප්‍රමාණවත් සහ දැරිය හැකි දිගු කාලීන සත්කාර විකල්ප සැපයීම රජයන් සහ පවුල් සඳහා තීරණාත්මක සැලකිල්ලක් බවට පත්වේ.

**5. සමාජ සහයෝගය සහ පවුලේ ගතිකත්වය:**

සම්ප්‍රදායිකව, බොහෝ වැඩිහිටි පුද්ගලයින් සහයෝගය සඳහා පවුලේ සාමාජිකයන් මත විශ්වාසය තබා ඇත. කෙසේ වෙතත්, සමාජයන් වයසටයත්ම, ඔවුන්ගේ වැඩිහිටි ඥාතීන්ට රැකවරණය සහ සහාය ලබා දීම සඳහා වැඩ කරන

වයසේ සිටින පවුලේ සාමාජිකයන් අඩු විය හැක. මෙය පවුලේ ගතිකත්වයේ වෙනස්කම්වලට තුඩු දිය හැකි අතර රජය සහ ප්‍රජාව පදනම් කරගත් ආධාරක පද්ධති මත වැඩි විශ්වාසයක් ඇති කරයි.

**6. වැඩිහිටි අපයෝජනය සහ අවදානම්:**

වයස්ගත ජනගහනයක් සමඟ, වැඩිහිටි අපයෝජනය, නොසලකා හැරීම සහ සූරාකෑමේ වැඩි අවදානමක් ඇත. වයෝවෘද්ධ පුරවැසියන්ගේ අයිතිවාසිකම් සහ යහපැවැත්ම ආරක්ෂා කිරීම රජයන් සහ සමස්තයක් වශයෙන් සමාජය සඳහා දැඩි අවධානයක් යොමු කරයි.

**7. යටිතල පහසුකම් සහ ප්‍රවේශ්‍යතාව:**

වයස්ගත ජනගහනයට බොහෝ විට සංචලනය සහ ප්‍රවේශ්‍යතා අවශ්‍යතා සඳහා යටිතල පහසුකම් සහ සේවාවන් සඳහා ගැලපීම් අවශ්‍ය වේ. මෙයට පොදු ප්‍රවාහනය, නිවාස, සහ පොදු අවකාශයන් වයස්ගත වීම සඳහා වෙනස් කිරීම් ඇතුළත් වේ.

**8. සමාජ හුදකලාව සහ තනිකම:**

වැඩිහිටි පුද්ගලයින් සමාජ හුදකලාව සහ තනිකමට මුහුණ දිය හැකි අතර, ඔවුන්ගේ මානසික හා ශාරීරික සෞඛ්‍යයට අහිතකර බලපෑම් ඇති කළ හැකිය. මෙම ගැටළු විසඳීම සහ සමාජ ඇතුළත් කිරීම් ප්‍රවර්ධනය කිරීම වැදගත් වේ.

වයස්ගත ජනගහනයකින් එල්ල වන අභියෝගවලට මුහුණ දීම සඳහා රජයන් සහ සමාජයන් විවිධ ප්‍රතිපත්ති සහ මුලපිරීම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විය හැකිය. සෞඛ්‍ය ආරක්ෂණ ප්‍රතිසංස්කරණ, විශ්‍රාමික වයසට ගැලපීම්, විශ්‍රාම වැටුප් පද්ධති ප්‍රතිසංස්කරණ, දිගු කාලීන සත්කාර පහසුකම් සඳහා ආයෝජන සහ සෞඛ්‍ය සම්පන්න වයස්ගත වීම සහ සමාජ ඇතුළත් කිරීම් ප්‍රවර්ධනය කිරීම සඳහා මුල පිරීම් මේවාට ඇතුළත් විය හැකිය. මීට අමතරව, වැඩිහිටි පුද්ගලයින් ක්‍රියාශීලීව සිටීමට සහ ඔවුන්ගේ ප්‍රජාවන්හි නිරත වීමට දිරිමත් කිරීම වැඩිහිටියන්ට සහ සමස්තයක් වශයෙන් සමාජයට බොහෝ ප්‍රතිලාභ ලබා ගත හැකිය.

රටක වැඩිහිටි ජනගහනය කළමනාකරණය කිරීම හේතු කිහිපයක් නිසා අතිශයින් වැදගත් වේ. සමාජයක් වයසට යන විට, වැඩිහිටි පුරවැසියන්ගේ යහපැවැත්ම, සෞඛ්‍යය සහ ගෞරවය සහතික කරන ප්‍රතිපත්ති සහ භාවිතයන් ක්‍රියාත්මක කිරීම තීරණාත්මක වේ. වැඩිහිටි ජනගහනය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම මගින් සැලකිය යුතු සමාජ, ආර්ථික සහ සෞඛ්‍ය ආරක්ෂණ ප්‍රතිලාභ ලබා ගත හැකිය.

වැඩිහිටියන්ට සැලකීම මෙරට සංස්කෘතියේ අනන්‍ය ලක්ෂණයක් වුව ද සාම්ප්‍රදායික ජීවන ක්‍රමයේ වෙනස්වීම් සමඟ එම තත්ත්වය යම්තාක් දුරකට වෙනස් වී තිබේ. වර්තමානයේ පුරුෂයන් සහ ස්ත්‍රීන් ද ශ්‍රම වෙළඳපොළට එක්වී සිටින නිසා බොහෝ විට මාපියන් සහ වැඩිහිටියන් රැක බලා ගැනීම අපහසු කාර්යයකි. ඒ වෙනුවට සිදුව ඇත්තේ මාපියන්ට දරුවන්ගේ දරුවන් රැක බලා ගැනීමට ය. සාම්ප්‍රදායිකව පැවැති විස්තීර්ණ පවුල් වෙනුවට න්‍යෂ්ටික පවුල් රටාවක් ඇති වීම නිසා ද මාපියන්ට ඔවුන්ගේ අවසන් කාලය හුදෙකලාව ගෙවීමට සිදුව තිබේ. මීට අමතරව වර්තමාන තරුණ පරම්පරාවේ බොහෝ දෙනෙක් විදේශවලට සංක්‍රමණය වීමේ ප්‍රවණතාවයක් පවතින නිසා ද මාපියන් හුදෙකලා වන තත්ත්වයක් ඇති වී තිබේ. බොහෝ අවස්ථාවල ඇතැම් වැඩිහිටියන්ට තමන්ගේ අවසන් කාලය වැඩිහිටි නිවාසවල ගත කිරීමට සිදුව තිබේ.

# 09. තිරසාර සංවර්ධන අරමුණු ළගාකර ගැනීමට පවතින අභියෝගතා.

ප්‍රදීප් ලංකාපෙල
සංවර්ධන නිලධාරි
*B.B.Mgt (Acc. Special)*

**තිරසර සංවර්ධනය**

තිරසර සංවර්ධනය යන්න පුළුල් ලෙස අර්ථ දැක්වෙන්නේ අනාගත පරම්පරාවන්ට තමන්ගේ අවශ්‍යතා සපුරාලීමේ හැකියාවට හානි නොවන ලෙස වර්තමානයේ අවශ්‍යතා සපුරාලන සංවර්ධනය ලෙස ය. නමුත්, බැලූ බැල්මට බොහෝ මිනිසුන් තිරසර සංවර්ධනය පරිසරයට සීමා කළත්, එය සමානව සමාජ සාධාරණත්වය හා ආර්ථික සංවර්ධනය තුළ මුල් බැසගෙන ඇත.

තිරසර සංවර්ධනය යනු පාරිසරික, සමාජයීය හා ආර්ථික යන ත්‍රිත්ව මානයන් සුසංයෝජනය වූ, දිගුකාලීන, තිරසර සමෘද්ධියක් ලබා ගැනීම සඳහාවූ ඒකාබද්ධ ප්‍රවේශයකි.

2030 තිරසර සංවර්ධනය සඳහා වූ න්‍යාය පත්‍රය සහ එහි තිරසර සංවර්ධන ඉලක්ක - ජාත්‍යන්තර සහයෝගීතාවයේ වර්තමාන ප්‍රමුඛ ගෝලීය රාමුවේ පදනම වන්නේ තිරසරභාවයයි.

**තිරසර සංවර්ධන ඉලක්ක**

2015 සැප්තැම්බර් මාසයේදී එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් 193 ම සියලු දෙනාටම යහපත් අනාගතයක් සාක්ෂාත් කර ගැනීමේ සැලැස්මක් අනුමත කළහ. - ඉදිරි වසර 15 තුළ අන්ත දුප්පත්කම තුරන් කිරීමට, අසමානතාවයට හා අයුක්තියට එරෙහිව සටන් කිරීමට සහ අපේ ජෛවීය ආරක්ෂා කිරීමට මාවතක් සකස් කළහ. මෙම " 2030 න්‍යාය පත්‍රයෙහි" මූලික කරුණු වනුයේ, තිරසර සංවර්ධන ඉලක්ක 17 (SDGs) වන අතර එමඟින් අපට අවශ්‍ය ලෝකය ඉතා පැහැදිලිව නිර්වචනය කර ඇත - කිසිවෙක් මග නොහැරෙන ලෙස, සියලුම ජාතීන්ට මෙය අදාළවේ.

නව ගෝලීය ඉලක්කයන් ආරම්භයේ සිටම ව්‍යාපාර, සිවිල් සමාජය සහ පුරවැසියන් සම්බන්ධ කරගත් රජයන් සමඟ වෙන කවරදාටත් වඩා සංයුක්ත වූ ක්‍රියාවලියක ප්‍රතිඵලයකි. ලෝකය යායුත්තේ කොතැනටද යන්න පිළිබඳව අපි සියලු දෙනා එකඟතාවයක සිටියි. මෙම අභිලාෂයන් සපුරාලීම සඳහා සමාජයේ සෑම අංශයක්ම පෙර නොවූ විරූ උත්සාහයක් ගත යුතු අතර, තිරසර සංවර්ධන සභාව වශයෙන් අපි සැම දෙනාටම තිරසර සංවර්ධිත රටක් කරා ලංකාව ගෙන යාමට කැපවී සිටින්නෙමු.

**තිරසාර සංවර්ධන අභිමතාර්ථ යොමුවී ඇති පුළුල් ක්ෂේත්‍ර පහ**

**1.ජනතාව -**

දිළිඳුකම හා සාගින්න අවසන් කිරීම, ගෞරවය, සමානාත්මතාව හා සෞඛ්‍ය සම්පන්න පරිසරයක් තුළ සියලු මානව වර්ගයා තමන්ගේ කුසලතා සපුරා ගන්නා බව තහවුරු කිරීම.

**2. පෘථිවිය -**

වත්මන් හා අනාගත පරපුරේ අවශ්‍යතා සඳහා සහාය විය හැකි වන පරිදි තිරසාර පරිභෝජන නිෂ්පාදන හරහා ස්වභාවික සම්පත් තිරසාර කළමනාකරණය සහ දේශගුණික විපර්යාස සඳහා කඩිනම් පියවර ගනිමින්, පෘථිවිය ගෞරවනීය ලෙස ආරක්ෂා කිරීම.

**3.සෞභාග්‍යය -**

සියලු මනුෂ්‍ය වර්ගයා සමෘද්ධිමත් හා තෘප්තිමත් ජීවිත භුක්ති විඳින බව සහ ආර්ථික, සමාජීය සහ තාක්ෂණික ප්‍රගතිය ස්වභාවධර්මය සමග එකතුව සිදුවන බව තහවුරු කිරීම.

**4.සාමය -**

බිය හා ප්‍රචණ්ඩත්වයෙන් තොර සාමකාමී සාධාරණ සියලු දෙනා එක් කරගත් සමාජයක් සඳහා ධෛර්යයක් ලබාදීම.

**5. හවුලේ කටයුතු -**

මෙම අභිමතාර්ථ ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය පහසුකම් සපයා ගැනීමට ගෝලීය සහයෝගීතාවය පදනම් කරගෙන, දිළිඳුකම හා වඩාත් පීඩාවට ලක් වූ ජනතාව කෙරෙහි විශේෂ අවධානයකින් යුතුව තිරසාර සංවර්ධනය සඳහා බල පවත්වන ලද ගෝලීය හවුල් කරුවන් ගෙන් හා සියලු රටවලින් සියලු පාර්ශවකරුවන්ගෙන් හා සියලු ජනතාවගේ දායකත්වය ලබාගෙන ක්‍රියාත්මක වීම.

මේ අනුව තිරසර සංවර්ධන අභිමතාර්ථ 17 ක් ප්‍රකාශයට පත් කර ඇති අතර සෑම එක් එක් අභිමතාර්ථයක් ම ඊට විශේෂිත වූ ඉලක්ක කිහිපයකින් සමන්විතවේ.

තිරසර සංවර්ධන අභිමතාර්ථ 17




1 - සියලු ආකාරයේ දිළිඳු බව සියලු තැන්හි ම දුරු කිරීම.

2 - කුසගින්න දුරලීම, ආහාර සුරක්ෂිතතාව හා පෝෂණ වැඩි දියුණුව ලබා ගැනීම හා තිරසාර කෘෂිකාර්මික ප්‍රවර්ධනය

3 - සෑම වයසකම සියලු දෙනාටම, සෞඛ්‍ය සම්පන්න දිවියක් තහවුරු කරන අතර යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම.

4 - සියල්ලන් සඳහා පරිපූර්ණ හා සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම හා දිවිය පුරාම ඉගෙනුම් අවස්ථා ප්‍රවර්ධනය කිරීම.

5- ස්ත්‍රී, පුරුෂ සමානාත්මතාව ලඟාකර ගැනීම හා කාන්තාවන් හා ගැහැණු ළමයින් සවිබල ගැන්වීම.

6 - සැමට ජලය හා සනීපාරක්ෂක පහසුකම් ලබාගත හැකි බව හා තිරසාර කළමනාකරණය සහතික කිරීම.

7- දැරිය හැකි විශ්වසනීය, තිරසාර හා නවීන බලශක්ති සඳහා සියලු දෙනා ප්‍රවේශය සහතික කිරීම.

8- සියලු දෙනා සඳහා පූර්ණ සහ තිරසාර ආර්ථික වර්ධනයක් සම්පූර්ණ හා ඵලදායී රැකියා හා ගෞරවනීය රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම.

9 - ඔරොත්තු දෙන යටිතල පහසුකම් ඉදිකිරීම, පූර්ණ හා තිරසාර කාර්මීකරණය සහ නව නිපැයුම් ප්‍රවර්ධනය.

10 - රටවල් ඇතුලත හා රටවල් අතර අසමානතාවය අඩු කිරීම.

11- නගර හා මානව ජනාවාස පූර්ණ ආරක්ෂිත ඔරොත්තු දෙන තිරසාර තත්ත්වයට පත්කිරීම.

12 - පරිභෝජන හා නිෂ්පාදන රටාවන්හි තිරසාරත්වය සහතික කිරීම.

13- දේශගුණික විපර්යාස හා ඒවායේ බලපෑම්වලට එරෙහිව හදිසි ක්‍රියාමාර්ග ගැනීම.

14 - තිරසාර සංවර්ධනය සඳහා මුහුදු හා සාගර සම්පත් සුරක්ෂිත ව කල්පවත්නා පරිදි භාවිත කිරීම.

15 - ගොඩබිම් පරිසර පද්ධති තිරසාර ලෙස භාවිත කිරීම, වනාන්තර තිරසාර ලෙස කළමනාකරණය කිරීම, කාන්තාරකරණය වැලැක්වීම හා ඉඩම් අවභාවිතය නැවැත්වීම හා පිළිසකර කිරීම හා ජෛව විවිධත්වය ට හානිවීම නතර කිරීම.

16 - තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී හා සියලු දෙනාම අතුලත්වූ සමාජයක් ප්‍රවර්ධනය කිරීම, සියලු දෙනාටම යුක්තිය සඳහා ප්‍රවේශයක් සැලසීම හා ඵලදායී වගකීමක් සහිත පූර්ණ ආයතන සියලු මට්ටම් සඳහා ඇති කිරීම.

17 - තිරසාර සංවර්ධනය සදහා ගෝලීය සහයෝගීතාවය ක්‍රියාත්මක කළ හැකි විධික්‍රම හා නව පණගැන්වීම් ශක්තිමත් කිරීම.

මෙම තිරසාර සංවර්ධන අභිමතාර්ථ 17 එකිනෙකට ඉතාම සම්බන්ධිත බැවින් ද එකිනෙකට හුදකලාව ක්‍රියාත්මක කළ නොහැකි බැවින් ද විවිධ අංශ ඒකාබද්ධ වී කටයුතු කිරීම 2030 දී එකී අරමුණු සපුරා ගැනීමට පිටිවහලක් වනු ඇත.

**තිරසාර සංවර්ධන අභිමතාර්ථ ළගාකර ගැනීමට පවතින අභියෝගතා**

- ✓ සංවර්ධනය මැනීම සඳහා සාම්ප්‍රදායකව යොදාගනු ලබන ජාතික ආදායම් දත්ත මගින් සංවර්ධන ක්‍රියාවලියේදි වායුගෝලය, ඕසෝන් ස්ථරය, පොසිල ඉන්ධන වැනි වටිනා පාරිසරික සම්පත් කෙරෙහි බලපෑම් සැලකිල්ලට නොගැනීම.
- ✓ පරිසර හෝ සමාජ පැතිකඩ හෝ නොසලකා හුදකලා අත්කර ගන්නා ආර්ථික වර්ධනයක් මගින් තිරසාර සංවර්ධනයක් අත්කර ගත නොහැකිවීම.
- ✓ වර්තමාන ලෝක සංවර්ධනයේ ස්වභාවය අනුව අනාගත පරපුර සඳහා පරිසරය සුරකීම හා සංවර්ධනය පවත්වාගෙන යාමේ අභියෝගාත්මක බව.
- ✓ තිරසාර සංවර්ධන මූලධර්ම මිනිසාගේ වර්තමාන සංවර්ධන ප්‍රයත්න තුල ප්‍රායෝගිකව යථාර්ථයක් බවට පත් නොවීම.

- ✓ සංවර්ධන ව්‍යාපෘතියක් සාර්ථකත්වයට පත්වීම සඳහා ප්‍රජා සහභාගිත්වය ඉහළ මට්ටමින් ලබාගැනීම ප්‍රායෝගිකව නොවීම.
- ✓ සංවර්ධනය වෙමින් පවතින රටවල් තිරසාර සංවර්ධනයක් කරා යන ගමනේ පැන නැගින තවත් ගැටලුවක් වන්නේ අනෙක් සංවර්ධන ඉලක්ක වෙත යොමුවීම හේතුවෙන් දිළිදුබව පිළිබඳ ගැටලුවට ස්ථිර විසඳුමක් ලබාදීම මගහැරී යාම.
- ✓ සංවර්ධනය වෙමින් පවතින රටවල පවතින තවත් ගැටලුවක් වන්නේ තාක්ෂණ අනන්‍යතාවය වීම.
- ✓ තිරසාර සංවර්ධනයක් සඳහා පවතින ආකල්ප වෙනස් කිරීම පහසු නොවීම.
- ✓ සංවර්ධනය වෙමින් පවතින රටවල් මෙන්ම දියුණු රටවල් හා නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන් සැලකීමේදී ද සංවර්ධනය අඛණ්ඩව පවත්වාගෙන යාම අභියෝගාත්මක බව.

මෙවැනි කරුණු රාශියක් නිසා සංවර්ධනය වන රටවලට තිරසාර සංවර්ධනය කරා යාම අභියෝගාත්මක වේ.

# 10. කෘෂි කර්මාන්තයේදී බලපාන ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වෙනස්කම්.

*ඩබ්ලිව්.ආර්.එන්.පී. විජේවර්ධන*
*සංවර්ධන නිලධාරී*
*B.A (General)*

සමාජ නිර්මාණය සමාජයෙන් සමාජයට, රටින් රටට වෙනස් වේ. මානව වර්ග ජාති, ආගම්, කුල, ප්‍රදේශ අනුව ද සමාජ හා සංස්කෘතික වෙනස්වීම් අනුව ද සිදුවේ. එම නිසා ස්ත්‍රී පුරුෂ ලිංග භේදය මෙන් නොව ස්ත්‍රී පුරුෂ සමාජභාවය වෙනස් වනු ඇත. මානව සමාජය ප්‍රධාන වශයෙන් වර්ග දෙකකින් යුක්තය. එනම්, ස්ත්‍රී හා පුරුෂ වශයෙනි. පුරුෂ යන්නට ලොව සෑම සමාජයකම අගය කිරීම සිදු වන්නේ පුරුෂයින් ශාරීරිකව හා මානසික වශයෙන් ශක්තිමත්, එඩිතර ඉක්මන් තීරණ ගතහැකි නායකත්වයන් සහිත කොටසක් ලෙසය. එහෙත් ස්ත්‍රිය සුන්දර, ලාමක පුරුෂයෙකු මත යැපෙන කාරුණික ඉක්මනින් සසල වන හිතක් ඇති ප්‍රජනන කාර්යය මෙන්ම ගෘහාශ්‍රිත සියළු කාර්යයන් ද සමාජය විසින් ස්ත්‍රියට පවර දී ඇත. ඒ අනුව, දරුවන් පෝෂණය කිරීම, රැකබලාගැනිම, ගෙදරදොර කටයුතු, දරුවන්ගේ අධ්‍යාපන කටයුතු, වැඩිමහල්ලන් රැකබලා ගැනීම ස්ත්‍රියට පැවරෙන කාර්යයන් වේ. ඊට වෙනස් ආකාරයට ගෘහයෙන් පිටත ආදායම් ඉපයීමේ කාර්යය පුරුෂයාට පවරා දී ඇත. ගොවිතැන් කටයුතු, වෙළදාම, සමාජ වැඩ කටයුතු ස්ත්‍රියට හා දරුවන්ට රැකවරණය ලබාදිම පුරුෂයාට පැවරෙන කාර්යයන් වේ.

ජීව විද්‍යාත්මකව ස්ත්‍රියට හා පුරුෂයාට ලැබී ඇති ලිංගික වෙනස මත සමාජය විසින් දීර්ග කාලයක් තිස්සේ වෙනස් වූ සමාජ තත්වයන් මෙම දෙපක්ෂය සඳහා නිර්මාණය කර දී ඇත. සමාජය හා සංස්කෘතිය මගින් මෙම බෙදීම සිදු කර දී ඇති අතර සෑම ස්ථරයකදීම දක්නට ලැබේ. ස්ත්‍රියට හා පුරුෂයාට එකිනෙකට වෙනස් වූ ගති ලක්ෂණ අනන්‍යතා, හැසිරීම් රටා, භූමිකා සහ වෘත්තීන් පවා සමාජය විසින්ම නිර්මාණය කර දී ඇත. ස්ත්‍රීන්ට හා පුරුෂයින් පවරා දි ඇති එකී සමාජ සංස්කෘතික තත්වය ස්ත්‍රී පුරුෂ සමාජ භාවය ලෙස තව දුරටත් සරලව හඳුනා ගත හැකිය. මෙය සමාජය විසින් නිර්මාණය කර දී ඇති අතර ලිංගික බව මෙන් ස්වභාවිකව ලැබුණු දෙයක් නොවේ. සංස්කෘතිය ආගම, විශ්වාස ඇදහිලි සහ සිරිත් විරිත් මගින් මෙම තත්ත්වය ස්ථාපිත කර තිබේ.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පවුල තුළ සලකා බැලීමේ දි ස්ත්‍රියට හිමි වන්නේ අප්‍රධාන තැනකි. පුරුෂයාට පවුල තුළ ආධිපත්‍ය බලය හිමිවේ. කවර සමාජයක වුව ද මානව වර්ග, ජාතිය, කුලය හෝ පංතිය ගත්ත ද ස්ත්‍රියට මෙහි අඩු සමාජ බලය හිමි වේ. පවුලක් ලෙස ගත්විට අඩු වරප්‍රසාද, අඩු නිදහස, අඩු අයිතිවාසිකම්, අඩු දේපළ, අඩු බලය හිමි වන්නේ ස්ත්‍රියටය. වැඩි බලය, ආධිපත්‍යය හිමිවන්නේ පුරුෂයාටය.මෙම අසමාන බල බෙදීම පදනම් වී ඇත්තේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයයි.

ජීව විද්‍යාත්මක සත්ත්වයෙකු ලෙස බිළිඳෙකු මෙලොවට බිහිවන තෙක් සමාන වුව ද, බිහි වූ දා සිට සමාජය විසින් බෙදීමකට ලක් කරයි. ඇඳුම් පැළඳුම් තේරීමේදී දුවක් නම් රෝස පාට පුතෙක් නම් නිල් පාට ද, සෙල්ලම් බඩු තේරීමේදි දුවකට නම් බෝනික්කන්, උයන පිහන භාණ්ඩ ලබා දෙයි. පුතෙක් නම් වාහන, තුවක්කු වැනි භාණ්ඩ ලබා දෙයි. ඒ අනුව, දුවට පුතාට වශයෙන් කුඩා කාලයේ සිට පැහැය හා භාණ්ඩ සමාජය විසින් නිශ්චිතවම බෙදා වෙන් කර දී තිබේ. ඒ සමඟම සමාජ වටිනාකමක්ද ආරෝපණය කරයි. එතැන් සිට පවුල තුළ භූමිකාව, රැකියාව වැනි බාහිර සියළු සාධක කෙරෙහි ස්ත්‍රී පුරුෂ බව බලපානු ලබයි.

අතීතයේදි ස්ත්‍රියට හිමි වූයේ දරුවන් සෑදීම, ඔවුන් රැක බලා ගැනීම, ගෘහාශ්‍රිත ඉවුම් පිහුම් කටයුතුත්, පිරිමියාට පවුලේ ආදායම් උත්පාදන කටයුතුත් ප්‍රමුඛ කාර්යයන් විය. නමුත්, බටහිර ආක්‍රමණත් සමඟ ශ්‍රී ලංකාවේ එතෙක් පැවති කෘෂි ආර්ථික රටාවේ වෙනස්කම් ඇති වන්නට විය. පෘතුග්‍රීසීන්ගෙන් ඇරඹි ලන්දේසීන්, ඉංග්‍රීසීන් දක්වා පාලනය තුළ රැකියාව පිළිබඳව, රටේ පැවැති වෙනස්කම්වලට ලක් විය. රාජකාරි ක්‍රමය මත පදනම් වූ සේවා සැපයීම වෙනුවට වැටුප් ගෙවන රැකියා ක්‍රමයක් දක්වා වෙනස් විය. අධ්‍යාපනයේ පැවැති නව ප්‍රවනතා සමඟ කාන්තාවන් ද අධ්‍යාපන අවස්ථා හිමිවීම මත ඔවුන් ද රැකියා සඳහා අවතීර්ණ විය. නිදහසින් පසු ලංකාවේ කාන්තාවන් විවිධ රැකියා ක්ෂේත්‍රවල නිරත විය. 1960 ගණනන් වල සිට 1990 දශකය දක්වා ශ්‍රම බලකායේ සිදු වූ වර්ධනය සලකා බැලීමේදී ස්ත්‍රීන්ගේ රැකියා තත්ත්වයේ කැපී පෙනෙන ඉහළ යාමක් දක්නට ලැබේ. කෙසේ වුවද කාන්තා ශ්‍රම බලකාය පුරුෂ ශ්‍රම බලකායට වඩා වැඩි වේගයෙන් වර්ධනය වීම පසුගිය කාලය තුළ දක්නට ලැබිණි. 1985 දි කාන්තාවන්ගේ ශ්‍රම බලකායේ දායකත්වය 32.8% කි. 1990 වනවිට 37.3% ක් දක්වා වර්ධනය විය. ශ්‍රම දායකත්වය සැලකීමේදී වැඩිම ශ්‍රම දායකත්වයක් සපයන්නේ වතු අංශයේය. පිරිමි පාර්ශවයට වඩා අවුරුදු 20 – 25 වයස් කාණ්ඩයේ කාන්තාවන් අතර ශ්‍රම බලකායෙහි ඉතා ඉහළ අනුපාතයක් ගන්නා ලදි. නිදහස් වෙළඳ කලාප ආශ්‍රිතව මෙන්ම අනිකුත් සේවා අංශ වලද වැඩි කාන්තා දායකත්වයක් පසුගිය වසරවල වර්ධනය වී ඇත. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල වාර්තාවලට අනුව 1962 – 96 නිදහස් වෙළඳ කලාපවල මුළු ශ්‍රමික සංඛ්‍යාව 83.59% කි. පිරිමි සේවක සංඛ්‍යාව 16.145 කි. එසේම, අධ්‍යාපනය සඳහා වැඩි නැඹුරුවක් දැක්වීම, උසස් අධ්‍යාපනය, විශ්ව විද්‍යාල අධ්‍යාපනය දක්වා විශාල සිසුවියන් ප්‍රමාණයක් ප්‍රවේශ වීම තුළ රැකී රක්ෂා වල නියුක්ත ප්‍රමාණය වර්තමානය වනවිට සීග්‍රයෙන් වර්ධනය වී ඇත. විශේෂයෙන් රජයේ රැකියා, ලිපිකාර සේවා, පරිපාලන සේවා, වෛද්‍ය, නීතිඥ වැනි රජයේ ඉහළ තනතුරුවල නියුක්ත කාන්තා ජනගහනය වැඩි වී ඇත.

රටේ ප්‍රධාන ආර්ථික සාධකය කෘෂි කර්මාන්තයය. ගැහැණු හා පිරිමි වශයෙන් දෙපිරිසම කෘෂි කරමාන්තය ආශ්‍රිතව රැකියාවල නියුක්ත බවත්, ප්‍රධාන වශයෙන් කාන්තා පාර්ශවය පිරිමින්ට සාපේක්ෂව කෘෂි කාර්මික කටයුතුවල වැඩි වශයෙන් නියුක්ත බවත් පෙනී යයි. එනම්, තේ, රබර් වතු ආශ්‍රිතව විශාල ප්‍රමාණයක් කාන්තාවන් සම්බන්ධ වේ. තේ, රබර් පැළ තවානේ සිට වල් පැළ නෙලීම, දළු කැඩීම, පොහොර යෙදීම ආදී තේ වතු ආශ්‍රිතව වතුකරයේ විශාල සේවා නියුක්තියක් ඇත්තේ කාන්තාවන්ටය.

නමුත්, කෘෂි කර්මාන්තය ආශ්‍රිත ස්ත්‍රීන්ට වැඩ බෙදීම, වැටුප් ගෙවීම ආදිය වෙනස් කොට සලකනු ලබයි. රජයේ රැකියාවල උදා: පරිපාලන සේවා, ලිපිකරු, ගුරු වෘත්තිය, වෛද්‍ය වැනි වෙනත් ඕනෑම වෘත්තියකදී ගෙවන වැටුප, වැඩ බෙදීම් ස්ත්‍රී පුරුෂ බව නොසලකා ලබා දුන්නත් කෘෂි කර්මාන්තයේදී ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙනස්කම් වලට භාජනය වී ඇත. විශේෂයෙන්ම කාන්තාවන්ගේ දෛනික වැටුප පුරුෂයා හා සමාන නොවේ. වතු ක්ෂේත්‍රයේදී ද කාන්තාවන්ට අඩු වැටුප් හා පිරිමින්ට වැඩි වැටුප් ලබා දේ. වැඩ බෙදීමේදී ද රාජ්‍ය හා පෞද්ගලික අංශයේ මෙන් නොව සමාජයේ පිළිගත් සම්ප්‍රදායක් මත කටයුතු සිදු වේ. බර වැඩ, යන්ත්‍ර සූත්‍රවල වැඩ වෙළෙඳපොළ කටයුතු පිරිමියාට අයිති කටයුතු බවටත්, වල්පැළ නෙලීම, පැළ තවාන් කිරිම, පැකට් කිරිම වැනි කටයුතු ස්ත්‍රියට උරුම වී ඇත. නමුත්, සිදුවිය යුත්තේ ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කර ගත් වැඩ බෙදීමක් හෝ වැටුප් ගෙවීමකට වඩා හැකියාව දක්ෂතාවය පදනම් කරගත් ක්‍රමයකි.

**කෘෂි කර්මාන්තය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය වෙනස් කොට සලකන අවස්ථා.**

- ගොවි සංවිධානවල අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ තීන්දු තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ කාන්තා නියෝජනය අඩුවීම.
- වෙළෙඳපොල ගණුදෙනු කටයුත සඳහා කාන්තා දායකත්වය අවම වීම.
- වැටුප් ගෙවීමේදී ඇතැම් කෘෂි කාර්මික කටයුතුවල කාන්තාවන්ට අඩු වැටුපක් සහ පිරිමින්ට වැඩි වැටුපක් ගෙවීම.
- වැඩ බිමේදී හා ප්‍රවාහනයේදී සිදුවන ලිංගික හිංසන.
- පීතෘ මූලික සමාජ ක්‍රමය තුළ පවතින ගැහැණු වැඩ හා පිරිමි වැඩ යන බෙදීම නිසා කාන්තාවන්ට කෘෂි කාර්මික කටයුතුවලට අමතරව නිවසේ වැඩද කිරීමට බොහෝවිට සිදු වීම. පුරුෂයන් ගෘහ කටයුතුවලින් නිදහස් වීම.
- පිරිමියා පවුලේ ප්‍රධාන ආදායම් උපයන්නා යන මතය සමාජගතවීම මත ස්ත්‍රිය වගකීමෙන් බැහැර වීම.
- ඉඩම් හිමිකාරීත්වය බොහෝවිට පිරිමියා සතු වීම.

ඉහත දැක්වූ ස්ත්‍රී පුරුෂ බව මත පදනම් ව සිදු කරණු ලබන වෙනස්කම් වලට අමතරව තවත් බොහෝ වෙනස්කම් කෘෂි කර්මාන්තයේදී සිදු වේ. නමුත් ස්ත්‍රී පුරුෂ භාවය මත සිදු කරන සම්ප්‍රදායික සමාජ මතය තුළ ගැටළුකාරි තත්ත්වයක් උද්ගත වේ. ඒවා අවම කිරීම සඳහා පහත සඳහන් පියවර අනුගමනය කල හැකිය.

- ගැහැණුවීම සහ පිරිමිවීම මත වැඩ බෙදීම වෙනුවට දක්ෂතාවය හා හැකියාව අනුව වැඩ කටයුතු කිරීම.
- ගොවි සංවිධාන අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා කාන්තා නියෝජනය ලබා දීම. තීන්දු තීරණ ගැනීමේදී සම නියෝජනය.
- වැටුප් ගෙවීමේදි ගැහැණු පිරිමි බව මත නොව සිදු කරන වැඩ ප්‍රමාණය හා වේලාව අනුව වැටුප් ගෙවීම හෝ සමාන වැඩ සඳහා සමාන ගෙවීමක් කිරීම.
- නිවසේ වැඩ කටයුතු පිරිමි ගැහැණු භේදයකින් තොරව සිදු කිරීම හා පිරිමින් ද ගේ දොර වැඩ කිරීමට ඉගෙන ගැනීම.
- කාන්තාවන්ට ආර්ථික හා වෙළෙඳපොල කටයුතු පිළිබඳ ව්‍යවසායිකාවක් වීම සඳහා දැනුම ලබාදීම.

කෘෂි කර්මාන්තයේ, කෘෂි වෙළෙඳපොල තුළ සහ එදිනෙදා කටයුතු වලදී ස්ත්‍රී පුරුෂ භාවය පදනම් වූ වෙනස්කම් සිදුකිරීම්වලින් තොරව ගෞරවය, හැකියාව, හා දක්ෂතාවය පදනම් කරගත් ක්‍රියාකාරකම් සිදු කිරීම වැදගත් වේ.

# 11. සංවර්ධන සැලසුම්කරණය යනු කුමක්ද

ඩබ්ලිව්.ඩී.නිහාල් වීරසූරිය
පුහුණු හා පර්යේෂණ නිලධාරි
M.A. (Sociology)

සංවර්ධන සැලසුම්කරණය යනු කුමක්ද යන්න පැහැදිලි කරගැනීමට පෙර සැලසුම්කරණය කුමක්ද යන්න අවබෝධ කරගැනීම වැදගත් වේ. සරලව ගතහොත් අනාගතයේදී කලයුතු ඕනෑම කටයුත්තක් වඩාත් හොඳින් ඉටු කර ගැනීම සඳහා කල්තියා සූදානම් වීම අවශ්‍ය වේ. තවත් විදිහකින් කිවහොත් කල්තියා සැලසුම් කර කටයුතු කිරීම සැලසුම්කරණය ලෙස අර්ථකථනය කළ හැකිය.

පිළිවෙලකට අනුව නිශ්චිත අරමුණු ඉටුකර ගැනීම සඳහා සැලසුමකට යටත්ව කටයුතු කළ යුතු වේ. මෙය පුද්ගල ජීවිතයේ අනිවාර්ය අංගයකි. සාම්ප්‍රදායික සමාජය සැලසුම්කරණය පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයක් පැවැති අය නොවෙයි. යමක් සැලසුම් කිරීමට අවශ්‍ය නම් ගමේ සිටි මුලාදෑනි එනම් නිල වශයෙන් වගකිව යුතු පුද්ගලයෙකු හරහා එය සිදු කර ඇත. උදාහරණ ලෙස ගතහොත් දේශගුණය අනුව කුඹුරු වගා කිරීමට පෙළඹීම. වියළි කාලයේ දී ගොවිතැන කළ නොහැකි නිසා හේන් වගා කර ඇත. ගොවිගම කුලයේ අය එක් තැනකත් අනෙක් කුලවල අය තව තැනකත් වගා කිරීම සිදු කර ඇත. ගම තුළ සිටින දෛවඥයා ළඟට ගොස් සුබ වේලාවක් බලා කටයුතු කිරීම සිදු කර ඇත. නැකත් පත්‍ර සකසන කටයුතු නැකතට අනුව සිදු කළේය. තවද ගම තුළ වැඩිහිටි මතධාරීන් සිටින නිසා ඔවුන්ගෙන් උපදෙස් ලබා ගැනීම සිදු විය.

සම්ප්‍රදායික සමාජය එසේ වුවද නූතන පුද්ගලයින් තාර්කිකව සිතීමට හා ඒ අනුව කටයුතු කිරීමට පෙළඹී ඇත. මේ වන විට බොහෝ දේ ආයතන ගත වී ඇත. ගම්මුලැදෑනි විසින් සිදු කරන ලද දෙය අද වන විට ග්‍රාම නිලධාරි මහතා විසින් සිදුකරනු ලබයි. ඔහු සෘජුවම රාජ්‍ය පරිපාලනය හා සම්බන්ධ වේ.

සංවර්ධන සැලසුම්කරණය යන්න විමර්ශනය කිරීමේ දී ජවහල්ලා නේරුගේ ප්‍රකාශය කෙරෙහි අවධානය යොමු කළ හැක. "සංවර්ධන සැලසුම්කරණය යනු විවිධ කරුණු හා අවස්ථාවන් හොඳින් විමර්ශනය කරමින් පවත්නා සමාජ ප්‍රශ්නයකට විසඳුම් සොයා ගැනීමේ බුද්ධිමය අභ්‍යාසයකි." ඒ අනුව සැලසුම්කරණය යනු බුද්ධිමය අභ්‍යාසයකි. ගැටලුවක් හෝ ප්‍රශ්නයක් තිබෙන අවස්ථාවක එයට විසඳුමක් සොයා ගැනීමේ අරමුණින් යම්කිසි පුද්ගලයෙකු හෝ පිරිසක් විසින් බුද්ධිමය අභ්‍යාසයක හෝ ක්‍රියාවලියක යෙදේ. ඒ බුද්ධිමය ක්‍රියාවලිය හරහා නිශ්චිත අරමුණ ගොඩනගාගෙන මේ ප්‍රශ්නයට විසඳුම් සෙවිය යුත්තේ කුමන ආකාරයෙන් ද යන්න පිළිබඳ ව එකිනෙකා සාකච්ඡා කරනු ලබයි. එය තනි පුද්ගලයෙකුගේ වැඩක් ලෙස ගත නොහැක. විවිධ විශේෂඥයින් ගණනාවක් එකට වාඩි වී සාකච්ඡා කර සුදුසුම ක්‍රමය මේ යැයි කියා තර්ක කිරීම තුළින් මතු කර ගනු ලැබූ වැඩපිළිවෙළක් සැලැස්මක් යනුවෙන් හඳුන්වනු ලබයි. මෙම සමස්ත ක්‍රියාවලිය සැලසුම්කරණය ලෙස හඳුන්වයි.

සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේදී එයට ඉංජිනේරුවන්, සමාජ විද්‍යාඥයින්, පරිසරවේදීන්, පරිසරය පිළිබඳ නීතිඥයින්, නීතිවේදීන්, වාස්තු විද්‍යාඥයින්, භූගර්භ විද්‍යාඥයින්, සංඛ්‍යාන වේදීන්, තොරතුරු හා සන්නිවේදන විශේෂඥයින් වැනි විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන විශේෂඥයින් එකතුවී සැලසුම් ගොඩ නගනු ලබයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය සංවර්ධන සැලසුම්කරණය යන්න සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති නිර්වචන පහත පරිදි දැක්විය හැකිය. "සංවර්ධන සැලසුම්කරණය යනු ආර්ථික වර්ධන වේගය ඉහළ දමා ගැනීමේ අරමුණ ඇතිව කිසියම් වූ සචේතනික උත්සාහයයකින් තොරව ක්‍රියාවට නැගිය හැකි රජය විසින් ක්‍රියාවට නගනු ලබන ඕනෑම ක්‍රියාවකි. "සංවර්ධන සැලසුම්කරණය යනු යම් සමාජයක ජීවත්වන සාමාජිකයින්ගේ අවශ්‍යතාවයන් මේ යැයි හඳුනා ගනිමින් එම අවශ්‍යතා අතරින් ප්‍රමුඛතාවය ලබාදිය යුතු වන්නේ කුමකට දැයි තීරණය කරමින් එම අවශ්‍යතා ඉටුකර ඉටු කර ගැනීම සඳහා ඇති සම්පත් මේ යැයි තීරණය කරමින් එම සම්පත් අරපිරිමැස්මෙන් ප්‍රයෝජනයට ගනිමින් ප්‍රශස්ත ප්‍රයෝජනයක් ලබා ලබා ගන්නේ කෙසේ දැයි පෙන්වා දෙනු ලබන වැඩපිළිවෙළකි."

**සැලසුම්කරණයේදී වැදගත් වන ප්‍රධාන කරුණු**

1.අවශ්‍යතා හා ගැටළු මොනවාදැයි හඳුනා ගැනීම සහ ඒ පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කිරීම.

2. ප්‍රමුඛතාකරණය නැතහොත් ප්‍රමුඛත්වය දිය යුතු වන්නේ කුමන අවශ්‍යතාවය හෝ ගැටලළුවලටද යන්න තීරණය කිරීම.

3. අවශ්‍යතා හෝ ගැටළු විසඳාගැනීම සඳහා තමන්ට ඇති සම්පත් මොනවාදැයි විමසා බැලීම

4. නව අවශ්‍යතාවයන් හෝ ගැටළු විසඳාගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාකාරකම් නැතහොත් වැඩපිළිවෙලවල් මොනවාදැයි හඳුනා ගැනීම.

5. අදාළ වැඩපිළිවෙලවල් හෝ ක්‍රියාකාරකම් සඳහා කොතරම් කාලයක් වැය වෙන්නේ දැයි විමසා බැලීම.

6. සම්පත් යෙදවීම හා අරපිරිමැස්මෙන් ප්‍රයෝජනයට ගැනීම.

7. ක්‍රියාකාරකම්වල ප්‍රගතිය තක්සේරු කරමින් ප්‍රයෝජනයක් වෙත ගමන් කිරීම.

8. සාර්ථක /අසාර්ථක අත්දැකීම් මීළඟ සැලසුම් උදෙසා ප්‍රයෝජනයට ගැනීම.

සංවර්ධන සැලසුම්කරණයේදී සැලසුම් වර්ග පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම වැදගත්වේ. සැලැස්මෙන් ආවරණය වන ප්‍රමාණය අනුව සැලසුම් වර්ග තුනක් පැහැදිලි කර ගත හැකි වේ.

1. ග්‍රාමීය සංවර්ධන සැලසුම්
2. ප්‍රාදේශීය සංවර්ධන සැලසුම්
3. ජාතික සංවර්ධන සැලසුම්

ග්‍රාමීය සංවර්ධන සැලසුම්කරණයේ දී ගමේ පවතින ගැටළු ලෙස පාරවල් සැදීම, විදුලිය සම්පාදනය, ඇළවේලි සැකසීම ආදිය ඇතුළත් වේ. ප්‍රාදේශීය සංවර්ධන සැලසුම්කරණයේ ප්‍රාදේශීයව බලපාන ගැටළුවලට

සැලසුම් සකස් කෙරේ. කිරි නිෂ්පාදනය, පොල්, රබර් වැනි වෙළෙඳ භෝග පදනම් කරගත් ගැටලුවලට සැළසුම් සැකසේ. රටක ජාතික සංවර්ධන සැලසුම්කරණයේදී කෘෂිකර්මාන්ත, කර්මාන්ත, අධ්‍යාපන, සෞඛ්‍ය, ප්‍රවාහනය, සමාජ සුභසාධනය, පරිසරය වැනි පොදු ප්‍රතිපත්ති මත ක්‍රියාත්මක වන විෂයන් අයත් වේ. බලශක්තිය, සංචාරක, කර්මාන්ත, වෙළෙඳාම හා වරායවල් වැනි දෑ අදාළ වේ. සංවර්ධන සැලසුම්කරණයේ දී ඉලක්ක කරනු ලබන දේ පිළිබඳව එනම් සැලසුමෙහි ඇති මූලික අරමුණු මත එය කොටස් දෙකකට සාකච්ඡා කළ හැකිය.

1 සම්පත් මූලික කරගත් සංවර්ධන සැලසුම්කරණය.

2. ගැටළු හෙවත් ප්‍රශ්න මුල්කරගත් සැලසුම්කරණය.

මෙහිදී සම්පත් ප්‍රධාන වශයෙන් කොටස් තුනකි. ස්වභාවික සම්පත්, මානව සම්පත් හා භෞතික සම්පත්ය. මේවා පදනම් කරගෙන සංවර්ධන සැලසුම් සකස් කර ගත හැකිය. උදාහරණයක් ලෙස සූර්ය තාපය, මත්ස්‍ය සම්පත වැනි දෑ පදනම් කරගනිමින් සංවර්ධන සැලසුම් සකස් කර ගත හැකිය. ගැටලු හෙවත් ප්‍රශ්න මුල්කරගත් සැලසුම්කරණය යනු රටේ ජනතාව මුහුණපාන ප්‍රධාන ගැටලු විසදීමට සකසනු ලබන සැලසුම්ය. උදාහරණයක් ලෙස විරැකියාව සඳහා නිදහස් වෙළෙඳ කලාපය පිහිටුවීම.

කාලය පදනම් කරගෙන සංවර්ධන සැලසුම් කොටස් තුනකින් දැක්විය හැකිය.

1. කෙටි කාලීන සංවර්ධන සැලසුම්
2. මධ්‍ය කාලීන සංවර්ධන සැලසුම්.
3. දිගුකාලීන සංවර්ධන සැලසුම්

අවුරුදු එකක් දෙකක් අතර කාලයක් සඳහා සකසන සැලසුම් කෙටිකාලීන සැලසුම් වන අතර අවුරුදු 5ක් දක්වා සකසන සැලසුම් මධ්‍ය කාලීන සැලසුම් වන අතර අවුරුදු 10, 20 හෝ ඊට වැඩි කාලයක් සඳහා සකසන සැලසුම් දිගුකාලීන සැලසුම් ලෙස හැඳින්විය හැකිය.

තවද සංවර්ධන ක්‍රියාවලියට ජනතාව සහභාගීවන ආකාරය අනුව කොටස් දෙකකට පැහැදිලි කළ හැකිවේ.

1. ජනතාව සඳහා සැලසුම්කරණය
2. ජනතාව සමඟ සැලසුම්කරණය

මෙහිදී විවිධ ක්ෂේත්‍රවල විශේෂඥයින් විසින් ජාතික වශයෙන් බලපානු ලබන ප්‍රශ්න ගැටලු සඳහා සැලසුම් සකස් කිරීම ජනතාව සඳහා සැලසුම්කරණය ලෙසද ග්‍රාමීය වශයෙන් හා ප්‍රාදේශීය වශයෙන් බලපානු ලබන ගැටළු සඳහා සැලසුම් සකස් කිරීමේදී ප්‍රජාවගේ දායකත්වය ඒ සඳහා යොදා ගැනීම ජනතාව සමඟ සැලසුම්කරණය ලෙස අර්ථ දැක්විය හැකිය. මේ අනුව පැහැදිලි කර ගත හැකි කරුණ වන්නේ අනාගතයේ දී කලයුතු ක්‍රියාකාරකමක් හෝ ක්‍රියාකාරකම් සමූහයක් හෝ සැලසුම්කරණය කිරීමෙන් එය වඩාත් හොඳින් ඉටු කළ හැකි බවයි. ඒ අනුව සැලසුම්කරණය මගින් පුද්ගලයකුට හෝ ආයතනයකට හෝ ක්‍රමයකට හෝ නැතහොත් පද්ධතියකට හෝ රටක් නැතිනම් ජාතියකට අත්කර ගත හැකි ප්‍රයෝජන රාශියකි. එම ප්‍රයෝජන වන්නේ

- අනාගතයේ ඉටුකරගත යුතු අභිමතාර්ථ කල්තියා තීරණය කරගත හැකි වීම.

- එම අභිමතාර්ථවලට ලඟා වීම සඳහා සාක්ෂාත් කරගත යුතු අරමුණු හා සුවිශේෂ අරමුණු නිශ්චිත කරගත හැකිවීම.
- කළ යුතු දේවල් හෙවත් ක්‍රියාකාරකම් කල්තියා සැලසුම් කරගත හැකි වීම.
- මේ නිසා තනි පුද්ගලයකුට හෝ කණ්ඩායමකට හෝ ආයතනයකට හෝ රටකට හෝ අනාගතය පිළිබඳ වඩාත් ඒ ස්ථිරසාර තීරණවලට එළැඹ එම තීරණවලට අනුව කටයුතු කළ හැකිවීම.
- ශ්‍රමය, මුදල්, කාලය හා භෞතික සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබාගත හැකිවීම.
- සැලසුම් කළ ක්‍රියාකාරකම් හරිහැටි ඉටු ඉටුවේදැයි නියාමනය කරමින් ප්‍රති සැලසුම් කරමින් අරමුණු කරා ලඟාවිය හැකිවීම.
- අපේක්ෂිත අභිමතාර්ථ , අරමුණු හා නිශ්චිත අරමුණු ඉටුවේදැයි ඇගයීමක් කළ හැකිවීම.

ආදි ප්‍රයෝජන රැසක් සැලසුම්කරණය මගින් අත් කර ගැනීමේ හැකියාව ඇත.

# 12. ක්ෂුද්‍ර මූල්‍ය යනු කුමක්ද, දිළිඳුකම පිටුදැකීමේ උපාය මාර්ගයක් ලෙස එය ක්‍රියා කරන්නේ කෙසේද?

*ආචාර්ය, ඊ. එම්. ඩබ්. ඩබ්. එන්. එස්. බී. ඒකනායක*
*සංවර්ධන නිලධාරි*
***PhD. (Sociology )***

**ක්ෂුද්‍ර මූල්‍ය යනු** අඩු ආදායම්ලාභීන් සහ ව්‍යාපාර වර්ධනය කිරීමට උනන්දු වන ව්‍යවසායකයින් සඳහා ණය, රක්ෂණ, මුදල් හුවමාරු හා ඉතුරුම් වැනි මූල්‍ය සේවා, ව්‍යාපාර සංවර්ධන සේවා පහසුකම් සැපයීම ලෙස සරලව හැඳින්විය හැකිය. ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් - සමාගම්, බැංකු, රාජ්‍ය නොවන සංවිධාන, සමුපකාර සමිති, බැංකු නොවන මූල්‍ය ආයතන හෝ වෙනත් නීතිමය නියාමන ආයතන මගින් ලබා දිය හැකිය. ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් අතර ක්ෂුද්‍ර මූල්‍ය ණය සඳහා මූලික හා වැදගත් ස්ථානයක් හිමිවන අතර, සාපේක්ෂ වශයෙන් කුඩා ප්‍රමාණයේ මූල්‍යමය අගයකින් යුත් ණය, අඩු ඇපකර අවශ්‍යතා හා කෙටි ආපසු ගෙවීමේ කාල සීමාව එහි ලක්ෂණ වේ.

**එය වැදගත් වන්නේ ඇයි ?**

බොහෝ කුඩා ව්‍යාපාර හිමියන්ට, විශේෂයෙන්ම ගම් මට්ටමේ ව්‍යවසායකයින් හට බැංකු සමග ණය ගනුදෙනු සිදුකර ඉතිහාසයක් නොමැති නිසා ඔවුන්ට බැංකු සහ ප්‍රධාන මූල්‍ය ආයතනවලින් ණය සහ වෙනත් මූල්‍ය සේවා ලබාගැනීම දුෂ්කර කටයුත්තකි. බොහෝ විට, අඩු ආදායම්ලාභීන්ට බැංකු සහ ප්‍රධාන මූල්‍ය ආයතනවලින් නියම කරනු ලබන ඇප අවශ්‍යතා සම්පූර්ණ කිරීමට නොහැකි වීම හේතුවෙන් අනාගත ආයෝජන සඳහා ණය මුදලක් සාමාන්‍ය බැංකුවකින් අයදුම් කළ නොහැක. අඩු ආදායම් සහිත පුද්ගලයින් හට පහසුවෙන් ණය මුදලක් ලබාගැනීමට හැකිවීම ඔවුනගේ ජීවනෝපාය ගොඩනගා ගැනීමට අත්‍යවශ්‍ය වන ප්‍රාග්ධනය සපයා ගැනීමට උපකාර වන බැවින් එය ඉතා වැදගත් වේ.

**ක්ෂුද්‍ර මූල්‍යකරණයේ ඉතිහාසය**

ක්ෂුද්‍ර මූල්‍ය සංකල්පය 70 දශකයේ බංග්ලාදේශයේ මොහොමඩ් යුනුස් විසින් ආරම්භ කරන ලදී. ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයකු වන මොහොමඩ් යුනුස් අඩු ආදායම්ලාභීන්ට ස්වයං රැකියා ආරම්භ කිරීමට හා ඒවායේ ආදායම ඉහළ නැංවීම මගින් දරිද්‍රතාවය අඩු කිරීමට කුඩා ණය ලබා දීමට පටන් ගත්තේය. මෙම ක්‍රියාවලිය සංවිධානාත්මකව වේගවත් කිරීම සඳහා 1983 දී ඔහු ග්‍රාමීන් බැංකුව ආරම්භ කළ අතර එය වර්තමානය වනවිට බංග්ලාදේශයේ ගම්මාන 70,000 කට වඩා වැඩි සංඛ්‍යාවක ක්‍රියාත්මක වේ. වර්තමානයේ, සංවර්ධනය වෙමින් පවතින රටවල සහ සංවර්ධිත රටවල ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය සංකල්පය බැංකු සහ පෞද්ගලික මූල්‍ය ආයතන තුළ භාවිත වේ.

**එය ක්‍රියා කරන්නේ කෙසේද?**

ක්ෂුද්‍ර මූල්‍යකරණය දරිද්‍රතාවයට එරෙහි සටනේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. අඩු ආදායම්ලාභී පවුල්වලට ඔවුන්ගේ මූල්‍ය අරමුණු සාක්ෂාත් කර ගනිමින් දරිද්‍රතාවය අවමකර ගැනීමට අවශ්‍ය ආර්ථික කටයුතු ගොඩනගා ගැනීමට උපකාර කරයි. ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සහ මූල්‍යමය වශයෙන් ස්වාධීන වීමට අවශ්‍ය ප්‍රාග්ධනය සපයාදීමට සහය වේ. අඩු ආදායම්ලාභීන්

දුරස්ථ සහ දුෂ්කර ප්‍රදේශවල ජීවත්වීමත්, ඔවුන්ගේ ගනුදෙනු කුඩා වීමත් හේතුවෙන් බොහෝ නිත්‍ය බැංකු සහ මූල්‍ය ආයතන අඩු ආදායම්ලාභීන් වෙත ණය ලබාදීම ඉහළ අවදානමක් සහ ඉහළ පිරිවැයක් සහිත කටයුත්තක් ලෙස දකියි.

ක්ෂුද්‍ර මූල්‍යකරණය මගින් අඩු ආදායම්ලාභී පවුල්වලට ව්‍යාපාර ආරම්භ කිරීමට, ඔවුන්ගේ ඉපයීම් ස්ථාවර කිරීමට සහ අනාගතය සඳහා ඉතිරි කිරීමට නිරන්තරයෙන් දිරිගැන්වීම් ලබාදේ. ක්ෂුද්‍ර මූල්‍යකරණ මැදිහත්වීම් මගින් ව්‍යාපාර හිමිකරුවන්ට යහපත් ආදයම් ලැබෙන කාලවල දී වර්ධනය වීමට සහ සාර්ථක වීමට උපකාර කරන අතර, ඒවායේ අර්බුදකාරී කාලවල දී බිඳවැටීම් වළක්වා ගැනීමට සහ නැවත ගොඩනැඟීමට මූල්‍ය හා මූල්‍ය නොවන පහසුකම් සපයයි. එබැවින් මූල්‍යමය වශයෙන් ආන්තික වූවන්ට දරිද්‍රතා චක්‍රය අවසන් කිරීමට, ඉපැයීමේ ශක්තිය ඉහළ නැංවීමට සහය ලබාදෙන සහ විරැකියාව අඩු කිරීමට දායකවන විශිෂ්ට ක්‍රමයක් ලෙස ක්ෂුද්‍ර මූල්‍යකරණය ප්‍රශංසාවට ලක් වේ. සමස්තයක් වශයෙන් නිසි ලෙස එය භාවිත කරන විට දුප්පත් සහ සමාජාර්ථිකමය වශයෙන් දුර්වල කොටස සඳහා අත්‍යවශ්‍ය මෙවලමක් ලෙස සේවය කළ හැකිය.

**ක්ෂුද්‍ර මූල්‍යකරණයේ ප්‍රතිලාභ**

- **ක්ෂණික අරමුදල් වෙත ප්‍රවේශය**

ක්ෂුද්‍ර මූල්‍යකරණය අඩු ආදායම්ලාභී හෝ රැකියා විරහිත පුද්ගලයන්ට නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හෝ පවත්නා ව්‍යාපාර වර්ධනය කර ගැනීමට අවශ්‍ය සම්පත් සොයා ගැනීමට අරමුදල් ලබා ගැනීම සඳහා අවස්ථා සලසයි. ක්ෂුද්‍ර මූල්‍ය ආයතන විසින් ප්‍රධාන ධාරාවේ බැංකු මගින් නොසලකා හරින ලද හෝ නුසුදුසු යැයි සැලකෙන අයට සාධාරණ නියමයන් සහ කොන්දේසි මත මූල්‍ය විසඳුම් සපයයි. ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල ඉලක්කය වන්නේ බැංකු නොමැති පුද්ගලයින්ට කුඩා ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හෝ පවත්වා ගැනීමට උපකාර කිරීම, ඔවුන්ගේ හදිසි මූල්‍ය ගැටලු විසඳීම සහ අනාගතය සඳහා මුදල් ඉතිරි කිරීමට පෙළෙඹවීම යි.

- **රැකියා අවස්ථා නිර්මාණය සඳහා දායකවීම**

කුඩා ව්‍යවසායකයින් තම ව්‍යාපාර ආරම්භ කිරීමට හා වර්ධනයට ක්ෂුද්‍ර මූල්‍ය ආධාර ලබා ගන්නා විට, එහි ප්‍රතිඵල ලෙස භාණ්ඩ හා සේවා නිෂ්පාදනය ඉහළ යාමෙන් සමාජයේ අනෙක් අයට රැකියා අවස්ථා නිර්මාණය කරයි. මෙම රැකියා හරහා ආදායමක් උපයා ගන්නා බැවින් දුප්පතුන්ට මෙන්ම දේශීය ආර්ථිකයට ද එය ප්‍රයෝජනවත් වේ.

- **සමාජයෙන් නොසලකා හරින ලද පුද්ගලයින් සඳහා ණය ලබාගැනීමේ පහසු ප්‍රවේශය**

ක්ෂුද්‍ර මූල්‍ය ආයතන මගින් සාමාන්‍ය බැංකු සේවාවලින් අවධානයට ලක් නොවන අය සඳහා අරමුදල් සපයයි. එසේම, බොහෝ විශාල මූල්‍ය ආයතන සහ බැංකු කිසිදු ආදායමක් නොමැති හෝ සුළු හෝ වත්කමක් ඇති පුද්ගලයින්ට ණය ලබා නොදේ. ක්ෂුද්‍ර මූල්‍ය සමාගමක් හෝ ආයතනයක් මූලික වශයෙන් අවධානය යොමු කරනුයේ රැකියා විරහිත පුද්ගලයන්, කාන්තාවන්, දිළිඳු හෝ අඩු ආදායම්ලාභීන් සහ ආබාධිත පුද්ගලයන් කෙරෙහි ය. කුඩා ව්‍යවසායකයින් සඳහා, ඔවුන්ගේ ණය ඉතිහාසය පෙන්වීමට ඔවුන්ගෙන් ඉල්ලා නොසිටින බැවින් ක්ෂුද්‍ර ණයක් සඳහා අයදුම් කිරීම පහසුය.

- **අනාගත ආයෝජන සඳහා ඇති හැකියාව**

දරිද්‍රතාව, අඩු පහසුකම් සහිත පුද්ගලයන්ගේ දියුණුවට බාධා ඇතිකරන නිත්‍ය චක්‍රයක් විය හැකිය. මුදල් නොමැතිකම නිසා ජලය සහ ආහාර හිඟය, මන්දපෝෂණය සහ රෝගාබාධ වැනි දුෂ්කර තත්වයන් ඇති විය හැක. ක්ෂුද්‍ර මූල්‍ය ණය මගින් අපේක්ෂා කරන්නේ අඩු පහසුකම් සහිත පුද්ගලයින්ට අරමුදල් ලබා දීමෙන් ආදායම් ඉපයීමේ හැකියාව වර්ධනය කර මෙම චක්‍රය බිඳ දැමීම යි. අරමුදල් සඳහා පහසු ප්‍රවේශය යනු දුප්පතුන් ගේ ජීවිතයේ මූලික අවශ්‍යතා සපුරාලීම යි. එබැවින්,

සනීපාරක්ෂාව, සෞඛ්‍ය සේවා, ළමා අධ්‍යාපනය සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම කෙරෙහි ඔවුනට අවධානය යොමු කළ හැකිය.

ක්ෂුද්‍ර ණය, ක්ෂුද්‍ර ඉතුරුම් සහ ක්ෂුද්‍ර රක්ෂණ ඇතුළු විවිධ පැතිකඩ සහිත ක්ෂුද්‍ර මූල්‍යකරණය, ලොව පුරා ආර්ථික වර්ධනයට සහ දරිද්‍රතාව අවම කිරීමට උපකාර වන ආකාරය ඉහත කරුණු අනුව පැහැදිළි වේ. ක්ෂුද්‍ර මූල්‍යකරණයේ දිශානතිය අඩු ආදායම්ලාභීන්ට ණය දීමේ සිට සමාජ සංවර්ධනය සහ ආයතනික මූල්‍ය තිරසාරත්වය යන ද්විත්ව ඉලක්ක කරා ගමන් කිරීම දක්වා වර්තමානයේ වෙනස්ව ඇත. සංවර්ධනය වෙමින් පවතින සහ සංවර්ධිත ආර්ථිකයන් තුළ ක්ෂුද්‍ර මූල්‍යකරණය සාම්ප්‍රදායික මූල්‍යනයේ පැවැති ඇතැම් ගැටළු සඳහා සාර්ථක විකල්පයක් ඉදිරිපත් කරයි. මේ හේතුවෙන් ක්ෂුද්‍ර මූල්‍යකරණය එම රටවල වඩාත් වැදගත් සංවර්ධන උපාය මාර්ගයක් ලෙස පිළිගෙන ඇත.

ගෝලීය ආර්ථිකය තුළ ක්ෂුද්‍ර මූල්‍යකරණය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. එය අඩු පහසුකම් සහිත ප්‍රජාවන්ට මූල්‍යකරණය සඳහා ප්‍රවේශය සපයන අතර ලෝකයේ වඩාත්ම දිළිඳු අයගේ ආර්ථික ජීවනෝපාය වැඩිදියුණු කරයි. ක්ෂුද්‍ර මූල්‍යකරණය නව ව්‍යාපාර විවෘත කිරීමට සහ ක්ෂුද්‍ර ව්‍යවසායන් වර්ධනය වීමට පහසුකම් සපයා දෙනු ලබයි. එමගින් ඔවුනගේ ජීවිත වෙනස් කිරීම මගින් ආර්ථිකය උත්තේජනය කරයි. මේ හේතුවෙන් ක්ෂුද්‍ර මූල්‍යකරණය දරිද්‍රතාවයට එරෙහිව සටන් කිරීම සඳහා ඇති වැදගත් මෙවලමක් ලෙස ජාත්‍යන්තරව පිළිගෙන ඇත.

බොහෝ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන විසින් පිරිමින්ට වඩා ඵලදායී ලෙස ණය ආපසු ගෙවීමට කාන්තාවන් නැඹුරු වන බව සොයාගෙන ඇත. කාන්තාවන්ට තමන් වෙනුවෙන්, තම ව්‍යාපාර සඳහා සහ තම පවුල සඳහා සිහින හා අභිලාෂයන් ඇත. ලොව විශාලතම ක්ෂුද්‍ර මූල්‍ය ආයතනය වන ග්‍රාමීන් බැංකුවේ ණය ගනුදෙනුකරුවන්ගෙන් සියයට 90කට වඩා කාන්තාවන්ය. බොහෝ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන කාන්තා සේවාදායකයින් සමඟ හවුල් වීමේ උනන්දුව පෙන්නුම් කරයි. මෙය සමාජ වෙනසක් ඇති කිරීමට විශාල විභවයක් ලබා දෙයි. ක්ෂුද්‍ර මූල්‍ය මගින් කාන්තාවන් සවිබල ගන්වන්නේ ඔවුන්ගේ තීරණ ගැනීමේ බලය වැඩිකර ඔවුන්ගේ සමස්ත ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීමෙනි. ආර්ථික තත්ත්වය වැඩිදියුණු වීම, සමාජයේ වෙනත් ක්ෂේත්‍රවලට ඇතුළු වීමට කාන්තාවන්ට ඇති අයිතිය ගැන ඔවුන්ගේ ආත්ම විශ්වාසය වැඩි කිරීමට හේතු වේ.

***ආශ්‍රිත ග්‍රන්ථ***


ADB (2000) *Finance for the Poor: Microfinance Development Strategy*. Asian Development Bank.

Armendariz Beatriz and Morduch Jonathan (2005) *The Economics of Microfinance.* India: Prentice - Hall Private Limited'

Brakuton, G. D and Khavul, S (2011) Microlending in Emerging Economies. *Journal of International Business Studies (34)'*

CGAP (2010& *zWhat is Microfinance'* http//www.org/p/site/c/template.re/1.11.947^Accessed .28.07.2023&.

Economic and Social Council (2008) *Key Principles of Microfinance*. Economic and Social Council, United Nations

# 13. ධන සම්පත් පිළිබඳ බෞද්ධ ආකල්පය.

එස්.එම්.යූ.බී. සමරකෝන්
පුහුණු හා පර්යේෂණ නිලධාරි
Bcom (Special)

ධනය යනු උපයෝගිතාවයෙන් යුක්ත භාණ්ඩ හා සේවා සමූහයකි. ධනය යන්නට සමානාර්ථ ලෙස වත්ථු, භෝග, ධඤ්ඤ යන වදන් යෙදේ. ධනය යනු පුද්ගලයාගේ ශ්‍රමයට අනුව ලැබෙන ප්‍රතිඵලයක්ද වේ. බෞද්ධ ග්‍රන්ථවල ධනය යන්නෙන් ධන ධාන්‍ය, මිල මුදල්, ගෘහ වස්තූන්, භූමිය හා වනාන්තර ඇතුළු පරිසර සම්පත් පමණක් නොව මානසික අභිලාෂයන් හා මානසික තෘප්තියද අදහස් කොට ඇත. සන්තකය හා ධනය අතර වෙනසක් ඇත. සන්තකය යනු ධන සම්පත් භාවිතා කිරීමට ඇති අයිතියයි. එක් පුද්ගලයෙකුට හෝ කීපදෙනෙකුට අයිති ධනය පෞද්ගලික සන්තකය වන අතර පොදුවේ සමාජය සතු ධනය පොදු සන්තකය වේ. ඇතැම්විට මිනිසෙකු තවත් මිනිසෙකුගේ ධනයක් වන අවස්ථා ඇත. නිදසුනක් හැටියට සලකතොත්, වහලා තවත් මිනිසෙකුගේ සන්තකයෙකි.

ශ්‍රමවාදයට අනුව පුද්ගලයා ගේ ශ්‍රමයේ ප්‍රතිඵලය හැටියට ලැබෙන ධනය ඔහු සතු විය යුතුය. ශාස්ත්‍රීය වශයෙන් මෙම අදහස ඉදිරිපත් කළ දාර්ශණිකයෙකි ජෝන් ලොක්. සමූහවාදීන් පවසන්නේ ප්‍රතිඵලය සමාජය සතු බවයි. ධනයෙහි නෛසර්ගික ඇගයුමක් (Intrinsic value) නැත. එය අර්ථවත් වන්නේ මනුෂ්‍ය පුද්ගලයා සම්බන්ධයෙනි. ධනය යහපත් ජීවිතයක් ගෙනයාමට ඇති මාර්ගයක් මිස එය අපේ නිෂ්ඨාවක් නොවේ. උපයෝගිතාව සහිත සියලු දේ ධනය ආර්ථික විද්‍යාවට අනුව හඳුන්වනු ලැබුවද බෞද්ධ ආර්ථික දර්ශණයට අනුව උපයෝගිතාවයෙන් යුක්ත සියල්ල ධනය ලෙස නොසැලකේ. මිනිසා විසින් කෝටි ගනනින් ධනය වියදම් කොට සැකසූ විනාශකාරී, පොදු මිනිස් සැපත විනාශ කරන්නා වූ දේවල් ධනය ලෙස නොසැලකෙන අතර ස්වභාවික සම්පත් වන ජලය, වායුව, සරුපස, වනාන්තර ආදිය පොදුවේ මානව වංශය සතු ධන වස්තූන්ය.

මිනිසාගේ ආජීව ප්‍රවර්තන චක්‍රයේදී බොහෝ උපකාරී වන සත්ව වර්ගයාද අගනා සම්පතකි. "**මිග පක්ඛිසු** "යනුවෙන් සතුන් පවා ආරක්ෂාව සැලසීම රාජ්‍යක යුතුකම බව බෞද්ධ සූත්‍රවල පෙන්වා දී ඇත. කොතෙක් උපයෝග හා පරිභෝග වස්තු පුද්ගලයා සතුව තිබුණද චිත්ත තෘප්තිය නැතිනම් ඔහු නිර්ධනයෙකි (සන්තුට්ඨී පරමං ධනං). සාමාන්‍ය ලෝකයා වස්තු සම්පත් රාශීගත කරගැනීම ධනය හැටියට සැලකුවද බුදුදහමට අනුව වස්තු පරිත්‍යාගයද උතුම් ධනයක් හැටියට සැලකේ.

ලෞකික ගෘහ ජීවිතයක් ගත කරන පුද්ගලයෙකුට ධනය අවශ්‍ය වේ. එසේ නැතිව දිළිඳු වුවහොත් එය මහත් දුකකි. පෞද්ගලික සන්තකය ආජීව ප්‍රවර්තනය සඳහා යොදාගැනීම වෙනුවට අද බොහෝ දෙනෙක් පෙළඹී ඇත්තේ ධනය ධනය උදෙසාම රැස් කිරීමටය. ඒ තුළින් මිනිසා තම ජීවිතයේ සබෑ අර්ථය පිටු දැකීමට උත්සහ දරන බව පෙනේ. ඒ අනුව ලෞකික ජීවිතයේදී පුද්ගලයෙකු විසින් ලද යුතු සැප හතරක් අණන සූත්‍රයේ සඳහන් කර ඇත.

1. **අත්ථි සුඛ :-**වස්තුව, ධනය හිමිවීමෙන් ලබන තෘප්තිය. මෙහිදි ධනයෙහි යුක්ති සහගත බව අවධාරණය කර ඇත.

2 **භෝග සුඛ:-** වස්තුව දැහැමිව පරිභෝග කිරිමෙන් ලබන තෘප්තිය. තමා හා තමා වටා ඇති කුඩා ආර්ථික ලෝකය තෘප්තිමත් කිරිම.

2. **අණන සුඛ**:-කිසිවෙකුට ණය නැතිවීමෙන් ලබන සැපය. මෙහිදි ණය යන්නෙන් ඉටුවිය යුතුකම අදහස්වේ.

4. **අණවජ්ජ සුඛ**:- හැම කටයුත්තකදීම වැරදි ක්‍රියාවලින් වෙන් වීමෙන් ලබන සොම්නස

යනුවෙනි.

ධනය, ධනය සඳහාම අධර්මයෙන් රැස්කිරීමෙන් හා අධර්මයෙන් පරිභෝජනය කිරීමෙන් ලබන අත්ථි සුඛයක් නැත. බුදු දහමට අනුව එය අත්ථි දුඃඛයකි. එසේ වුවද දැහැමි පුද්ගලයා අතට පත්වන ධනය සමාජ යහපත පිණිසම හේතු වේ. ධර්මයෙන් ධනය රැස්කොට ධාර්මිකව එය පරිභෝජනය කරන විට ලැබු ධනයෙන් තෘප්තිමත් වේ නම් එවිට අත්ථි සුඛය ඇති වේ. නූතන කාමගවේෂී සමාජයේ ( Pleasure seeking society) ධනය හා වාණිජත්වය ජීවිත පරමාර්ථයම කරගත් ඇතැම් මිනිසුන් ජීවිතයේ අර්ථය නොදත් අන්ධයින් හැටියට සැලකිය හැකිය. මේ අනුව ධනය නිරවද්‍ය ජීවිතයක් ගත කිරීමට මාර්ගයක් පමණි. බෞද්ධ ආර්ථික දර්ශණයේ මිනිසා හා ධනය අතරින් මූලිකත්වය හිමිවන්නේ මිනිසාටයි. පුද්ගලයෙක් රටක් පමණක් නොව සමස්ත ලෝකය ම රඳා පවතින්නේ ධනය මතයි. ලෝක පරිමාණයෙන් සලකා බැලුවහොත් නූතන මිනිසා කාමගවේශී තෘප්තීන් උදෙසා ලෝකයේ ධනය වනසන අතර ලෝකය මිනිස් වාසයට නුසුදුසු තැනක් කිරීමේ අරගලයක යෙදි සිටී.

ධනය භාවිත කිරීමේ අරමුණ හා නිෂ්ඨාව නිරවද්‍ය විය යුතුය. වැරදි සහගත නිෂ්ඨාවන් සඳහා ධනය භාවිත කිරීම පුද්ගල හා සමාජ සුඛසාධනයට බාධාවකි. වැරදි නිෂ්ඨාවක් අරමුණු කොටගෙන යෙදවෙන ධනයෙන් මුළු මහත් ලෝකයේම විනාශය පවා සිදු විය හැකිය. වත්මන් ලෝකය ධනය අනුචිත ලෙස භාවිත කරන පරිසරයක් බවට පත් ව ඇත. වත්මන් මිනිසා තමාම පෝෂණය වන පරිසරයේ සමතුලිතතාවයට හානි පමුණුවමින් සීග්‍රලෙස ධන සම්පත් හානි කිරීමෙහි යෙදි සිටි. අයථා ධන භාවිතය නිසා මිනිසා අන්ධයෙකු සේ තමාම මිහිමතින් තුරන්වීමේ ව්‍යායාමයක යෙදි සිටින බව පෙනේ.

**ධනයේ ආශ්වාදනීය බව**

ගිහි ජීවිතය එක්තරා සැපයකි. ගිහි ජීවිතයේදී පංචකාම සැප සෙවීම බුදුදහමින් ප්‍රතික්ෂේප නොවේ. ලෞකික ජීවිතයෙන් ආස්වාදනීය සැපයක් මිනිසාට ලැබිය හැකිය. ආස්වාදය ආස්වාදය නිසාම ප්‍රතික්ෂේප කළ යුත්තක් නොවේ. එහෙත් ලෝකයෙහි ඇත්තේ කාමයන්ගේ ආස්වාදනය පමණක්ම නොවේ. යමෙක් එයට පරමසත්තාව හෝ පරමසැපත යැයි කියන්නේ නම් බුදු දහම ඊට එකග නොවේ.

කෙනෙකුට කාම ආශ්වාදයන් සැපයක් විය හැකි වුවද තවත් කෙනෙකුට කාම ආශ්වාදයන්ගෙන් වෙන් වී සිටීම සැපයක් විය හැකිය.

**යං පරේ සුඛතෝ ආහු -තදරියෝ ආහු දුක්ඛතො**

**යං පරේ දුක්ඛතෝ ආහු -තදරියෝ සුඛතො විදූ**

යමෙක් සැපයැයි කියන දේ දුක හැටියටත්, යමෙක් දුකයැයි කියන දේ සැප හැටියටත් බුදු දහමේ ඉගැන්වේ. ආස්වාදනය පිළිබඳ ගැටුමක් සුත්තනිපාත ධනීය සූත්‍රයේ ද විවරණය වේ. නෙක්ඛම්ම සුඛ, ධ්‍යාන සුඛ, අරහත්ත සුඛ යන සැපයන්ට සාපේක්ෂව කාම ආස්වාදනය ඉතා ම පහත්ය.

**ලෝක බැංකුව ශ්‍රී ලංකාවට අදාළ තම නවතම වාර්තාව ඉදිරිපත් කළේ 2023 අප්‍රේල් මාසයේදීය. දරිද්‍රතාවය සහ සමානතාවය පිළිබඳ සටහන ලෙස නම් කර තිබෙන එහි 2019 සිට ලංකාවේ ආර්ථිකයෙහි සිදුවී තිබෙන වෙනස්කම් සහ දුප්පත්කම සේම ආදායම් විෂමතාමය පිළිබඳව සාකච්ඡා කරයි.**

2019 දී සියයට 11.3 ක්ව තිබූ ලංකාවේ දිළිඳුකම 2023 වන විට සියයට 25 දක්වා වැඩි වී තිබෙන බව ඒ වාර්තාවේ සඳහන් වෙයි. එහි සඳහන් ආකාරයට 2019 දී එය සියයට 11.3 කි. 2020 දී 12.7 කි. 2021 දී 13.1 කි. 2023 දී එය සියයට 25 ක් වනු ඇතැයි පුරෝකතනය කරයි. ඒ අනුව 2023 දී ලංකාවේ දුප්පතුන් සංඛ්‍යාව දෙගුණ වෙයි.

දුප්පත්කම වැඩිවීම නිසා ජනතාව පරිභෝජනය අඩුකරයි. පරිභෝජනය අඩුකිරීම නිසා මන්දපෝෂණය ඉහළ යයි.

2021 දී සියයට 7.4 ක් වූ ලංකාවේ මන්දපෝෂණය 2022දී 9.4කට වැඩි වූ බව ලෝක බැංකුව හෙළිකරයි. එපමණක් නොව ඒ සමගම ලංකාවේ ආදායම් අසමානතාවයත් ඉහළ ගොස් ඇත.

ලංකාවේ සමස්ත ආදායම් අසමානතාව 2019 දී සියයට 37.7 කි. 2022 වනවිට එය සියයට 39.8 ක් දක්වා ඉහළ ගොස් තිබේ. ආදායම් විෂමතාව එසේ ඉහළ නොයාම සාමාන්‍ය ස්වභාවයයි. එහෙත් ලංකාවේ තිබෙන්නේ අස්වාභාවික දේවල්ය. දුප්පත්කම ඉහළ යාම මගින් ආදායම් අසමානතාව 2023 දී තවත් ඉහළ යයි.

**ජේ.එස්.මිල්** නැමති දාර්ශණිකයාද පෙන්වා දෙන්නේ ආස්වාදනයේ ගුණාත්මක වෙනස්කම් ඇතිබවයි. **ජේරමි බෙන්තම්** නම් දාර්ශණිකයාට විරුද්ධව ඔහු ඉදිරිපත් කළ තාර්කික අදහසක් මෙහි අවසාන වශයෙන් ඉදිරිපත් කරමි.

**.."තෘප්තියට පත් ඌරෙකුට වඩා බඩගින්නේ සිටින සොක්‍රටීස් අගනේය..."**

**පරිශීලන ග්‍රන්ථ:**

**1.බෞද්ධ ආර්ථික දර්ශණය- බෙලිගල්ලේ ධම්මජෝති හිමි**

**1.ලංකාදීප පුවත්පත- මතවාද**

# 14. ගැටුම් නිරාකරණය.

එච්.බී.අයි.ඒ. චන්ද්‍රසිරි
සංවර්ධන නිළධාරි
Bsc. (Science)

ගැටුමක් යනු ප්‍රචණ්ඩ හැප්පීමක් ,අරගලයක්, හරඹයක් හෝ මානසික වශයෙන් සිදුවන අරගලයකි.

## ගැටුම් ඇතිවන පාර්ශව

- තමා තුළම (පුද්ගලයා තුළ)
- තමන් හා මිතුරන් අතර
- පවුලක් තුළ
- අසල්වැසියන් අතර
- සංස්කෘති අතර
- රාජ්‍ය තුළ
- රාජ්‍ය අතර

## ගැටුම් ඇතිවීමට බලපාන හේතු

- ආත්මාර්ථකාමී බව
- ආක්‍රමණශීලි බව
- අධිසංවේදී බව
- විකල්ප නොසොයා තීරණ ගැනීම
- නොගැලපෙන අදහස්
- සමාජ විෂමතා
- සම්පත් විසංතුලනය
- විවිධ මතවාද
- බලය ලබාගැනීමේ ආශාව
- නුගත්කම
- සමාජානුයෝගී බව

## විවිධ ගැටුම් වර්ග

ලෝකයේ දක්නට ලැබෙන ගැටුම් එහි ස්වභාවය අනුව ආකාර කිහිපයකට වර්ග කළ හැක.

- දේශපාලනය මත ඇතිවන ගැටුම
- ආර්ථික මූල මත ඇතිවන ගැටුම්
- සමාජ මූල මත ඇතිවන ගැටුම්

## ගැටුම් නිරාකරණය කිරීමේදි ඇතිවන බාධක

- ❖ සදොස් තීරණ, අදහස් වෙනස් නොකිරීමේ දැඩි ස්ථාවර බව.
- ❖ අනම්‍යව, තමන් නිවැරදි යයි සිතන එකම විසඳුමක රැදී සිටීම.
- ❖ විකල්ප ජනනය නොකිරීම.
- ❖ ගැටුමට සම්බන්ධ සියලුම පාර්ශව ගැටුම් නිරාකරණය සඳහා ඉදිරිපත් නොවීම.
- ❖ අනෙක් පාර්ශව පරදවා තමා ජය ගැනීමට සිතීම.
- ❖ අනෙක් පාර්ශවයේ අදහස් අවශ්‍යතා නොසලකා හරිමින් එක් පාර්ශවයක් පමණක් ජයග්‍රහණය කිරීමට යාම නිසා ගැටුම්කාරී තත්ව වර්ධනය වීම.

## ගැටුම් නිරාකරණය සඳහා අවශ්‍ය ගුණාංග

- ❖ ඉවසීම
- ❖ සක්‍රිය සවන්දීම
- ❖ කාරුණික බව
- ❖ සුහදශීලි බව
- ❖ තීරණ ගැනීමේ හැකියාව
- ❖ අදහස් පැහැදිලිව ප්‍රකාශකිරීම
- ❖ චිත්තවේග සමනය
- ❖ අන්‍ය අදහස්වලට ගරු කිරීම
- ❖ පරිත්‍යාගශීලි බව
- ❖ මධ්‍යස්ථ බව
- ❖ සෑම පුද්ගලයකුටම ගරුකිරීම
- ❖ සාධාරණ විනිශ්චය
- ❖ අයිතිවාසිකම්වලට ගරු කිරීම
- ❖ තම යුතුකම් ඉටු කිරීම

## ගැටුම් නිරාකරණය සඳහා යෝග්‍ය ක්‍රමවේද

### ❖ සාකච්ඡා කිරීම

ගැටුම් නිරාකරණය සඳහා යොදා ගත හැකි සරලම ක්‍රමයයි. ගැටුමට මුල් වූ පාර්ශව සාකච්ඡා කිරීම මගින් ගැටුම් විසඳා ගැනීම සිදුවේ. මෙමගින් දෙපාර්ශවයටම විසඳුම් ලබාගත හැක.

### ❖ මැදිහත්කරණය

ගැටුමක් විසඳා ගැනීම සඳහා සාකච්ඡා ක්‍රමයට අපොහොසත් වූ විට එය විසඳා ගැනීම සඳහා උපකාර කිරීම මැදිහත්කරණයයි. මෙය සාමකාමී ක්‍රියාමාර්ගයක් වේ. මේ සඳහා ගැටුම් නිරාකරණ විශේෂඥයින්, පාර්ශව දෙකටම පිළිගත හැකි පුද්ගලයින් හෝ බාහිර පාර්ශව යොදා ගත හැක.

උදා-පවුල් ආරවුල්

ශිෂ්‍ය කණ්ඩායම් අතර ගැටුම්

ජන කණ්ඩායම් අතර ගැටුම්

රටවල් අතර ගැටුම්

❖ **සමථකරණය**

සමථකරුවන්ගෙන් සමන්විත මණ්ඩලයක් මගින් සමථකරණය සිදුවේ. එහිදී ප්‍රතිවිරුද්ධ පාර්ශව දෙකට සාකච්ඡා කර විසඳුමක් ලබාගැනීමට යොමු කරවීම සමථකරණයේ ප්‍රධාන ලක්ෂණයයි. ශ්‍රී ලංකාවේ සමථකරණය සඳහා අධිකරණ අමාත්‍යාංශය මගින් සමථ මණ්ඩල පිහිටුවා ඇත. මෙමගින් විසඳාගත හැකි ගැටුම් වර්ග වන්නේ,

පවුල් ආරවුල් / සුළු වැරදි විසඳීම / පුද්ගල කණ්ඩායම් ආරවුල්

❖ **විනිසීම**

මෙය අධිකරණමය ක්‍රියාවලියකි. මෙහිදී ගැටුමට මුල්වී ඇති පාර්ශවවලට සමථයකට එන ලෙස මුලින්ම ප්‍රකාශ කරන අතර එකඟ නොවන විට නඩු විභාගයට යාම මගින් ගැටුම් නිරාකරණය කරනු ලැබේ. අධිකරණය මගින් දෙන තීන්දුව අවසාන තීරණය වන අතර තීරණයට එකඟ නොවේ නම් පාර්ශවවලට ඉහළ අධිකරණයට අභියාචනා කිරීමේ හැකියාව පවතී.

❖ **උපදේශනය**

විවිධාකාරයෙන් පහසුකම් සපයා උපදෙස් හා මග පෙන්වීම ලබා දෙමින් ගැටුම් නිරාකරණයට යොමුවීම උපදේශනයයි. මෙහිදී විකල්ප විසඳුම් කරා පාර්ශවකරුවන් යොමු කිරීම සිදු කෙරේ. ගැටුම් නිසා ඇතිවන ප්‍රතිවිපාක හා සාමකාමීව ආරවුල් විසඳා ගැනීම නිසා අත්වන ප්‍රතිලාභ පිළිබඳව දෙපාර්ශවයම දැනුවත් කිරීම, ගැටුම් ලිහිල් කිරීම සඳහා පාර්ශවකරුවන් යොමු කිරීම මෙමගින් සිදුවේ.

**ගැටුම් සුභවාදීව නිරාකරණය කිරීමේ වාසි**

❖ **සාමය ස්ථාපිත වීම**

ගැටුමක් ඇතිවන සෑම විටම සිදුවන්නේ සාමය බිඳ වැටීමයි. පුද්ගලයා තුළ ගැටුමක් ඇති වූ විට අභ්‍යන්තර සාමය බිඳවැටේ. එලෙසම පුද්ගලයින් අතරේ, පවුලක් තුළ, සමාජයේ විවිධ කොටස් අතර ගැටුම් ඇතිවන සෑම විටම සාමය බිඳවැටේ. ගැටුම් සුභවාදීව නිරාකරණය කරගන්නා විට සාමය ස්ථාපිතවීම සිදුවේ. එබැවින් සාමය ස්ථාපිත කරගැනීමට, තිරසාර සාමයක් ඇතිකරගැනීමට ගැටුම් සුභවාදීව නිරාකරණය කර ගැනීම අතවශ්‍ය වේ.

❖ **පුද්ගල හා සමාජ සංවර්ධනයට හේතුවීම**

ගැටුම් පවතින සෑම විටම එය පුද්ගල හා සමාජ සංවර්ධනය පිරිහීමට හේතුවක් වේ. එම නිසා ගැටුම් ශුභවාදීව විසඳා ගැනීමෙන් පෞද්ගලිකව තමාගේ සංවර්ධනය ඇතිවන අතරම එය සෘජුවම සමාජ සංවර්ධනයට හේතු වේ.

- **දේශපාලන ස්ථාවරභාවය**

  ගැටුම්කාරී තත්වයකදී පොදුවේ රටක් වශයෙන් ගත් විට රටක දේශපාලන ස්ථාවරභාවය බිඳවැටීම සිදු වියහැක. විවිධාකාර ප්‍රචණ්ඩ ක්‍රියා හා ගැටුම් නිසා දේශපාලනික වශයෙන් සිදුවන එවැනි අස්ථාවරතා රටකට ඉතා අහිතකර ලෙස බලපානු ඇත. මේ නිසා ගැටුම් ශුභවාදීව විසඳා ගැනීම දේශපාලන ස්ථාවර භාවය ඇති කර ගැනීමට ප්‍රබල ලෙස බලපායි.

- **සම්පත් නාස්තිය අවම වීම**

  භෞතික සම්පත් මෙන්ම මානව සම්පත් ද, කාලයද විශාල වශයෙන් නාස්තිවීම සිදුවේ. එම නිසා ගැටුම් ශුභවාදීව විසඳා ගැනීම සම්පත් නාස්තිය අවම කරගැනීමට හෝ සම්පත් නාස්තිය වළක්වා ගැනීමට අතිශයින්ම වැදගත් වේ.

- විශ්වාසය ගොඩ නැගීම
- මානසික ආතතිය අවම වීම
- පුද්ගල ආත්ම ගෞරවය සුරක්ෂිත වීම
- සුහදතාව ගොඩනැගීම
- සමාජ සම්හන්ධතා වර්ධනය වීම
- සංස්කෘතික සහයෝගීතාව වර්ධනය වීම
- මූලික අයිතිවාසිකම් ආරක්ෂා වීම
- මානව අයිතිවාසිකම් ආරක්ෂාවීම
- ජීවිත හා දේපළ හානි වැලැක්වීම
- අන්තර්ජාතික සම්බන්ධතා පුළුල්වීම
- ආයෝජකයන්ගේ පැමිණීම වර්ධනය වීම

**ගැටුම් ශුභවාදීව නිරාකරණය කර නොගැනීම නිසා ඇතිවන ප්‍රතිවිපාක**

- මානසික ආතතිය ඇතිවීම
- අපකීර්තියට පත්වීම
- එකිනෙකා කෙරෙහි සැකයෙන් හා අවිශ්වාසයෙන්පෙළීම
- සමාජ සම්බන්ධතා පලුදුවීම
- අනවශ්‍ය කරදර හා වියදම් අධික වීම
- සම්පත් විනාශවීම
- තිරසාර සාමය බිඳවැටීම

# 15. දිළිඳු කාන්තා සවිබල ගැන්වීම සඳහා සමෘද්ධි ව්‍යාපාරයේ දායකත්වය.

එච්.එම්.ප්‍රියානි දයාරත්න
සංවර්ධන නිලධාරි

B.A (Genaral)

දිළිඳුකම පිළිබඳව විවිධ සංවිධාන මෙන්ම ආයතනික වශයෙන් විවිධ අර්ථ කථනයන් ඉදිරිපත් කොට තිබේ. දිළිඳුකම යනුවෙන් අදහස් කරනුයේ පුද්ගලයන්ට තම අවශ්‍යතා සපුරා ගැනීමට පවතින නොහැකියාවයි. ආර්ථික සාධක පදනම් කරගෙන දිළිඳුකම මනිනු ලබන අතර පුද්ගලයන්ගේ දෛනික ජීවන රටාවන් අනුව එය සිදුකරනු ලබයි. දෙවනි ලෝකයේ රටවල් අතර කාර්මීකරණය සමඟ තරඟකාරි රටාවක් නිර්මාණය විය. මෙම නිසා රටවල් ධනවත් මෙන්ම දුප්පත් රටවල් ලෙසින් බෙදීගිය අතර කාර්මික ධනවත් රටවල් ලෙස යුරෝපිය රටවල් පත්විය. ඒ අනුව දරිද්‍රතාවයෙන් යුත් රටවල් ලෙස දකුණු ආසියානු රටවල් හඳුනාගත් අතර ඒවා තුන්වන ලෝකයේ රටවල් ලෙස හඳුනාගනු ලැබිය. ඒ අනුව ශ්‍රී ලංකාව මෙම ගැටළුව කෙරෙහි මුහුණ පා සිටින රටක් ලෙසින් හඳුනාගනු ලැබිය.

1993 වනවිට ශ්‍රී ලංකාවේ ජනගහනය දශලක්ෂ 17.6ක් වූ අතර වාර්ෂික ජනගහන වර්ධන වේගය 12%ක් විය. එහිදි ග්‍රාමීය අංශය තුළ වැඩි අගයක් දැකගත හැකිවිය. එහිදි දිළිඳු අයගෙන් 80%ක්ම ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වීම ශ්‍රී ලංකා ආර්ථිකයේ කැපිපෙනෙන ලක්ෂණයක් බවට පත්විය. එයට හේතුව කෘෂිකාර්මික ආර්ථික රටාවකට ප්‍රජාවන් අනුගත වී තිබිමයි. ඒ අනුව සාක්ෂරතාව, ආයු අපේක්ෂාව, ළදරු මරණ අනුපාතිකයන් ආදි දර්ශකයන්ට අනුව තුන්වන ලෝකයේ රටවල් අතරින් ශ්‍රී ලංකාව දියුණු තත්ත්වයක පැවතිමයි. නමුත් විරැකියාව හා දුප්පත්කම හේතුකොටගෙන පැන නැගි ඇති ආර්ථිකමය ගැටළු රාශියකට මුහුණදීමට සිදුව තිබේ.

ශ්‍රී ලංකාවේ දිළිඳුකම පිලිබඳ අවධානය යොමු කිරිමේදී ඒ සඳහා බලපා ඇති සාධක කිපයක් හඳුනාගැනිමට හැකිය. එහිදි ස්වාභාවික සම්පත්වල පිහිටිම, විවිධ අංශවල පවතින පසුගාමී ලක්ෂණත්, පවුල්වල ප්‍රමාණයත්, ආර්ථික රටාවන්ගේ ස්වරූපයත් බලපානු ලැබිය. මේ අනුව ආර්ථිකය පුරුෂ මූලික සමාජ පසුබිමෙන් බැහැරව කාන්තාවන්ගේ ශ්‍රම දායකත්වයද ආර්ථිකය කෙරෙහි යොමු විය. එහිදී කාන්තාවන් ද සමාජයේ ආර්ථිකමය භාණ්ඩ නිපදවන්නෙකු ලෙස හඳුනාගනු ලැබිය. කාන්තා දායකත්වය සමාජීය වශයෙන් පවුල තුළ විශාල කාර්යය භාර්යය කොටසක් මෙහිදී ඉටු කරනු ලැබිය. මේ සමග කාන්තාව කෙරෙගි සමාජීය අවධානය යොමු වූ අතර කාන්තාවන් සවිබලගැන්විම සඳහා විවිධ ප්‍රතිපත්ති රාමුන් ගොඩනගා ගනු ලැබිය. ආර්ථිකමය වශයෙන් කාන්තා අභිවෘද්ධිය උදෙසා සමෘද්ධි ව්‍යාපාරයන්ගේ අවධානය යොමු වූ අතර කාන්තාවන්ගේ දැනුම, ආකල්ප, කුසලතා හඳුනාගනිමින් වෘත්තිමය වශයෙන් ඔවුන් සමාජයේ වැඩදායි ක්‍රියාකරුවෙකු බවට පත්විමට පියවරගනු ලැබිය.

ප්‍රජාවන් සවිබල ගැන්විමේදී පුද්ගල අවශ්‍යතා මොනවාද යන්න හඳුනාගැනිමට මෙම ක්‍රියාවන් බෙහෙවින්ම වැදගත් වන නිසාවෙනි. ඒ අනුව වර්තමානයේ සමෘද්ධි වැඩසටහන් කාන්තා සංවර්ධන අභිවෘද්ධිය සඳහා ගෙන ඇති

පියවර මොනවාද ඒ තුළින් ලැබෙන සාමාජික අභිවෘද්ධිය මොනවාද යන්න සොයා බැලීම වැදගත් වෙයි. ඒ අනුව සමෘද්ධි ප්‍රතිලාභ ඇති පවුල්වල තෝරාගත් සාමාජිකයින් අතරින් පවුල් තුළ කාන්තාවන් සමාජ සවිබල ගැන්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද යන්න හඳුනා ගැනීම මෙහි මූලික අරමුණවේ. එහිදී සමාජ වෘත්තීය විෂයෙහි දායකත්වය කාන්තාවන් සවිබල ගැන්වීමෙහිලා දක්වන දායකත්වය අවබෝධ කර ගැනීම මෙහිදී වැදගත් වෙයි. සමෘද්ධි වැඩසටහන් ව්‍යුහය පහත පරිදි හඳුනා ගත හැකිය. එහිදී ප්‍රජාවන්ට සරිලන පරිදි සමාජ අවශ්‍යතා මත මෙම ව්‍යුහයන් සමාජයේ ගොඩනැගී තිබේ.

- කුඩා කණ්ඩායම
- සමෘද්ධි සමිතිය
- සමෘද්ධි බැංකුව
- පාලක මණ්ඩලය
- මහා සංගමය

ප්‍රජාව තුළින් මතුවූ ප්‍රජා නායකත්වයන් හරහා ප්‍රජාව සවිබල ගැන්වීම කුඩා කණ්ඩායම් මගින් සිදු කරන අතර මෙම කණ්ඩායමට පස් දෙනෙක් ඇතුළත් වෙයි. මෙමගින් ශ්‍රම හුවමාරු, අත්කම් ක්‍රමය, ණය වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර මූල්‍ය විනය, ඉතිරිකිරීම් කෙරෙහි ප්‍රජාවන් යොමු කිරීමද සිදුකරනු ලබයි. සමෘද්ධි සමිතිය ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් කුඩා කණ්ඩායම් එකතු කරගෙන ඒ අතරින් බල ප්‍රදේශය තුළින් කණ්ඩායම් නායකයෙකු තෝරා ගනු ලබයි. දිවයින පුරා ක්‍රියාත්මක වන සමෘද්ධි බැංකු ශාඛා 1024 කින් ක්‍රියාත්මක වෙයි. මෙමගින් ණය යෝජනා රැසක් ක්‍රියාත්මක කරනු ලබන අතර කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා ණය ලබා දීම් මෙන්ම වෘත්තීය මට්ටමේ ස්වයං රැකියා සඳහා උපදේශන සේවාවන්ද ලබා දෙයි. බල ප්‍රදේශයේ ප්‍රතිලාභ කොටස් එකතු කර සමෘද්ධි බැංකු පිහිටුවන අතර වසම් 15 ක එකතුවක් කලාපයක් ලෙසින් හඳුන්වනු ලබයි. ප්‍රජා මූලික සංවිධාන 4ක එකතුවෙන් සමෘද්ධි බැංකුව ගොඩනැගී තිබේ.

- පවුල
- කුඩා කණ්ඩායම්
- ගම්මාන සමිතිය
- පාලක මණ්ඩලය

පසුකාලීනව මෙය මහින්ද චින්තන ප්‍රතිපත්තිය යටතේ 2014 වසරේදී දිවි නැගුම ජාතික වැඩසටහන තුළින් වෙනස් විය. දිළිඳුකම අවම කිරීම හා සමාජ සුභසාධනය මෙහිදී ඉලක්ක කර ඇත. එමෙන්ම සමාජ ආරක්ෂණය යටතේ සිටින ප්‍රතිලාභීන්ට උපත්, මරණ, ලෙඩ රෝග ආදියේ දී ප්‍රතිලාභ ලබා දීම සිදු කරයි. එමෙන්ම සමාජ සුබසාධන යටතේ සමාජ සංවර්ධනය ගොඩනැගීම අපේක්ෂා කරන අතර මේ යටතේ ළමා සුභසාධනයද, ආබාධිත අයගේ සුභ සාධන කටයුතුද සිදුකරනු ලබයි. එහිදී සමාජ සුභසාධනය ඉලක්ක කරගත් පහත වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

- මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්.
- වෘත්තීය පුහුණු වැඩසටහන්.
- ළමා සුභසාධන වැඩසටහන්.
- ආබාධිත සුභසාධන වැඩසටහන්.
- සායනික වැඩසටහන්.

- ග්‍රාම සංවර්ධන ප්‍රවේශය.

මේ යටතේ ගම සහ සංවර්ධනය ඉලක්ක කරගත් උපාය මාර්ග සිදු කර ඇත. අඩු ආදායම්ලාභීන්ගේ ආදායම් උත්පාදන හැකියාව වර්ධනය කිරීම සඳහා සමෘද්ධිලාභීන් සම්බන්ධ කරගෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ රැකියා අවස්ථා බිහි කිරීම, අලෙවි සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආදිය සිදු කර ඇත.

මෙම ප්‍රවේශය යටතේ දුප්පතුන්ගේ ණය අවශ්‍යතා සැපයීම මගින් ඔවුන්ගේ අවිධිමත් ණය වෙළෙඳපොළට හසු වීම වළක්වන අතර ඉතිරි කිරීම ප්‍රවර්ධනය කරනු ලබයි. ආයෝජන ශක්තිය වර්ධනය කරමින් ඔවුන්ගේ හදිසි ණය අවශ්‍යතා සපුරාලනු ලබයි. බැංකු පුරුදු ඇති කිරීම මගින් ණය විනයක් ඇති කිරීම මේ යටතේ සිදුකරනු ලබයි. මෙහිදී සාමාජිකයින් කුඩා කණ්ඩායම් වශයෙන් ක්ෂුද්‍ර ණය ලබාගන්නා අතර සමෘද්ධි ප්‍රතිලාභීන් කෙරෙහි සහන සේවාවන් සපයනු ලබයි. එනම් මේ මගින් අධ්‍යාපන ණය ලබා දීම මෙන්ම, ස්වයං රැකියා වූ බිම්මල් වගාව, රූපලාවණ්‍ය කටයුතු, ආහාර පිසීම හා කුඩා වෙළඳසැල් කෙරෙහි ආධාර ලබාදී ඇත. මෙහිදී මෙම ණය වැඩසටහන් අසාර්ථක වීමටද විවිධ ගැටලු බලපා ඇත. එයට හේතුව ස්වයංරැකියා සඳහා ලබා දුන් ණය වෙනත් අවශ්‍යතා සඳහා යෙදවීමයි.

සවිබල ගැන්වීමක් යනු මිනිස්සුන්ට තමාගේ ජීවිතය පාලනය කර ගැනීමට උදවුවන බහුවිධ මානයන්ගෙන් යුතු ක්‍රියාවලියකි. මිනිසුන් තුළ පවතින ශක්තිය අභිවර්ධනය කර මිනිසුන්ට තමාගේ ජීවිතය වෙනුවෙන් තම ප්‍රජාව ගේ හා තම සමාජය වෙනුවෙන් භාවිත කිරීමට වැදගත් යැයි අර්ථ දක්වන කාර්යයන්වල නිරත වීමට මෙම ක්‍රියාවලිය උදව් වේ. සවිබලගැන්වීම සමාජ ක්‍රියාකාරකමකි. එහිදී කාන්තා සවිබලගැන්වීම යනු කාන්තාවන්ට වෙනස් ලෙස සැලකීමට විරුද්ධව ඔවුන් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව මුදුන් පමුණුවා ගැනීම හරහා සිදුකරන ක්‍රියාවලියක් ලෙස Mayoux අර්ථ දක්වා ඇත. ඒ අනුව ආර්ථික, සමාජීය, දේශපාලනික, සංස්කෘතික මෙන්ම ආකල්පමය වශයෙන් කාන්තාව සවිබල ගැන්වීම සිදු කළ හැකිය. මානසික වශයෙන් සිදුවන බලපෑම ද එහිදී වැදගත් කොට සැලකිය හැකිය.

"කාන්තාවෝ අහසින් අඩක් උසුලාගෙන සිටිති" යන්න ලෝකයට කාන්තාව විසින් ලබාදෙන දායකත්වය පිළිබඳ පරමාදර්ශය මැනවින් කැටි කොට දක්වන චීන කියමනකි. එහෙත් බොහෝ සංවර්ධිත මෙන්ම සංවර්ධනය වෙමින් පවත්නා රටවලට පොදු යථාර්ථය වන්නේ ජීවිතයේ බොහෝ වපසරින් තුළ අධ්‍යාපනය, සෞඛ්‍යය, ශ්‍රම වෙළෙඳපොළ අවස්ථා, වැටුප් ලබන හා නොලැබෙන රැකියා අවස්ථා වැනි ස්ත්‍රී පුරුෂ සමාජභාවීය හිඩැස් පැවතීමයි. එහෙයින් කාන්තාවගේ ආර්ථික සවිබලගැන්වීම වනාහි බොහෝ ක්ෂේත්‍රයන් හරහා ගමන් කරන සංකල්පයක් වේ. එහිදී දිළිඳු කාන්තාව සවිබල ගැන්වීම සඳහා සමෘද්ධි ව්‍යාපාරය අතිශයින් විශාල දායකත්වයක් සපයා ඇති බව අතීතයේ සිට වර්තමානය දක්වා වූ ප්‍රාථමික දත්ත අධ්‍යයනයේ දී මනාව තහවුරු වේ. ජාත්‍යන්තර කාන්තා දිනයට ඒනම් සෑම වසරකම මාර්තු 08 දිනට සමගාමීව ලංකාව පුරා සෑම සමෘද්ධි වසමකම කාන්තාව මූලික කරගෙන වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරනු ලබයි. එයට හේතු කාරක වන්නේ ලෝකයේ අනාගත පරපුරක් බිහි කරමින් මාතෘත්වය නම් උතුම් පදවියෙන් පිදුම් ලබන සහ සමෘද්ධි වැඩසටහන සංවර්ධන කාර්යයේ දී උරෙනුර ගැටී කටයුතු කරන තැනැත්තියක් ලෙස කාන්තාවගේ දායකත්වය වඩා සුවිශේෂ වන නිසාවෙනි. පවුලත් පිටස්තර ලෝකයත් එකිනෙකට බැඳ තබන ශක්තිමත් යදම් වැල කාන්තාවන්ය. දුප්පතුන් අවම වූ සමෘද්ධිමත් දේශයක් කරා යාමේදී අප පළමුව කාන්තා ශක්තිය කෙරෙහි විශ්වාසය තැබීම සමෘද්ධි ව්‍යාපාරය තුළ නිරතුරු දක්නට ලැබුණි. දිරිය කාන්තාවන් දිරිගැන්වීම, ඇගයීමට ලක් කිරීම හා දැනුවත් කිරීමේ වැඩසටහන් ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක විය. එහිදී

- ආකල්ප සංවර්ධන වැඩසටහන්
- ගර්භණී මාතා වැඩසටහන්
- මවුපිය වන්දනා වැඩසටහන්
- ගෘහ කළමනාකරණය හා පවුල් සංවර්ධන වැඩසටහන්
- සමෘද්ධි වැඩසටහන් තුලින් ඉදිරියට පැමිණි දිරිය කාන්තාවන් ඇගයීම හා උපහාර වැඩසටහන්
- ලේ දන්දීමේ වැඩසටහන්
- කාන්තා ශක්තියෙන් එළිදැක්වීමේ වැඩසටහන්

ග්‍රාමීය මට්ටමෙන් සංවිධානය කර ඇති බව වාර්ෂික වාර්තා නිරීක්ෂණයෙන් පැහැදිලි වේ. සමෘද්ධි චක්‍රලේඛණ අංක 2021/02 යටතේ කාන්තාව සවිබල ගැන්වීම සඳහා වැඩසටහන් රාශියක් ඉදිරිපත් කර ඇත. එහිදී ව්‍යවසාය සංවර්ධන වැඩසටහන 2021 යටතේ

- සමෘද්ධි සුව බොජුන්හල් හා අලෙවි අළෙවි මධ්‍යස්ථානය ඉදි කිරීම හා වැඩි දියුණු කිරීම
- දුම්රිය ස්ථාන ආශ්‍රිතව සමෘද්ධි නිෂ්පාදන අලෙවි සැල් ඉදිකිරීම
- සමෘද්ධිය ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන හා සේවා අන්තර්ජාල වෙළඳ පොළට ප්‍රවේශ කරවීම (Online Markating)
- සමෘද්ධි අභිමානී 2021 අළෙවි පොළවල් පැවැත්වීම
- මුහුණු පොතේ ව්‍යාපාරික ජාලය ( samurdhi Business Directory on Facebook)
- සමෘද්ධි ව්‍යාපාරික සංගම් ප්‍රතිව්‍යුහගත කිරීම
- ව්‍යාපාරික කාන්තාවන් සඳහා වස විස රහිත ආහාර සැකසීම පිළිබඳ පුහුණුව
- රූපලාවන්‍ය හා ගෘහ ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය
- විශේෂ අලෙවි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

යන වැඩසටහන් ඉදිරිපත් කර ඇත. ව්‍යාපාරික කාන්තාවන් සඳහා වස විස රහිත ආහාර සැකසීම පිළිබඳ පුහුණු ලබාදීම යන්නෙන් අදහස් කරන්නේ වස විස රහිත ආහාර පාන සැපයීම තුළින් සමෘද්ධි වැඩසටහන හා සම්බන්ධ කාන්තාවන් තිරසාර ලෙස සවිබල ගැන්වීම අරමුණු කරගනිමින් සමෘද්ධි බොජුන්හල වැඩසටහන හා සම්බන්ධ වී ව්‍යවසායක කාන්තාවන් සඳහා ආහාර නිෂ්පාදනය සැකසීම හා අලෙවි කිරීම පිළිබඳ විධිමත් පුහුණුවක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුහුණු අංශයේ තාක්ෂණික සහාය මත ලබා දීමයි.

රූපලාවන්‍ය හා ගෘහ ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා සමෘද්ධි වැඩසටහන හා සම්බන්ධ කාන්තාවන් සවිබල ගැන්වීම තවදුරටත් ව්‍යාප්ත කරමින් දැනටමත් රූපලාවණ්‍ය කර්මාන්තයේ යෙදෙන හා යෙදීමට බලාපොරොත්තු වන කාන්තාවන් සඳහා පුහුණුවක් ක්ෂේත්‍රයේ ප්‍රවීනයන් මගින් ලබාදීම සිදුවේ. මෙහිදී මුඛ්‍ය පරමාර්ථය වන්නේ දේශීය ශාකසාර ඖෂධ භාවිතයෙන් සිදුකරන රූපලාවන්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමයි.

සම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන ගෘහ කර්මාන්තවල යෙදෙන සමෘද්ධි කාන්තා ව්‍යවසායකයින් සඳහා තම නිෂ්පාදනවල ගුණාත්මකභාවය, ප්‍රමිතිය වැඩි දියුණු කිරීම සහ අගය එකතු කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සැපයීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන ලබාදීම මේ වැඩසටහන යටතේ සිදුකරයි. මෙහිදී වැදගත් කරුණ වන්නේ නැවත අය කර

නොගැනීමේ පදනමෙන් කාන්තාවන් වෙත ප්‍රතිපාදන ලබාදීමයි. මෙහිදී ඇයගේ දායකත්වය සමස්ත ව්‍යාපෘති ඇස්තමේන්තුවෙන් 40% බව සඳහන් විය.

සමෘද්ධි වැඩසටහන තුළ ඉතිරි කිරීම සම්බන්ධයෙන් ඇති කළ පුරුද්ද සමෘද්ධි වැඩසටහනේ දී ජනසවිය වැඩසටහනට වෙනස් වෙමින් සමෘද්ධි සංවර්ධනය වෙනුවෙන් බැංකු ක්‍රමයක් ස්ථාපිත කරනු ලැබීය. මෙමගින් පිටස්තර මූල්‍ය ආයතන සමඟ සම්බන්ධතා පැවැත්වීමේදී ප්‍රජාව මුහුන දෙන ගැටලු අවම කිරීම අපේක්ෂා කළ අතර කාන්තාවන් සඳහා විශේෂ ඉතුරුම් ගිණුම් ඇති කරන ලදී. එහිදී දිරිය මාතා ඉතුරුම් ගිණුමට හිමිවන්නේ විශේෂ ස්ථානයකි. තමාට හිමි සමෘද්ධි වටිනාකමෙන් අනිවාර්ය ඉතුරුමක් ලෙස මෙම දිරිය මාතා ගිණුම පවත්වාගෙන යනු ලබන අතර යම් රෝගාබාධයකට මුදල් ලබාගැනීමේ පහසුකම පවතී. තවද කුඩා කණ්ඩායම් ලෙස පස් දෙනකුගෙන් සැදුම් ලත් කණ්ඩායම තුළ ද කණ්ඩායම් ඉතුරුම් ගිණුම් ඇති කිරීම තුළ කාන්තාව ඉතුරුම් සඳහා යොමු කිරීමේ පුරුද්ද වර්ධනය වී ඇති බව මනාව පැහැදිලි වේ.

ණය පිළිබඳ සංස්කෘතියක් ඇති කිරීමට පෙර පහළ ආදායම් ලබන පුද්ගලයන් හා කණ්ඩායම් බැංකුව හෝ වෙනත් මූල්‍ය ආයතන සමඟ සම්බන්ධතා පැවැත් වූයේ අවම ස්වරූපයෙනි. බැංකු ණය සඳහා ඇපකරුවන් සොයා ගැනීමට නොහැකි වීම, සුළු පරිමාණ ණය පිළිබඳව ප්‍රධාන වාණිජ බැංකු උනන්දු නොවීම, ණය ලබාගැනීමේ ක්‍රමවේදය ඉතා සංකීර්ණ වීම, ණය පිළිබඳ ග්‍රාමීය සමාජයේ පවතින බිය යන කරුණු හේතුවෙන් දිළිඳු ප්‍රජාව බැංකුවලින් බහිෂ්කරණය විය. නමුත් සමෘද්ධි වැඩසටහන මගින් සුලු පරිමාණ ණය ලබාදීමේ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී. ඉතාම අඩු පොලී අනුපාත යටතේ මාසික ගෙවීමේ ණය පදනම මත ස්වයං රැකියා, නිවාස ණය ලබා දෙන ලදී. එහිදී ග්‍රාමීය කාන්තාව වැඩි වශයෙන් තම නිෂ්පාදනයන් සඳහා ණය ගැනීමට යොමුවිය. එය සැබැවින්ම කාන්තාව විශ්වාස කරමින් ඇය සවිබලගැන්වීම සඳහා සමෘද්ධි ව්‍යාපාරයේ දායකත්වය සුවිශේෂ හැරවුම් ලක්ෂයක් ලෙස මෙය සනිටුහන් කළ හැකිය.

කුඩා කණ්ඩායම් පිහිටුවමින් කාන්තාවන්ට සාමූහිකත්වය සහ නිලතල ලබා දෙමින් මුළුගැන්වී සිටි කාන්තාව සමාජය ඉදිරියේ ශක්තිය විදහා දක්වමින් නැගී සිටීමට ශක්තියක් වීම සමෘද්ධි ව්‍යාපාරය තුළින් සිදුවිය. මෙහිදී සමෘද්ධි බලකාය, කුඩා කණ්ඩායම් ක්‍රමය පදනම් කරගෙන ග්‍රාමීය වශයෙන් ප්‍රජා සහභාගිත්වය සහිතව ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධන කටයුතු විධිමත් කිරීමට උත්සාහ දැරිය. සමෘද්ධි කුඩා කණ්ඩායම් ක්‍රමය මගින් ප්‍රජා මට්ටමේ සමාජ ප්‍රාග්ධනය වර්ධනය නිර්මාණය වීම වෙසෙසින් වැදගත් කරුණකි.

**කාන්තාව සවිබල ගැන්වීම සම්බන්ධ ගැටලු.**

ලංකාව තුළ දියුණු කාන්තාව බල ගැන්වීමේ දී ගැටලු හා අභියෝග කිහිපයක් පොදුවේ හඳුනාගත හැකිය.

- කාන්තා ව්‍යවසායකත්වය සම්බන්ධයෙන් පවතින ආකල්පමය වෙනස්කම්.
- සිය පවුල් සංස්ථාවන් සම්බන්ධ පවතින වගකීම.
- සංස්කෘතිමය බාධාවන්.
- අඩු අධ්‍යාපන මට්ටම හා ව්‍යාපාර සම්බන්ධයෙන් වන අඩු අත්දැකීම්.
- තාක්ෂණ සාක්ෂරතාවය අඩු වීම.
- ව්‍යාපාරික තොරතුරු සම්බන්ධයෙන් වන අඩු දැනුම හා තොරතුරු ද මඳ බව.
- මඟ පෙන්වීම් මඳ බව.

- ජාලයන්ට ප්‍රවිෂ්ට වීමේ මද බව.
- බොහෝ කර්මාන්තවල නිෂ්පාදන ප්‍රාථමික තත්ත්වයේ පවතින බව.
- විශේෂයෙන් තාක්ෂණය යොදා ගැනීම ප්‍රමාණවත් නොවීම.
- එම නිසා එම නිෂ්පාදනවල ගුණාත්මකභාවය, නිෂ්පාදනය ඉහළ නැංවීම, එම නිෂ්පාදනය සඳහා ජාත්‍යන්තර වෙළඳපොලක් සොයා ගැනීම ආදියේ ගැටලු.
- කාන්තා ව්‍යවසායකයින්ට ගොඩ නැගීමට ආධාර කිරීම සඳහා ව්‍යාපාරික ආධාර පද්ධතියක් නොමැති වීම.

ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීමේදී සමෘද්ධි වැඩසටහනට ප්‍රධාන තැනක් හිමි වෙයි. එයට හේතුව වර්තමානයේ කාන්තා සුභසිද්ධිය සඳහා වැඩි අවධානයක් යොමු කර ඇති අතර ප්‍රතිපත්තිමය ක්‍රියාවලියක් ඒ තුළ අන්තර්ගත වීමයි. එය සුභසාධන සේවාවෙන් එහා ගිය ඉහළ සේවාවක් ලෙස හඳුනා ගැනීමට හැකිය.